# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ වප් පුර පසළොස්වක පෝදා 2022 ඔක්තෝබර් 09 ඉරිදා BUDUSARANA SUNDAY OCTOBER 09, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 17 පත්‍රය, පිටු 36 ආරම්භය 1965 - 06 - 13 මිල රු. 50.00



# අනන්ත බුදුගුණ මෙනෙහි කරමින් සිදුකරන්නා වූ අසිරිමත් බුද්ධ වන්දනාවකට සහභාගී වී බුදුහිමි පිදූ පින සසර වසන තුරාවටම මෙනෙහි කරන්න...

අපේ අම්මලා තාත්තලා දඹදිව වන්දනාවේ යෙදෙන්නේ සමහරවිට ජීවිත කාලයටම එකවරයි. ඉතින් අම්මේ, තාත්තේ ඔබලාට ඒ වන්දනා කරන එකපාර හෝ ඉතාමත් සාර්ථකව විවේකීව හදවතටම දැනෙන්න පිංකරගන්න පුළුවන් නම් කොතරම් හොඳද? ඉතාමත් අවිවේකීව, පීඩාකාරී ධාවනයක යෙදෙන කෙටි දින කාල සටහන් අප සංවිධානය තුළ නොමැති නිසා ඔබ ගෙවන මුදලට ඉතාමත් සාර්ථක වන්දනාවක් එක් කරන්න අප අවංකවම බැඳී සිටිනවා.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාව සිදුකළා වූ ඒ බරණැස ඉසිපතනාරාමයේ දී සම්බුද්ධත්වයට පත්වුණා වූ බුද්ධගයා පිං බිමේ දී, සංඝගත දක්ෂිණාවක්, මුතුකුඩ 28ක් සමග වැඩම කර කරවන්නා වූ අටවිසි බුදුන්වහන්සේලා සඳහා පූජාවන් (හේවිසි හොරණෑ, දවුල් ශබ්ද පූජාව සමග සතර සිද්ධස්ථානවලදීම) කිරි ආහාර පූජාවන්, කප්රුක් පූජාවන්, විලක්කු පන්දම් පූජාවන්, ශීල සමාදානයන් සිදුකරනවා. ඒ අතරින් බුද්ධගයා පිං බිමේ මල් පූජාව හා ආලෝක පූජාවන් ද, **ජේතවනාරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩසිටි සුගන්ධ කුටියේ රෝසමල් ලක්ෂයක් (100,000) (සෑම චාරිකාවකදීම) අතුරා, පහන් 10,000 ක් දල්වා කරන්නා වූ පූජාවන් ඒ අතරින් සුවිශේෂයි.**

බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කළා වූ, ඒ පිත් දේශනා, සූත්‍ර, ගාථා සෑම සිද්ධාන්තයකම අනන්ත බුදුගුණ මෙනෙහි කරමින් දේශනා කරනවා. දඹදිව ධර්ම සාකච්ඡා එයින් සුවිශේෂයි.

අප ආයතනය විසින් සකස් කරන ලද දඹදිව චාරිකා අත්පොත, වන්දනා පොත්, සිතියම්, විශාල ප්‍රමාණයන් ඔබ වෙත නොමිලේ තිලිණ කරනවා. ඉන්දියාවේ භාෂාව, සිරිත් විරිත්, ගම්-නගර, පූජනීය වන්දනීය ස්ථාන, මාර්ග ගැන ඉතාමත් පැහැදිලි අවබෝධයක් අප කාර්යයමණ්ඩලයට ඇති නිසා කිසිම අපහසුතාවයක් නෑ. සියලුම දුරගමන් සේවා වායුසමනය කළ බස් රථයකින් සිදුකරන අතර බසයෙන් යන ගමනේදී කාන්සිය මගහරවා ගැනීමට බෞද්ධ චිත්‍රපට නැරඹීමට රූපවාහිනී සහ බෞද්ධ සුවිශේෂී සංගීතයට සවන්දීමට හැකිවන පරිදි සුඛෝපභෝගී පහසුකම් සලසා ඇත. දුෂ්කර පළාත්වල වුව ද හොඳ පහසුකම් සහ වෛද්‍ය පහසුකම් පැය 24 පුරාවටම ලැබෙන්න සලස්වනවා. **අපට කිසිම පූජනීය සිද්ධස්ථානයක් මගහැරෙන්නේ නෑ, මග හරින්නෙත් නෑ. මගහැරෙයි කියා පැමිණිලිත් නෑ. පාන්දර 2 සිට රාත්‍රී 11 දක්වා යන කෙටි දින කාල සටහන්, රැය පහන් වන තුරු බසයේ ගමන් ඉතාමත් වෙහෙසකාරී ධාවනයක යෙදෙන කාල සටහන් අප සංවිධානය තුළ නොමැති නිසා කිසිම අපහසුවක් නෑ.**

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ජාතික මාර්ගෝපදේශන කථිකාචාර්ය දේශමාන්‍ය සංජය කන්දෙගෙදර මහතා සහ 7 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලය සෑම වන්දනාවකටම සහභාගී වන නිසා පරිපූර්ණ විශ්වාසයෙන් යුතුව මෙම චාරිකාවට සහභාගී වෙන්න පුළුවන්.

**බුදුන් උපන් දේශයේ අසිරිමත් වන්දනාවට... "පදවිහාරිත" මහා කුසලකර්මය වඩාත් සාර්ථකව ළඟා කරගෙන සදාකාලික අමතක නොවන්නා වූ උතුම් වූ අසිරිමත් පිංකම්වලට සහභාගී වී සම්බුදු හිමි පිදූ පින සසර වසනා තුරාවටම මෙනෙහි කරගන්න.**



වසර 27 ක් තුළ අප මෙතෙක් ආ වන්දනා ගමනේ දහස් දසදහස් පිංවතුන් පිරිසක් දඹදිව වන්දනාමාන කර ඇති අතර ඒ සියලුමදෙනා කිසිදු ලෙඩක්, දුකක්, කරදරයක්, අතරමංවීමක්, නොමැතිව ඒ උතුම් වන්දනාව ඉතාමත් සාර්ථකව වන්දනාකර ලංකාවට පැමිණ ඇති බව ඉතා සතුටින් දන්වා සිටින්නෙමු.

## වන්දනා කරන ප්‍රධාන සිද්ධස්ථාන සහ ස්ථාන

- සාංචිය
- බුද්ධගයාව
- ලුම්බිණිය
- කොසඹෑ නුවර
- ධර්මාශෝක රජ මාළිගාව
- සච්චබද්ධ පර්වතය
- තිරුපති,
- නාලන්දාව
- කුසිනාරාව
- සැවැත්නුවර
- බරණැස
- අජන්තා
- දුෂ්කර ක්‍රියාකළ ස්ථානය
- කේසාරියා
- එල්ලෝරා
- අග්‍රා (ටජ්මහල්, රතු බලකොටුව).
- සංකස්ස
- දිල්ලිය (සතිපට්ඨාන සූත්‍රය දේශනා කළ ස්ථානය ඇතුළු ප්‍රධාන ස්ථාන 200 ක් පමණ තවත් විශාල සංඛ්‍යාවකි.)

### දින - 22 චාරිකාව
**රු. 180,000/-**
(මදුරාසියට ගුවනින්)
ඉහත සඳහන් සියලුම සිද්ධස්ථාන

### දින 17 චාරිකාව
**රු. 235,000/-**
ඉහත සඳහන් සියළුම සිද්ධස්ථාන
දිල්ලියෙන් කොළඹට

### දින - 15 චාරිකාව
**රු. 250,000/-**
ඉහත සඳහන් සියලුම සිද්ධස්ථාන හා ස්ථාන

### අපගේ පිටත්වීම්
මෙම වසරේ නොවැම්බර්
ලබන වසරේ සෑම මසකට මුල් සතියේ
පෙබරවාරි / මාර්තු / ජූනි / ජූලි / අගෝස්තු

**ඉහත සඳහන් මුදල් වලට අමතරව ඉන්දියාවේදී කිසිම මුදලක් අය කරන්නේ නැත**

ඉහත සඳහන් අපගේ සෑම චාරිකාවකටම (බුදුන් වහන්සේ සම්බන්ධව) සියලුම සිද්ධස්ථාන වායුසමනය කළ අළුත්ම බසයෙනි.

### මෙම චාරිකාවේදී නොමිලේ....

- ☑ ගුවන් ගමන් බලපත්‍රය (අවු: 60 ට වැඩි)
- ☑ ගමන් බෑගය (30Kg ගෙන යාහැකි)
- ☑ වන්දනා ගමන් ඇතුළත් DVD තැටි
- ☑ පින්තූර ඇල්බමයක්
- ☑ ඉන්දියාවේදී සිද්ධස්ථාන ඇතුළුවීමේ ප්‍රවේශපත්‍ර
- ☑ පළමු දින අප කාර්යාලයේ සිට ගුවන්තොටුපළට ප්‍රවාහනය නොමිලේ
- ☑ වටිනා කුඩයක්
- ☑ ඉන්දියානු හා නේපාල වීසා
- ☑ අත්බෑගය (15Kg ගෙන යාහැකි)
- ☑ හිස් වැසුම්

### අපගේ ආහාර :

සියලුම චාරිකා සඳහා ශ්‍රී ලංකාවේම අමුද්‍රව්‍ය රැගෙන යන නිසා ශ්‍රී ලාංකීය ප්‍රණීත ආහාර රසවිඳීමට පුළුවන. වෙනත් රටවල තත්ත්වයේ පහල අපිරිසිදු කෝකිවරු රැගෙන ගොස් ආහාර පිසින්නේ නැත. ශ්‍රී ලාංකීය පිරිසිදු කෝකිවරුන් පමණක් සහභාගි වේ. පිටිකිරි, විටමින් වර්ග, චීස්, වලට අමතරව අපටම ආවේනික අපගේ සිංහල කෑම වර්ග ලංකාවෙන්ම රැගෙන යති. කැමති පරිදි ඔබට අවශ්‍ය ආහාර වර්ගද සාදාගත හැක. දින තුනකට වරක් ප්‍රණීත සුප් එකක්....

- ◈ දිවයිනේ කුමන ප්‍රදේශයක වුව ද නියෝජිතයින් ඔබ නිවසටම ගෙන්වා ගත හැකිය. ඒ සඳහා ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ වන්න.
- ◈ පැය 24 පුරාවටම සේවය
- ◈ 07 දෙනෙකුගෙන් යුත් අප කාර්යය මණ්ඩලය (කාන්තා දෙදෙනෙක්) සෑම චාරිකාවකටම සහභාගී වන්නේ ඔබේ දෙමාපියන් අපගේ දෙමාපියන් මෙන් වගකීමෙන් රැකබලා ගැනීමටත් ආරක්ෂාව සැපයීමටත් ය.

## Royal Life Tour
## සංජය භාරත වන්දනා



ජනාධිපති සම්මානලාභී, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ජාතික මාර්ගෝපදේශන කථිකාචාර්ය, බෞද්ධයන් සුරැකීමේ සංවිධානයේ සභාපති, දේශබන්ධු, දේශ අභිමානී ලංකා පුත්‍ර, දේශ අභිමානී, ලංකාතිලක, දේශමාන්‍ය
**සංජය කන්දෙගෙදර**
නො: 113, ජා-ඇල පාර, අඹන්විට, ගම්පහ.
නො. 241, රෝයල් පැරඩයිස්, කහන්තොට පාර, මාලඹේ. (නිවස)
ටෙලි 033-2230043, 071-8564495, 077-6210660
011-2407218
අධ්‍යක්ෂක:
ටී.එම්. තෙන්නකෝන්
රජයේ ලියාපදිංචි අංකය : wk 7227

**ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ උදෙසා සිදු කරන්නා වූ සුවිශේෂී පුද පූජාවන් අපගේ සෑම වන්දනා ගමනකදීම සිදුකරනු ඇත.**



**ප්‍රධාන කාර්යාලය අප නිවසේම තිබෙන නිසා ඕනෑම දවසක ඕනෑම වේලාවක අප හා සම්බන්ධ විය හැක.**

# සැනසීම ලැබ ගන්න කරුණාව පතුරන්න

**සම්බුද්ධ කරුණාව තුළ හිතවත්, අහිතවත් යැයි භේදයක් නොමැත. තම පුතණුවන් වූ රාහුලටත්, අංගුලිමාලයන්ටත් එක සමාන ය. එසේ ම කසළ සෝදනය ජීවිකා වෘත්තිය කරගත් සුනීත නම් සැඩොල් තරුණයා ද සියලු මිනිසුන්ගේ, දෙවි බඹුන්ගේ වැඳීමට පාත්‍ර වන්නේ බුද්ධ කරුණාව නිසා ය.**

සුළු පියාගේ අකාරුණිකත්වයට ලක්වුණු සෝපාක පුංචි සත් හැවිරිදි දරුවා අමු සොහොනේ තනි වූ අවස්ථාවේ බුදු කරුණාවට ලක්ව සත් හැවිරිදි වියේ දී ම රහත් භාවයට පත් විය.

උදේනි රජුගේ හදවතිකා ඇතින්න මහලු වියට පත්වීමෙන් පසු රජු විසින් නොසලකා හරින ලදී. උදේනි රජුට කළ ගුණ සැලකීමේ අගය පහදා දී ඇතින්නට පෙර පරිදි පෙර ආහාරපානාදිය දී සත්කාර කරන්නට අනුශාසනා කරන ලදී.

බණ ඇසුමට පැමිණි දුප්පත් තැනැත්තාට ආහාර ලබා දීම, පේෂකාර දියණියට පිහිට වීම, රජ්ජුමාලා මෙහෙකාර දියණියට පිහිටවීම, රෝගීව සිටි තිස්ස තෙරණුවන්ට පිහිටවීම, උදාරාබාධයකින් පෙළුණ භික්ෂුවට පිහිටවීම, පටාචාරා, කිසාගෝතමීහට පිහිටවීම, බුද්ධ කරුණාවේ මහිමය යි.

විශේෂයෙන් ම බුද්ධ කරුණාව මහා කරුණාවක් බවට පත්වීමේ දී විශේෂ හේතු කාරණා රාශියක් පෙන්වා දිය හැකි ය.

මහා කරුණාව සඳහා කරන ලද කුසල් උසස් වේ. එය ලබා ගැනීමට කළ කුසල් කරුණාව සඳහා ම වූ කුසල්වලට වඩා බලවත් ය.

ස්වරූපය අතින් උසස් වන මහා කරුණාව දුක හා සැප යන දෙකෙහිම එක සේ දැක්වෙන අතර, දුකේ දී පමණක් ක්‍රියාවට නැංවේ. උසස් අරමුණින් පවතින අචේතනික හා සචේතනික ධර්ම සමූහය උදෙසාම ක්‍රියාවට නැංවෙන අතර කරුණාව ඒකීය භාවය සඳහා යොමුවේ. මහා කරුණාවේ පැතිරීම ප්‍රමාණයෙන් හා කාලය වැනි සීමාවන්ගෙන් ඔබ්බට යන අතර, සීමිත කාල සීමාවක් තුළ ක්‍රියාවට නැංවේ. මේ තුළින් මහා කරුණාවේ සුවිශේෂීත්වය මනාව පිළිබිඹු වේ.

කරුණාව නමැති සංකල්පය තුළ බුදුරජාණන් වහන්සේ විවිධ ප්‍රායෝගික උපක්‍රම භාවිත කර ඇත. පටාචාරාවන්ට කරුණාව පෑමේ දී විසිරුණු ඇගේ මනස සකස් කරනු ලැබුවේ නොමළ ගෙයකින් අබ මිටක් රැගෙන එන ලෙස උපදෙස් ලබා දීමෙනි. සෑම ගෙදරක ම බාල, තරුණ, මහලු කවුරුන් හෝ මිය ගොස් ඇති බව ඇය අවබෝධ කර ගත්තා ය. බුදුරදුන්ගේ උපායශීලී බව කරුණාව හා ගැබ්වුණු අවස්ථා ලෙස මෙය දැක්විය හැකි ය.

බුදුරජාණන් වහන්සේ අංගුලිමාලට "දරුව සියලු සතුන් කෙරෙහි දඬු බහා තබා සිටියේ වෙමි. ප්‍රාණ වධයෙන් වැළකුණු ඔබ තවම නොනැවතුනෙහි ය" යනුවෙන් වදාළහ.

අංගුලිමාල යනු දිසාපාමොක් ඇදුරුතුමන් ළඟ සිටි බුද්ධිමත් ශිෂ්‍යයෙකි. සසර කෙළවර නැවැතීමට අවශ්‍ය පින් පිරුණු තැනැත්තෙකි. බුදුරදුන්ගේ ප්‍රකාශය අවබෝධ කිරීම තුළ අංගුලිමාල නම් තරුණයා නිවී සැනසුණේ ය.

තම ඥාති පුත්‍රයා වූ නන්ද කුමරුගේ මනස සුවපත් කළේ සෘද්ධියෙන් නන්ද තෙරුන් දිව්‍යලෝකයට රැගෙන යාමෙනි. නව දැලි හේනක දැවී ගිය වැඳිරියක් පෙන්වීම, ජීවිතයේ අස්ථිර බව පිළිකුල් බව, අවධාරණය කරන මානසික සිතිවිලි ගොඩනැඟීම, දෙව්ලොව සුරූපී දෙවඟනන් පෙන්වීම, දිව්‍ය සැප පිළිබඳ මනා අවබෝධයක් ගොඩනැංවීම තුලනාත්මක අවබෝධය නන්ද කුමරුගේ මානසිකත්වය තුළ ගොඩනැංවීම නන්ද කුමරුට රාගාදී කෙලෙස් නැසීමට මඟ පාදා දෙන ලදී.

සිව් මසක් යන තෙක් එක් ගාථාවක් පාඩම් කර ගැනීමට අපොහොසත් වූ චුල්ල පන්ථක හිමියන්ට විහාරස්ථානයෙන් ඉවත් වීමට සිදුවන අවස්ථාවේ දී උන්වහන්සේගේ බුද්ධි මට්ටමට ගැළපෙන ලෙස පිරිසුදු සුදු රෙදි කඩක් ලබා දී, සුදු රෙදි කඩ පිරිමදින ලෙස උපදෙස් දෙන ලදී. ක්‍රමයෙන් රෙදිකඩ අපිරිසුදු විය. ඒ අනුව සිත මෙහෙය වූ චුල්ල පන්ථක හිමියෝ කෙලෙස් නසා රහත් විය.

මහා කරුණා සංකල්පය තුළ බුදුරදුන්ගේ ප්‍රායෝගික භාවිතයන් මේ ඔස්සේ මනාව පිළිබිඹු කළ හැකි ය.

ඔබේ සෑම සිතිවිල්ලක් ම, වචනයක් ම, ක්‍රියාවක් ම කරුණාව පෙරදැරි කරගෙන සිදුකරන්න. ඔබ ඔබට ද කරුණාවන්ත ව සලකන්න. කරුණාව යන කාරණාව සමාජගත කිරීම ඔබ ඔබේ වගකීමක් කොට සලකන්න. දයාබරිත සමාජයක් ගොඩනඟමු. සිතිවිලි මත අන් අය අවබෝධ කර ගමු. අන් අයගේ වැරැදි නොදකිමු. අඩුපාඩු ඇත්නම් පවසා හදා ගැනීමට කටයුතු සලස්වමු.

හලා / වෙන් / වෑකඩ ජාතික පාසලේ
ධර්මාචාර්ය ශාස්ත්‍රපති
**බඩල්ගම සුමේධතිස්ස හිමි**


## පාණදුර - ගොරකාන ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථ පුණ්‍ය භූමියේ ඉදිකෙරෙන

ගර්භය තුළට පිවිසිය හැකි ඓතිහාසික
ගොරකාන
"සීවලි මහා සෑයට"
ඔබත් දායක වන්න

පින්වත් ඔබගේ පුණ්‍යාධාර "සීවලි මහා සෑය අරමුදල" නමින් දක්වා ඇති බැංකු ගිණුමකට බැර කළ හැකිය. එලෙස බැංකු ගිණුමකට ඔබේ පුණ්‍යාධාරය බැර කොට ඇති බව සනාථ කිරීම පිණිස එම බැංකු ලදුපත හෝ එහි පැහැදිළි පිටපතක් සමග, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිළි අකුරින් ලියා පහත ලිපිනයට තැපැල් කරන්න. එහි විනිවිදභාවය සඳහා පුණ්‍යානුමෝදනා පතක් තැපැල් මගින් ඔබ වෙත එවනු ලැබේ. විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් හට "සීවලි මහා සෑය අරමුදල - කායභාලයය" ට පුණ්‍යාධාර ලබාදිය හැක.


තෙරුවන් සරණයි !

සියලු විමසීම් :

ගරු සභාපති,
පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද ස්ථවිර,
සීවලි මහා සෑය අරමුදල,
ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරය,
ශ්‍රී ධම්මානන්ද මාවත,
ගොරකාන,
කෙහෙල්වත්ත 12550.

විහාරස්ථානය :
038 22 97 914
සභාපති හිමි :
071 250 44 46
ස්වාමින්වහන්සේ පමණක් (බොහෝවිට) පන්සලේ වැඩවසන බැවින් බැහැරට වැඩසිටින අවස්ථාවලදී දුරකථන ඇමතුම් ලබාදීමේ දී සැලකිලිමත් වීමට කාරුණික වන්න.

සැදැහැති දායකත්වය
සීවලි මහා සෑය අරමුදල
ආරම්භය : ශ්‍රී බු.ව. 2563 / ව.ව. 2020




විහාරස්ථානයට පැමිණෙන ගමන් මාර්ගය.
පාණදුර පරණ පාර (මාර්ග අංක 100 හෝ 183) බස් මාර්ගයේ පැමිණ "ගොරකාන" බස් නැවතුමෙන් බැස, ගොරකාන - 'කීල්ස්' ආයතනය අසල ඇති ශ්‍රී ධම්මානන්ද මාවතෙන් හැරී විහාරස්ථානයට පැමිණෙන්න.
(පැමිණීමට පෙර දුරකථන මගින් ස්වාමින්වහන්සේ වැඩසිටින වෙලාවක් ලබාගන්නේ නම් ස්තුතිවන්ත වෙමු.)

### කඨින පිංකම් සමයේ මහඟු පුණ්‍යකර්මයකට ආරාධනා !

ගොරකාන - සීවලි මහා සෑයේ පාදමේ මූලික බිම් සැකසීමේ වැඩ සඳහා පමණක් වැය වන (මේ වන විට පවතින මිල ගණන් මත) රු.8,000,000/- ලක්ෂ අසූව ක මුදල වෙනුවෙන් තනි හෝ සමූහ වශයෙන් දායකත්වයක් දැරීමට කැමති සැදැහැති දනපතියන්ට, ධනපතියන්ට, ව්‍යාපාරිකයන්ට සීවලි මහා සෑය අරමුදල මෙහෙයුම් කමිටුව මෙසේ ආරාධනා කරමු...

| ගිණුමේ නම : සීවලි මහා සෑය අරමුදල | |
|---|---|
| සම්පත් බැංකුව ගිණුම<br>1151 6100 4890 | ලංකා බැංකුව ගිණුම<br>8 5 5 7 7 4 3 9 |
| මහජන බැංකුව ගිණුම<br>148-2-001-6-0038551 | සෙලාන් බැංකුව ගිණුම<br>0400-13126762-101 |

මෙම උතුම් පුණ්‍ය ක්‍රියාවට දායකවී පින්කැමැත්තෝ කුසල් රැස්කර ගනිත්වා !

# සැදැහැ වඩන සිත් පහදන කඨින පින්කම් අදින් ඇරඹෙයි



ඌරුගමුවේ අස්සජී හිමි

**කඨින චීවර පූජා කරන මාසයේ සමාරම්භක දිනය අදින් ඇරඹෙයි. එබැවින් මේ චීවර මාසය යි. සෑම වසරක ම ඇසළ මහේ සිට වප් මහ දක්වා යෙදෙන වස් කාලය බෞද්ධයා ගේ පුණ්‍ය කාලය යි. වස් පින්කම් මාලාව අවසන් වනුයේ කඨින චීවර පූජා පුණ්‍ය මහෝත්සවයෙනි.**

## දේවාවරෝහණය

කඨින චීවර පූජාව ආරම්භවීමට අමතරව වප් පුර පසළොස්වක පොහොය දිනය හා සබැඳි ඓතිහාසික සිදුවීම් කිහිපයකි. ඉන් පළමුවැන්න නම් සත් වැනි වස් කාලය තව්තිසා දිව්‍ය ලෝකයෙහි ගත කළ බුදුරදුන් සංකස්ස නගර ද්වාරයට වැඩම කිරීම යි. එදා මහා පිරිසක් සංකස්ස නගර ද්වාරයට එක්රැස් වූ හ.

දිව්‍ය බ්‍රහ්ම සමූහයා ගේ පංචතූර්ය වාදනයන් හා සාධු නද මධ්‍යයේ අප්‍රමාණ බුද්ධශ්‍රීයෙන් සංකස්ස නගර ද්වාරයට බුදුරදුන් වැඩම කළ කල්හි ඒ අසිරිය දුටු සියල්ලෝ ම බුදුවන්නට ප්‍රාර්ථනා කළහ. මෙම පූජෝත්සවය "දේවාවරෝහණ" නම් විය. මෙය දැකීමෙනුත්, බුදුරදුන් හා සැරියුත් මාහිමියන් අතර වූ ප්‍රශ්න විසර්ජන සාකච්ඡාව ශ්‍රවණය කිරීමෙනුත් අපමණ ප්‍රසාදයට පත් මෛත්‍රෙය බෝසතාණන් වහන්සේ අප ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ සසුනෙහි පැවිදි බවට පත්වූයේ ද වප් පොහොය දිනෙක ය.

## දූත චාරිකාවක්

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ නියමයෙන් දේවානම්පියතිස්ස රජුගේ සංදේශයත්, තුටු පඬුරුත් රැගෙන ලක්දිව අරිට්ඨ කුමරු ප්‍රමුඛ රාජකීය දූත පිරිසක් දඹදිව පැළලුප්නුවර සිටි ධර්මාශෝක අධිරාජයා වෙත පිටත්කොට හැරියේත් වප් පොහොය දිනෙක ය. සඟමිත් තෙරණිය සිරිලකට වැඩම කරවා ගෙන ලක්දිව පැවිද්ද බලාපොරොත්තුවෙන් සිටි අනුලා දේවිය ප්‍රමුඛ කුල කතුන් සසුන්ගත කරවීම එම දූත චාරිකාවෙහි අභිප්‍රාය විය.

## විනය සංගායනාව

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ මහා අරිට්ඨ මහරහතන් වහන්සේ ඇතුලු මහරහතන් වහන්සේ සැට අට නමක් දහසක් භික්ෂූන් වහන්සේ ද සමඟ ථූපාරාම විහාර මධ්‍යයට රැස්ව වප් පුර පසළොස්වක පොහෝදා විනය සංගායනාව ආරම්භ කළහ. මෙම ථූපාරාම විනය සංගායනාව පැවැත්වීමට කටයුතු සූදානම් කළේ දේවානම්පියතිස්ස මහ රජු ය.

## වස් විසීම

දඹදිව සමාජ පරිසරය තුළ ඉතා ඈත අතීතයේ පටන් ම හේමන්ත, ගිම්හාන හා වස්සාන යනුවෙන් වසරකට ඍතු තුනක් පැවතිණ. වසන්ත ඍතුවක් ද මීට එක්කොට ඇතැම් තැනෙක ඍතු සතරක් ලෙස ද දැක්වෙයි. වස්සාන ඍතුවේ වැසි සාර මාසය අතුරෙන් මුල් මාස තුන තුළ උපසපන් භික්ෂූන් වහන්සේ වස් සමාදන් ව වැඩ සිටිති. වස් පින්කම් මාලාව නිමාවට පත් කෙරෙන කඨින චීවර පූජා පුණ්‍ය මහෝත්සවය වප් පුර පසළොස්වක පොහෝදා සිට ඇරඹෙයි. එය සිදු කළ හැකි අවසාන දිනය ඉල් පුර පසළොස්වක පොහොය දිනය යි.

කඨින පූජාව හා සමගාමීව පෙරහර, තොරණ, සැරසිලි, පහන් පූජා, බෝධි පූජා, පිරිත් දේශනා, ධර්ම දේශනා, සාංඝික දාන පූජා, කප් රුක් පූජා ආදී විවිධාකාර පූජා චාරිත්‍ර සිදු කෙරේ. ඒ ඒ පළාත්වලට ආවේණික වූ ලක්ෂණ අනුව එම පූජා චාරිත්‍රවල විශේෂතා දැකිය හැකි ය. මෙම චාරිත්‍රවල ඇතැම් අංග කාලානුරූපීව සකස්ව ඇති අතර ඇතැම් අංග සාම්ප්‍රදායිකව පවත්නා පෞරාණික චාරිත්‍ර ගණයට අයත් වේ.

වස් පවාරණය කළ භික්ෂූන් වහන්සේට චීවර පූජා කරන දිනයේ අලුයම කඨින චීවරය හෝ කඨින වස්ත්‍රය විහාරස්ථානයට වැඩමවීම සාම්ප්‍රදායික චාරිත්‍රය යි. මේ වන විට ඒ වෙනුවෙන් අතිඋත්කර්ෂවත් පෙරහරක් පවත්වනු දැකිය හැකි ය. මෙම පෙරහර සඳහා කැපකරු දායක පක්ෂයේ ශක්තිය අනුව අලි ඇතුන්, හේවිසි තූර්යවාදන, නැටුම් ආදී විවිධ සංස්කෘතික අංග එක්වන බැව් පෙනේ. මෙම කඨින පෙරහර වීදි සංචාරය කරනුයේ ඒ ඒ විහාරස්ථානවලට අයත් ගොදුරුගම් හා ඒ අවට ගම් ආවරණය වන පරිද්දෙනි. සැදැහැවත් විශාල පිරිසකට කඨින පින්කමෙහි ආනිසංස අනුමෝදන්වීමට ඉඩ ප්‍රස්තාව සැලසීම මෙම පෙරහරෙහි ප්‍රධාන පරමාර්ථය යි. ඇතැම් ප්‍රදේශවල කඨින වස්ත්‍රය මොහොල් ගසක ඔතා දෙදෙනකු කර තබාගෙන උඩුවියන් යටින් ගමින් ගමට ගෙන යනු දැකිය හැකි ය. මේ නිසා මඟ දෙපස රැස්වන සැදැහැතියන්ට කඨින වස්ත්‍රය සියතින් ම ස්පර්ශ කොට පින් අනුමෝදන් වීමේ භාග්‍යය හිමි වෙයි.

මෙලෙස තුන්යම් රාත්‍රිය පුරාම හෝ අලුයම් කාලයේ ගමින් ගමට වීදි සංචාරය කළ කඨින පෙරහර  අලුයම විහාරස්ථානයට ළඟා වෙයි. කොස් කොළයේ හෝ අඹ කොළයේ නැට්ට පෙනෙන තරමට යන්තම් හිරු උදාවීම කඨින පෙරහර විහාරස්ථානයට ගෙවදීම සඳහා නිශ්චිත වේලාව ලෙස පුරාතනයේ පටන් සම්මතව පැවතිණි. මෙසේ මහත් උත්සවාකාරයෙන් වැඩමකර වූ කඨින වස්ත්‍රය පිළිගන්නා භික්ෂූන් වහන්සේ දායක පක්ෂයෙහි ද සහයෝගයෙන් එහි කඩ කපා කඨින චීවරය සකස් කරති. පුරාතන යුගයේ දී විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් කඨින වස්ත්‍රය ගෙත්තම් කිරීම සිදු කෙරිණි. එහි දී බොහෝ සැදැහැවත්හු නූල් ඇම්ණීම, මැසීම ආදි කටයුතු සියතින් ම සිදු කිරීමට මහත් රුචිකත්වයක් දැක්වූ හ. කඨිනය සකස් කිරීම, පූජා කිරීම හා ඇතිරීම යන සියල්ලක්ම එකම දිනක් තුළ සිදු කළ යුතු වෙයි.

## විනය ප්‍රඥප්ති

කඨින චීවරය මසා නිම කිරීමෙන් පසුව එය සුදු පැහැති වස්ත්‍රයක් නම් සෝදා පිරිසුදු කොට පඬු පෙවීම සිදු කළ යුතු ය. මේ සඳහා සිවුරු රෙද්දක් භාවිත කළේ නම් එහි පඬු පෙවීම සංකේතවත් කිරීම සඳහා සිවුරෙහි කොණක් සේදීම පුරාතන චාරිත්‍රය යි. මෙම විශේෂ අවස්ථාවන් හිදී හේවිසි හොරණෑ වාදනය කිරීමෙන් ශබ්ද පූජා පැවැත්වීම ද පුරාතනයේ සිදු කෙරිණි.

මේ අනුව ගෙත්තම් කොට, පඬු පොවා වේළා සකස් කරගත් කඨින චීවරය කඨින පූජා මණ්ඩපයෙහි උසස් ආසනයක තැන්පත් කෙරෙයි. අනතුරුව එහි රැස් වූ භික්ෂූන් වහන්සේට කඨින චීවරය පූජා කිරීම දායකකාරකාදීන් විසින් සිදු කළ යුතු ය. එහිදී පෞද්ගලිකව නොව උභතෝ සංඝයාට කඨිනය පූජා කිරීම පිළිගත් විනය ප්‍රඥප්තිය යි.


කඨිනය පිළිගත් භික්ෂූන් වහන්සේලා කඨින චීවරය සඟසතු කොට තමන් අතුරෙන් එය ලැබීමට සුදුසු භික්ෂුවක තෝරා උපෝසථාගාරයක් තුළ දී විනයානුකූලව එය පැවරීම සිදු කරති. කඨින චීවරයක් සඟසතු කිරීමට යටත් පිරිසෙයින් උපසපන් භික්ෂූන් වහන්සේ පස් නමක් වත් වැඩසිටිය යුතු ය.

මෙසේ සංඝ සම්මුතියෙන් කඨින චීවරය ලබා ගත් භික්ෂූන් වහන්සේ එහි කප් බින්දුව තැබීම නම් වූ චාරිත්‍රය ඉටුකළ යුතු ය. මොණර ඇසක තරම් ප්‍රමාණයේ කවාකාර බින්දු තුනක් සිවුරේ එක් කොණක තැබීම කප් බින්දුව තැබීම නම් වේ. මෙය සාමාන්‍යයෙන් සටහන් කරනුයේ බුලත් කොළයක් සිවුරේ යටින් තබා ඒ මත උඩින් කවාකාර යතුරකින් තද කිරීමෙනි. මේ තුළින් අලුත් වස්ත්‍රයක් කෙරෙහි ඇතිවන ආශාව යටපත් කිරීම අදහස් කෙරෙයි.

## කඨිනානිසංස

කඨින පූජා චාරිත්‍ර සියල්ලක් ම නිමවීමෙන් පසුව කඨිනත්ථාරක භික්ෂූන් වහන්සේ විසින් කඨිනානිසංස ධර්ම දේශනාව පැවැත්වීම සාම්ප්‍රදායික චාරිත්‍රය යි. බුදුරදුන් දවස වැඩසිටි නාගිත මහ රහතන් වහන්සේගේ උතුම් චරිත කතාව ගෙනහැර දැක්වීම මෙම ධර්ම දේශනයේ කොටසක් ලෙස සිදු කෙරෙයි.

නාගිත තෙරණුවෝ එක් භවයක කඨින පූජාවක් සිදුකොට එම උතුම් කුසලය නිවන් මඟට හේතු වේවා'යි! ප්‍රාර්ථනා කළහ. එතැන් සිට සතර අපායේ නොඉපිද සදෙව් ලොව හා මිනිස් ලොව යන සත් වැදෑරුම් කාම ලෝකයන් හි දෙව් මිනිස් සැප වින්දහ. අවසාන භවයෙහි ඒහි භික්ඛු භාවයෙන් පැවිදිව අර්ථ, ධර්ම, නිරුක්ති සහ පටිභාණ යන සිව් අවබෝධය ද සහිතව සිව්පිළිසිඹියාපත් මහරහතුන් වහන්සේ නමක් බවට පත් වූහ.



# ආදරය හා විශ්වසනීයත්වය හොඳම දායාදයයි





කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ
අධ්‍යයනාංශයේ අංශාධිපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
**මකුරුප්පේ ධම්මානන්ද හිමි**

**අවිවාහක ගිහි ජීවිතය පෙරදිග රටවල වැදගත් කොට නො සලකයි. ගිහියකු නම් විවාහ විය යුතු,ය, නො එසේ නම් පැවිදිවිය යුතු ය යන්න පිළිගත් අදහසකි. බෞද්ධ සාහිත්‍යයේ තරුණ වියේ දී විවාහවීමත් සාර්ථක පවුල් ජීවිතයක් ගෙවීමත් සඳහා සැපයෙන උපදේශ රාශියක් වේ.**

තරුණයකු හෝ තරුණියක විසින් කළ යුතු වැදගත්ම කරුණ වන්නේ තමාට සුදුසු ප්‍රතිවිරුද්ධ ලිංගික සහකරුවා සොයා ගැනීමයි. සමසීල, සමසද්ධා, සමපඤ්ඤ යනාදි ගුණාංගවලින් හෙබි තැනැත්තා හෝ තැනැත්තිය තෝරා ගැනීමයි. එම ගැළපීම නැති කෙනකු තෝරා ගන්නා අයට විවාහ ජීවිතයේ අනේකවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවේ.

මහෞෂධ කුමරු අමරා දේවිය විවාහ කර ගැනීමට පෙර කරන ලද පරීක්ෂණය සිහිපත් කර ගැනීම ප්‍රයෝජනවත් ය. බුදුන් වහන්සේ වදාළේ දෙවියෙක් දෙවඟනක් සමඟ වසන්නාක් මෙන් විවාහ ජීවිතයට එළඹීමට නියමිත හෝ විවාහක ස්ත්‍රී පුරුෂ දෙදෙනා අතර සුසංයෝගය තිබිය යුතු බවයි.

රූපය හෝ ධනය පමණක් සලකා විවාහ වීම සදාචාරමය ගැටලු රාශියක් ඇතිවීමට හේතුවේ. මොනරා කෙතරම් ලස්සන කෙනකු වුවත් ඔහු පිරිස් ඉදිරියේ රංගනයේ යෙදෙනුයේ අධෝමුඛය කාහටත් පෙනෙන පරිදි පිල් විදහා ගෙනය.

විවාහප්‍රාප්ත තරුණයකුගේ කාර්යභාරය වන්නේ කුටුම්බ සංරක්ෂණයයි. මංගල සූත්‍රයෙහි විවාහ ප්‍රාප්ත පුද්ගලයකු විසින් අනුගමනය කළ යුතු වැදගත්ම කරුණු කිහිපයක් දක්වයි.

මවුපියන්ට සැලකීම (මාතාපිතූ උපට්ඨානං), අඹුදරුවන් පෝෂණය කිරීම, වැඩ කටයුතු අවුල් නො කරගැනීම (අනාකුලා ච කම්මන්තා), දන්දීම (දානං), දැහැමි ලෙස හැසිරීම (ධම්මචරියං), ඥතීන් විෂයයෙහි වන යුතුකම් ඉටු කිරීම (ඤාතකානඤ්ච සංගහො), නිවැරදි ක්‍රියා කිරීම (අනවජ්ජානි කම්මානි) , අකුශලයන්හි මනසින් නො ඇලීම හා වරදින් වෙන්වීම (ආරති විරති) , මත්ද්‍රව්‍ය භාවිත නො කිරීම (මජ්ජපානා ච සඤ්ඤමො) , නිතර සිහිකල්පනාවෙන් කටයුතු කිරීම (අප්පමාදො ච ධම්මෙසු) , ගරු කළ යුත්තන්ට ගරු කිරීම (ගාරවො) , යටහත් පහත් පැවැත්ම (නිවාතො), ස්වකීය අඹුදරුවන්ගෙන් සහ ලද දෙයින් සතුටට පත්වීම (සන්තුට්ඨී) , වෙනත් අය විසින් කුදු මහත් වශයෙන් තමාට කළ අනුග්‍රහ පිළිබඳ කෘතඥවීම (කතඤ්ඤුතා) , ඉඩ ලද අවස්ථාවන්හි ධර්මය ඇසීම (කාලෙන ධම්මසවණං), ඉවසීම (ඛන්තී) යන කරුණු ඒ අතර වේ.

මේවා පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීමේ දී තරුණ අඹු සැමි යුවළකට ගැටලු හා අභියෝග ජය ගනිමින් සාර්ථක දරු පරම්පාරාවක් බිහිකරමින් සුඛිත මුදිත ලෙස දිවි ගෙවිය හැකි ය.

කායික ශක්තිය තරුණ වියේ සිටින පුද්ගලයකුට ලැබී ඇති ලාභයයි. එම ශක්තිය මෙහෙයවා හිතුවක්කාර ලෙස ක්‍රියා කිරීමට වෑයම් කිරීම කෙනකුගේ බුද්ධිහීනත්වය ප්‍රකට කරන්නකි. ස්වකීය ශ්‍රමය බාහු බලය කැපවීම මෙහෙයවා ඔවුන් විසින් ස්වකීය වර්ගයා විෂයයෙහි දැවැන්ත මෙහෙවරක් කළ යුතු ය. කිසි ලෙසකත් ස්වකීය ශක්තිය අනුන් පෙළීම සඳහා නොවිය යුතු ය.

තම අභිලාෂයන් කෙරෙහි අවදියෙන් සෙසු අයගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා දායකත්වය සැපයිය යුතු ය. තරුණ විය යනු ජීවිතයේ ඉතා වැදගත්ම අවධිය වන්නේ ස්වභාව ධර්මය විසින් කෙනකුට ලැබිය යුතු සියල්ල ලබා දෙන අවධියයි.

විවිධ තනතුරු ආදිය මඟින් විවිධ ඇඳුම් අන්දවන, මිල මුදලින් අප සනසවන, කායික ශක්තිය අපට ලබා දෙන මෙම අවධිය අපට අපව අමතක කරවන කාලයයි. නැවත මෙම එබැවින් අප තුළ සිටින අවංක ආදරණීය හා සැබෑ මිනිසා සැමදාම ආරක්ෂා කර ගැනීමට වෑයම් කළ යුතු ය.

නිදසුනක් ලෙස පොලිස් නිලධාරියකු ලෙස සිතන්න. වෘත්තිය විසින් ඔහුට ලබා දෙනුයේ අසීමිත බලයකි. එහෙත් ඔහු විශ්‍රාම ගත් පසු එම ඇඳුම සහ බලය ආපසු බාරදිය යුතු ය. නැවත පොදු මිනිසා අතරට යා යුතු ය. ඒදිනට පොදු සමාජය ආදරය කරන්නේ ඔහු තුළ සිටි මිනිසාට ය. ඔහු තුළ සිටියේ යකෙක් නම් පොදු සමාජය අප්‍රිය කරයි. මෙය සෑම සමාජ සත්වයකුටම හිමි සරල සත්‍යයකි.

බිරිඳ සහ ස්වාමි පුරුෂයා යන භූමිකාවන් දෙක ද මෙයට යටත් ය. එබැවින් සැම විටම කවර වෘත්තියක හෝ සමාජ ස්තරයක පසු වුව ද තමාගේ යහපත්කම් සහිත මනුෂ්‍යත්වය රැක ගත යුතු ය.

පවුල් ජීවිතයේ දී අගම ධර්මය කෙරෙහි ද අවධානය යොමු කරන ලෙස අප නිතර සිහිපත් කරනුයේ එහි ප්‍රායෝගික වටිනාකමක් ඇති නිසා ය. තරුණ වියෙහි දී වගකීම් මඟහරිමින් චතුරාර්ය සත්‍යය පසක් කිරීමෙහි ලා නිරතව සිටීම රටක තරුණ ප්‍රජාවකගේ වගකීමක් නොවේ.

තරුණ වියේ දී චතුරාර්ය සත්‍යය සොයා යාමට උපදෙස් සපයන ආගමික ආයතන ඇති බව අපි දනිමු. එහෙත් රටක්, ජාතියක් වශයෙන් ගෙන සැලකූවිට ඔබට ඊට පෙර කළ යුතු, කළ හැකි බොහෝ දේ ඇත.

සුමේධ නමින් ඉපිද සිට බෝසතාණන් වහන්සේ දීපංකර බුදුරදුන් පාමුල දී අතට පත් නිවන අත්හළේ කුමක් සඳහා දැයි සිතනු මැන.

තරුණයෝ වූකලී රටක ජාතියක අනාගතය නිර්මාණය කරන්නෝ ය.

ඔවහු ආගමික නායකයෝ ය. ගුරුවරු ය. ඉංජිනේරුවරු ය. වෛද්‍යවරු ය. කලාකරුවෝ ය. ගවේෂකයෝ ය. ව්‍යාපාරිකයෝ ය. පරිසරවේදීහු ය. සැලසුම් හා ඉදිකිරිම්කරුවෝ ය. වෘත්තිකයෝ ය. මෙසේ ශ්‍රමික හා බුද්ධිමය දායකත්වය විසින් විවිධ පුද්ගලයන් ලෙස ක්‍රියාකරන උත්තුංග හා ජවසම්පන්න තරුණ විය තුළ ඒ ඒ පුද්ගලයාට සමාජයේ දියුණුවට හෝ පරිහානියට හෝ කළ හැකි බලපෑම අනල්ප ය. එබැවින් තම කාර්යය නිසි පරිදි කිරීමම ධර්ම චර්යාවක් වේ.

ඔබට ස්වාමි පුරුෂයකු හෝ බිරියක වශයෙන් පැවරෙන වගකීම් ධාර්මික චර්යාවක් ලෙස පුරුදු පුහුණු කළ හැකි ය. සිඟාලෝවාද සූත්‍රයෙන් බුදුරදුන් සිහිපත් කර දී ඇත්තේ එම චර්යාවයි. අගම ධර්මය විසින් තරුණ ඔබට මුලින්ම කියා දිය යුත්තේ එකී මාර්ගයයි.

ඔබ යක්ෂයකු හෝ යක්ෂණියක වීමට අවශ්‍ය ඉඩ කඩ ඕනෑවටත් වැඩියෙන් අද අප වෙසෙන සමාජය තුළ ඇත. කෙබඳු සළුපිළිවලින් අප වෙළී සිටිය ද ඒවා ඉවත් කළ විට අපගේ ප්‍රකෘතිය නිරාවරණය වේ. අප උපතින් මනුෂ්‍යත්වය උරුමව පැමිණි අයයි. එය අපට හිමි ස්වභාවයයි.


කුඩා දරුවකුට අනෙක් සියලු දෙනා ආදරය කරන්නේ එම නිකැළැල් මනුෂ්‍ය ධර්මයන්ට ය. එය සුරක්ෂිත කර ගනිමින් වැඩෙන දරුවාට ද සමාජය එපමණකට ම ආදරය කරයි.

අංගුලිමාල නමැති මිනීමරුවා තුළ සිටි මිනිසා එළියට ගත්තේ බුදුරදුන් විසින් තාරුණ්‍යය සමඟ වැළලී ගිය මෙම සත්‍යය පහදා දීමෙනි. එබැවින් කුටුම්බ රක්ෂණය හෙවත් පවුල් ජීවිතයක දී අඹුවට සහ දරුවන්ට නො එසේ නම් සැමියාට සහ දරුවන්ට පියකු හෝ මවක වශයෙන් පෙන්විය යුතු එකම දෙය නම් අවංක ආදරය හා විශ්වසනීයත්වයයි. එය රැක ගැනීමට අපොහොසත් තරුණ විය අතිශයින් දුර්වල වූවකි.

තරගකාරිත්වය හමුවේ මානව හිතවාදිත්වය භූමදානය කරන ඇතැම් පිරිස් අවි ආයුධ, විෂ මිශ්‍ර ආහාර අලෙවිය, භාවිතයට නුසුදුසු බේත් හේත් අලෙවිය, රාජකාරිය කිරීමට පවා අල්ලස් ගැනීම, එකිනෙකා බිඳවා තම අපේක්ෂාවන් සපුරා ගැනීම වැනි අනේකවිධ ක්‍රම මගින් අනුන්ට හිංසා කරති. ඝාතනය කරති. එයින් උපයන ධනයෙන් තමා ද ජීවත් වෙමින් තම දරුවන් ද ජීවත් කරවීමට වෑයම් කරති. එහෙත් යථාර්ථයක් වශයෙන් එය සපල නොවේ. කුමක් නිසාද යත් අපරාධයේ අනිසි පල, මාරාන්තික අනතුරු, රෝග ව්‍යසන, අබල දුලබතා මගින් භුක්ති විඳීමට සිදුවන බැවිනි. එබඳු ලෝක ධර්මයක් ලෝකයේ ඇත.

තමාට මෙන් තම පවුලේ සාමාජිකයන්ට ද දැහැමිව උපයා සපයා දීමත්, එබඳු දැහැමි ජීවනෝපාය මාර්ගයක් පෙන්වා දීමත් කුටුම්බ සංරක්ෂණයේ වගකීම වේ. එබැවින් මහිච්ඡතාව හෙවත් අසීමිත කැමැත්ත වෙනුවට අල්පේච්ඡතාව හෙවත් ලද දෙයින් සන්තෘප්ත වීමේ ජීවන ප්‍රතිපදාවට හුරුවන්න. එය බොහෝ ගැටලුවලින් මිදීමට අසීමිත ලෙස ඔබට මඟ පෙන්වනු ඇත.

# අසිරිමත් කඨින චීවර පූජාව අට මහා පින්කම් අතර උසස්ම පින්කම වීමට නම්



කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති රාජකීය පණ්ඩිත මහාචාර්ය

**උඩුහාවර ආනන්ද හිමි**

**වස්සානය හා කඨිනය විශේෂ විනයානුකූල ආගමික පිළිවෙතකි. ඒ සම්බන්ධයෙන් බුදුරදුන් වදාළ සියලුම විනයානුකූල පැනවීම් හා නිර්දේශ ඇතුළත් වන්නේ විනය මහාවග්ගපාළි වස්සූපනායික හා කඨිනක්ඛන්ධකවල ය.**

වස්සූපනායික ශික්ෂාව පැනවීමේ සිට වර්තමානය දක්වාම වස්සානය හා කඨිනය පිළිබඳ විනයානුකූල පිළිවෙත් සියල්ල සිදුවන්නේ එම විධි නියමයන්ට අනුකූලව ය. බුදුරදුන්ගේ මුල් පැනවීමට කලින් කල එකතුකරන ලද සංශෝධන මගින් තවදුරටත් එම කාර්යය සංකීර්ණ වී තිබේ.

වස්සානය ආරම්භයේ දී උපෝසථ කාර්ය මගින් ස්වකීය පාරිශුද්ධත්වය තහවුරු කරගත් උපසපන් භික්ෂු භික්ෂුණීන් වහන්සේ ඇසළ පුරපසළොස්වක අවපෑලවිය දිනයෙහි වස් සමාදන්ව තෙමසක් ඇවෑමෙන් වප් පුරපසළොස්වක දිනයෙහි පවාරණය කිරීමෙන් වස්සානය නිමා කරති.

මෙම චාරිත්‍රවල මුල් ස්වරූපය හා එහි අර්ථය යම් වෙනසකට භාජනය වී ඇතත් පැරැණි පිළිවෙත තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක වේ. කාලීන වෙනස්කම් රැසක් දක්නට ලැබුණ ද වස්සානය හා කඨිනය පැවිද්ද හා සම්බන්ධ විනයානුකූල මෙන්ම ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය කේන්ද්‍ර කර ගත් ප්‍රතිපදාවකි.

වස්සානය මෙන්ම කඨිනය හා බැඳුණු ආගමික වත් පිළිවෙත් සමග ගිහි දායක දායිකාවන්ගේ සෘජු සම්බන්ධයක් පවතී. ඒ අනුව උපසපන් භික්ෂු භික්ෂුණීන්ට වස් සමාදන්වීම සඳහා වැසි සළු පූජා කොට ආරාධනා කිරීම, වස් තෙමස තුළ සිව්පසයෙන් උපස්ථාන කිරීම, වස්සානය අවසානයේ කඨින චීවරය හා සම්බන්ධ පුණ්‍යොත්සවය සංවිධානය කිරීම ආදිය ගිහි පිරිසට අයත් ආගමික චාරිත්‍ර වේ.

කඨින චීවර පූජාව විශේෂ ආනිසංස ලැබෙන පින්කමක් වන හෙයින් ගිහි බෞද්ධයෝ ඒ හා සම්බන්ධ වීමට විශේෂ උනන්දුවක් දක්වති. දඹදෙණි පැරකුම්බා රජු විසින් "කඨිනානිසංස" නම් ග්‍රන්ථය සම්පාදනය කිරීමත් සමග ඒ හා සම්බන්ධ ගිහියන්ගේ දායකත්වය තවදුරටත් වර්ධනය වී තිබේ. මෙම ග්‍රන්ථයෙන් හඳුන්වා දෙන ලද අටමහා පින්කම් අතුරෙන් කඨින චීවර පූජාව විශේෂ වේ.

එම ග්‍රන්ථයේ කඨින චීවර පූජාවෙන් ලැබෙන විවිධ උසස් ආනිසංස මැනවින් විවරණය කර ඇති අතර, ධර්ම දේශකයෝ කඨිනානිසංස දේශනාවල දී එම කරුණු මැනවින් ඉදිරිපත් කළහ.

එම දේශනාවලට සවන් යොමු කළ පොදුජනයා අටමහා පින්කම් අතුරෙන් කඨින චීවර පූජාව කෙරෙහි වැඩි උනන්දුවක් දැක්වූහ. මේ අනුව යමින් භික්ෂු භික්ෂුණීන් වස්වසවා ගෙන අනතුරුව විසිතුරු අයුරින් වාර්ෂිකව කඨින පින්කම් සංවිධානය කළහ. බුද්ධ කාලයේ සිටම වස්සානය මුල් කරගෙන බුදුසමයේ ව්‍යාප්තිය සිදු වූ අතර, ලංකාවේ බොහෝ විහාරස්ථානවල ආරම්භය භික්ෂූන් වහන්සේ වස්වසවා ගැනීමෙන් සිදුව තිබේ.

ආගමික චාරිත්‍රයක් ලෙස කඨිනය කෙරෙහි සෙසු බෞද්ධ ආගමික චාරිත්‍රවලට වඩා විශේෂ අවධානයක් යොමුව තිබෙන්නේ එය වසරකට වරක් සිදුකෙරෙන පින්කමක් හෙයිනි. මේ අනුව සිංහල බෞද්ධ ජනයා කඨින චීවර පූජා පින්කමකට දායක වීමට කිසිසේත්ම අතපසු නොකරති.

ආගමික වශයෙන් ලැබෙන උසස් පුණ්‍යමය ප්‍රතිලාභවලට අමතරව කඨිනය ඉතා පොහොසත් සංස්කෘතික උත්සවයකි. එය අතීතයේ සිටම විවිධ සංස්කෘතික අංග ඒකරාශී කර ගනිමින් වර්ධනය වී තිබේ. කඨිනය රැගෙන යන පෙරහර විවිධ සංස්කෘතික ලක්ෂණවලින් පෝෂිත ය. සාම්ප්‍රදායික නැටුම් හා වෙනත් සංස්කෘතික අංගවලින් සැදි පෙරහර දකින්නා තුළ සැදැහැ සිත් වඩන අතර, බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔදවැඩෙයි.

අතීතයේ හිමිදිරි පාන්දර පැවති මෙම සංස්කෘතික අංගය වර්තමානයේ බොහෝ වෙනස්කම්වලට භාජනය වී ඇති අතර, එහි පැවැති චාම් හා සරල සංස්කෘතිකාංග ක්‍රමයෙන් ගිලිහී යමින් තිබේ. එය බොහෝදුරට ශෝෂාකාරී, එමෙන්ම වාණිජකරණය වූ සංස්කෘතික අංගයක් බවට පත්ව තිබෙන්නේ ඒ පිළිබඳ නිවැරැදි අර්ථය කුමක්ද යන්න ගිහි පැවිදි දෙපක්ෂයට ම නිසි වැටහීමක් නොමැති හෙයිනි.

ආගමික අර්ථයකින් පෙරහරක ගමන් කිරීම පුණ්‍යමය කාර්යයක් ලෙස සලකා තිබේ. පාලි අටුවා ග්‍රන්ථවල පද්වීතිහාර කුසලය යනුවෙන් හැඳින්වෙන්නේ එයයි. තෙරුවන් උදෙසා පුද පූජා රැගෙන පෙරහරක ගමන් කිරීමෙන් හා ත්‍රිවිධ චෛත්‍ය වටා ප්‍රදක්ෂිණා කිරීමෙන් යථෝක්ත පද්වීතිහාර කුසල රැස්කර ගත හැකි ය.

අනේපිඬු සිටුවරයා පළමුවරට බුදුන් දැකීමට යාමට පසුබට වූ මොහොතෙහි සීවක නම් යක්ෂයා නොපෙනී සිට බුදුන් දැකීමෙහිලා ඔහු උනන්දු කළේ බුදුන් දක්නට තබන එක පියවරක් වුව සියලු සම්පත්වලට වඩා උතුම් යැයි පවසමිනි. (එකස්ස පද්වීතිහාරස්ස කලං නාග්ඝති සොළසං).

ඒ අනුව උසස් සංස්කෘතික අංග සහිතව තෙරුවන් පිදීම අරමුණු කර ගත් කඨින පෙරහරක ගමන් කිරීම නිරායාසයෙන් ම පදවීතිහාර කුසලය රැස්වීමට හේතුවේ.

කඨින පින්කම සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. එබැවින් එය සමාජයේ විවිධ පුද්ගලයන් ඒකාබද්ධ කෙරෙන අන්තර්පුද්ගල සමාජ සම්බන්ධතා තහවුරු කෙරෙන, සමාජමය කර්තව්‍යයකි. සමාජයේ පවතින විවිධත්වය නොසලකා එකම අරමුණක් වෙනුවෙන් පෙළ ගැසීම මෙහි ඇති විශේෂත්වයයි.

බෞද්ධ ආගමික චාරිත්‍රවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් නම් සමාජ ඒකාබද්ධතාව හා සමාජානුයෝජනය සඳහා ඒවායේ පවතින අදාළත්වයයි. කඨින පින්කමක් තනිව කළ නොහැකි ය. එමෙන්ම ඒ සඳහා විශාල ගිහිපැවිදි පිරිසකගේ සම්බන්ධතාව අවශ්‍ය වේ. පුණ්‍ය චේතනාව පෙරදැරිව ගම වටා කඨින චීවරය රැගෙන යාමෙන් සිදුවන්නේ අන්තර්පුද්ගල ඒකාබද්ධතාව තවදුරටත් තහවුරු වීමයි.

කඨින චීවරය හා සම්බන්ධ විනයානුකූල මෙන්ම අනෙකුත් ක්‍රියාකාරකම් සාමූහිකව සිදුකෙරේ. වෙනත් බොහෝ පින්කම් තනිව කළ හැකි වුව ද කඨින චීවර පූජාවක් එසේ කළ නොහැකි ය. ඒ සඳහා භික්ෂූන් වහන්සේ පස්නමකට වැඩි ප්‍රමාණයක් හා සැලකිය යුතු ගිහි පිරිසක් අවශ්‍ය වේ.

විශේෂයෙන්ම චීවරය සකස් කිරීමෙහිලා ගිහි පින්වතුන්ගේ මැදිහත් වීම අත්‍යවශ්‍ය වේ. අතීතයේ මෙය විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුවූ අසිරිමත් කාර්යයක් බව කඨිනානිසංසයේ දැක්වේ. එබැවින් එම පුණ්‍යකර්මය නිරායාසයෙන් ම සමාජ ඒකාබද්ධතාව තහවුරු කෙරෙන සමාජ විද්‍යාත්මක පදනමකින් යුක්ත ආගමික චාරිත්‍රයකි.

කඨින පින්කමේ මනෝචිකිත්සක ලක්ෂණ රැසක් දක්නට ලැබේ. බොහෝ බෞද්ධ ආගමික චාරිත්‍රවල මනෝ චිකිත්සක ලක්ෂණ දක්නට ලැබේ. ඒවායේ නිරතවීමෙන් බැතිමතාට තාවකාලික වශයෙන් මානසික සුවයක් අත්පත් කර ගත හැකිය. පිරිසක් හා එක්ව කටයුතු කිරීමෙන් තම අකුශල චිත්තවේග සමනය කර ගැනීමටත්, කුසල සහගත චිත්තවේග වර්ධනය කර ගැනීමටත් හැකියාව ලැබේ.

ඉහතින් සඳහන් කළ කරුණු අනුව කඨින චීවර පූජා පින්කමෙහි ආගමික, සාමාජික, සංස්කෘතික හා මනෝවිද්‍යාත්මක ප්‍රතිලාභ හා ප්‍රයෝජන රැසක් දක්නට ලැබේ. ඒවා ඉස්මතුවන ආකාරයෙන් වාණිජත්වයෙන් හා තරගකාරිත්වයෙන් තොරව කඨින පින්කම සංවිධානය කරන්නේ නම්, එය අටමහා පින්කම් අතුරින් අසිරිමත් හා උසස්තම පින්කම ලෙස හැඳින්විය හැකි ය.



# හදේ නැති භක්තියක් වත පුරා තවරගෙන අඩවන්ව නෙත් බරව බලනවා



කැලණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අංශයේ අංශාධිපති
පෑලියගොඩ විද්‍යාලංකාර
පිරුවන්හි ආචාර්ය
මහාචාර්ය
**මල්වානේ**
**චන්ද්‍රරතන හිමි**

**ලොව පවතින සත්‍යය සදාකාලික ය. එය කිසිවකුගේවත් නිර්මාණයක් නොවේ. සත්‍ය කිසිවකුටවත් අලුතෙන් නිර්මාණය කළ නොහැකි ය. එකී සත්‍ය මායාව විසින් වටකරගෙන සිටියි. ඒ නිසාම අප සත්‍යය යැයි සම්ප කර ගනු ලබන්නේ මායාවයි.**



මිනිසා සත්‍යය ම වටහා ගැනීමේ අනවරත අරගලයක යෙදී සිටියි. මායාවට සත්‍යයේ වෙස්ගෙන සත්‍ය ලෙස පෙනී සිටීමට අනුබල දෙන්නේ ද මිනිසා ම ය.

සත්ත්ව ලෝකයත් සොබාදහමත්, පරිසරයත් සත්‍ය ලෙසම පෙනී සිටිමින් හැමවිටම අව්‍යාජ බව ම ලොවට ප්‍රදර්ශනය කරයි.

බුදුන් වහන්සේ විසින් පර්යේෂණ කොට සොයා ගනු ලැබූ දහම් කරුණු අතර ප්‍රධාන තැනක් ගන්නේ ද සත්‍යයත්, මායාවත් වෙන් වෙන් වශයෙන් තම ශ්‍රාවකයාට හඳුන්වා දීම යි. මායාව, ව්‍යාජත්වය, මුසාව විසින් වටකරගෙන සිටින සත්‍යය එයින් මුදවා මතු කර දීම උන්වහන්සේගේ දේශනාවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයයි.

මිනිසා කොතෙක් ධර්මය ගවේෂණය, කරමින් එය ඇසුරු කරමින් සිටිය ද බොහෝ අවස්ථාවල සමහරුන්ගෙන් ප්‍රකට වන්නේ ව්‍යාජ මායාකාරී ස්වභාවයක් ම ය. මෙම ගැඹුරු යථාර්ථය සාහිත්‍යකරුවන් විසින් සාහිත්‍ය කලා නිර්මාණ මඟින් ප්‍රකට කරනු ලැබීමට උත්සාහ ගෙන ඇත්තේ ද මිනිසා මායාවෙන් මුදවාගෙන සත්‍ය ලෝකය වෙත කැඳවාගෙන යාමට අනුබල දීමක් වශයෙනි.

සුජීව කරුණාසේන විසින් පද රචනය කොට එච්. එම්. ජයවර්ධනයන් විසින් තනුවකින් සරසන ලද මෙම ගීතය මාලනී බුලත්සිංහල කලාකාරිනියගේ මුවින් ගැයෙයි. යථෝක්ත පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙන් ම රචිත පද වැලක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

**දකින විට පන්සලක් පිළිමයක් බෝධියක්**
**හුනස්නෙන් නැගිටිමින් වඳිනවා**
**හදේ නැති භක්තියක් වත පුරා තවරගෙන**
**අඩවන් ව නෙත් බරව බලනවා**

සමහර සැදැහැවතුන් බාහිර ලෝකයට දර්ශනය වීම සඳහා පමණක් ගතකරන දිවිපෙවෙතේ, නිසරු නිරර්ථක ව්‍යාජ ජීවිත ගෙවන අයුරු ගීත රචකයා නිර්දය උපහාසයට පත්කොට ඇත.

දුම්රියක, බස් රියක ගමන් කිරීමේ දී ආගමික ස්ථානයක් දුටුවිට ගත පුරාම තවරාගත් ව්‍යාජ ශ්‍රද්ධාවෙන් හිඳි අස්නෙන් නැගිටින සමහර නිසරු චරිතවල සැබෑ ස්වභාවය කවියා මතු කර දක්වයි.

**ගැබිනි මව් කෙනකු හෝ රෝගියකු**
**දුටු කලෙක**
**කවුළුවෙන් අනන්තය සොයනවා...**
**අතෙහි රැඳි පොත පතෙහි එකම පේළිය**
**තුළම**
**නෙත් දහස් වාරයක් දුවනවා.**

මෙසේ ආගමික ස්ථානවල වැඳ වැටෙන සමහර චරිත ගැබිනි මවක හෝ රෝගියකු රථයට නැඟුණු පසු අසුන පරිත්‍යාග කිරීමට සිදු වේ යැයි බියට වා කවුළු අතරින් ඈත අනන්තය දෙස බලා සිටින බව මෙම කොටසින් පවසන්නේ ඔවුන් සතුව පවතින ශ්‍රද්ධාව ව්‍යාජ මායාකාරී බව ප්‍රකට කිරීමට ය.

තවත් වරෙක සමහරු දෑතෙන් පොතක් පෙරළමින් දෙනෙත් පමණක් එකම පේළිය මත එහෙ දුවමින් ව්‍යාජ ග්‍රන්ථ පරිශීලනයක යෙදෙන අයුරු මෙහි සඳහන් කොට ඇත.

ශ්වේත වස්ත්‍රවල ඇති පවිත්‍රභාවය, එහි ඇති පාරිශුද්ධත්වය ඔවුන්ගේ සිත්සතන් අහලකටවත් සම්ප වී නොමැත. මෙකී ව්‍යාජ ජීවන චරිතය මෙම ගී පද රචකයා සරදමකට ලක් කරන්නේ එම ව්‍යාජ බවින් මිනිසා මුදවාගෙන මායාකාරි ලොවින් සැබෑ ම වූ සත්‍යය ම වූ, සාධාරණ ම වූ, දැහැමි සාධු මාවතකට ප්‍රවේශ කරවීමට ය.

**වාරු නැති මහලු වත නෙතේ ගැටෙතැයි**
**බියෙන්**
**දෙනෙත් යුග නිදිකිරා වැටෙනවා...**
**ලොවේ නැති දහසකුත් ගැටලු සිහියට නගා**
**අහසබිම ගැටලන්න හදනවා...**

> **ව්‍යාජ රංගනයෙන් තවත් කෙනකු රැවටීමකට පත් කරන්නේ නම්, එය අතිශය භයානක අකුසලයකි.**

තවත් වරෙක වයෝ වෘද්ධ මිනිසකු දුටු විට දෙනෙත් පමණක් පිය වෙන ව්‍යාජ නින්දකට යොමු වන්නේ තම අසුන පරිත්‍යාග කිරීමට සිදුවේ ය යන බිය නිසා ය. එහෙත් කවදා හෝ දිනක තමනුත් එම තත්ත්වයට පත්වන බව හෝ සිතා ගැනීමට ඔවුන්ට කල්පනා නොවන්නේ මන්දැයි කවියා මෙම පදවැල තුළ සඟවා ඇති යථාර්ථයයි.

මෙම ගීත රචකයා මානව සමාජයෙන් ඉල්ලා සිටින්නේ මායාකාර ව්‍යාජ රංගනයෙන් මිදී සත්‍යය ගරු කරමින් ඇත්ත ඇති සැටියෙන් ලෝකයට ප්‍රදර්ශනය කරන ජීවන චරිතයක යෙදෙන ලෙසයි. ව්‍යාජ රංගනයෙන් තවත් කෙනකු රැවටීමකට පත් කරන්නේ නම්, එය අතිශය භයානක අකුසලයකි.

එකිනෙකාට සුහදත්වයෙන් උපකාර කර ගනිමින් මිනිසා සුන්දර ජීවිත විවරණයක යෙදෙන්නේ නම්, එකී මානව ලෝකය සුන්දර ලොවක් බවට පත්වන බව මෙම පදවැල තුළ ඇති සැඟවුණු අර්ථයයි.

ලෝකය තුළ එවැනි සුන්දර චරිත නැතුවාම නොවේ. අනුන්ට පිහිට වෙන පරහිතකාමී සැබෑ මානව චරිත අප අතර කොතෙකුත් දක්නට ලැබේ. මේ මිනිස් ලොව මෙතරම් සුන්දර වී ඇත්තේ එකී අව්‍යාජ සත්‍යකාමී සුන්දර මානවයන් නිසා ය. ඒ බව මෙහිදී විශේෂයෙන් ම සඳහන් කළ යුතු ය.

කෙසේ වෙතත් මේ ගී පද රචකයා මිනිස් වෙස් රැගෙන සිටින නොමිනිසුන් ගැන සිය අවධානය යොමු කොට ඇත. මනසෙහි ඇත්තේ වරෙක වෛරය, තරහව, ක්‍රෝධය වැනි නරක සිතිවිලි ය. එහෙත් එය මතුපිටට එන්නේ වෙස්වළාගත් චෛතසික ලෙසයි.

වරෙක එය මිහිරි වදන් බවට පරිවර්තනය වේ. තවත් වරෙක සුන්දර සිනහවක් බවට පරිවර්තනය වේ. මුවග සිනහවත්, මුවෙන් පිටවන වදන් වැලත් පරීක්ෂා කිරීමෙන් පමණක් ඔවුන්ගේ සැබෑ ස්වභාවය තෝරාගත නොහැකි ය. එම නිසා දැඩි ඉවසීමෙන් හා විමසීමෙන් යුතුව මිනිසා අවබෝධ කරගත යුතු බව මෙයින් අපට වඩාත් ම අවබෝධ වන යථාර්ථයයි.

## සංසාරේ දුක් ගිනි නිවුමට

බාල බොළඳ මගෙ පුංචි නැඟණියේ
ඇහැළ මලේ කහ පැහැය උරාගත්
සිවුරෙන් සියුමැලි ගත සරසා ගෙන
සංසාරේ දුක් ගිනි නිවුමට සැම
සන්සුන් ගමනින් පියවර මනිමින්
දනට වඩිනවා අම්මේ

අටලෝ දහමේ අනියත බව දැක
ලොවිතුරු සුව විඳිනට යෞවනයේ
පාරමී පුරමින් සුපිපුණු සියපත
දනට වඩිනවා සසර දනව්වේ
ඔබෙ පොඩි දෝනී අම්මේ

මොනර පිලක් වන් වරලස නිල්වන්
සිඳලූ ඇගෙ ඉඳුනිල් දෙනුවන දැක
බත් පත කඳුළින් අනමින් ඉකිබිඳ
ඇයි හැඬුවේ දුක වාවනු බැරිව ද
පොඩි දුව වඩිනව අම්මේ

ආචාර්ය
රත්නපාල වික්‍රමසිංහ



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## වප් පුර පසළොස්වක 2022-10-09

# ගැටලු මඟහරින මඟ

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ ලෝකයේ ජීවත්වන මිනිසුන්ගේ ඇතුළත් ගැටලු ය. පිටතත් ගැටලු ය. ඔවුන් සිත පෙළන මේ අපමණ ගැටලුවලින්, අවුල් වියවුල්වලින් මිදෙන්නේ කෙලෙස දැ"යි එක්තරා අවස්ථාවක බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි දේවතාවෙක් උන්වහන්සේගෙන් විමසා සිටි බව දේවතා සංයුත්තයේ සඳහන් ය.

එවිට බුදුරජාණන් වහන්සේ විසින් ඒ දේවතාවා අමතා දේශනා කොට වදාරනු ලැබ ඇත්තේ මිනිසා මුහුණ දෙන මේ සා ගැටලු මිනිසාගේ වරදින් නිර්මාණය කරගත් ඒවා බව ය. ඒ වරද නම් මිනිසා ගුණධර්මවලින් දුරස්වීම ය.

එහෙයින් මිනිසා සිත, කය හික්මවා ගැනීම, සිත පාලනය කර ගැනීම, සිත හා ප්‍රඥාව දියුණු කර ගැනීම කළ යුතු බව උන් වහන්සේ දේශනා කොට වදාළහ.

මීට අවුරුදු දහස් ගණනකට පෙර බුදුරදුන්ගෙන්, දෙවියන් විමසූ මේ පැනය එදාට මෙන්ම, ඇතැම්විට එදාටත් වඩා අදට පොදු කාරණයක් බව සමාජයේ ඇසෙන්නට පෙනෙන්නට තිබෙන දේ තුළින්, අප අත්දකින, අත්විඳින සිදුවීම් තුළින් පැහැදිලි ය. සමාජය උඩුයටිකුරු කරවන ඇතැම් සිදුවීම් සිතා බලා කටයුතු කරන්නට හැකියාව ඇති මිනිසාගේ ම ක්‍රියාකලාපයන් දැයි සැක සිතෙන තරමට ඛේදනීය ය. අප්‍රසන්න සහගත ය.

ලෝභය, ද්වේෂය, මෝහය ආදී අකුසල මූලයන් සිත තුළ ක්‍රියාත්මක වී අවසානයේ ක්‍රියාවට නැඟේ. එය ඇතැම්විට සීමාව ඉක්මවා යන්නේ මිනිසාට මිනිස්කම පවා අමතක කරවමිනි. එහි දීර්ඝකාලීන ඵලය සතුටක් සැනසීමක් නොව අවුල් වියවුල් පමණක් ම බව හැඟෙන්නේ බොහෝ පමා වීය. එවිට සිදුවිය යුතු විනාශය වී හමාරය.

එය නිවැරැදි කරන්නට අසීරු ය. ඇතැම්විට ඒ අනිසි පල සදාකාලිකව ම දුක් සුසුම් ඉතිරි කරන්නේ ය. අස්වයා ගිය පසු ඉස්තාලය වසා ප්‍රයෝජනයක් නැත. එය කළ යුතු ඒ සත්ත්වයා පැන යන්නට පෙර ය. බොහෝ දෙනකුගේ ක්‍රියා කලාපයන් ද එලෙස නිෂ්ප්‍රයෝජනවත් ය.

යමක් කියන්නට කරන්නට පෙර ඒ ගැන හොඳින් සිතා බැලිය යුතු ය. ශ්‍රී සද්ධර්මයෙහි සඳහන් ලෙස තමන්ට අනර්ථවත්, අනුන්ට ද අනර්ථවත්, තමන්ටත් අනුන්ටත් යන දෙපිරිසට ම අනර්ථවත් වන කිසිදු දෙයක් නොකළ යුතු ය. එවිට අවුල් - වියවුල්, විසඳාගත නොහැකි ගැටලු පැන නොනඟී.

එය කළ හැකි වන්නේ ද තමන්ට ම ය. මවට - පියාට, ගුරුවරුන්ට, පූජ්‍ය පක්ෂයට හෝ වෙනත් වැඩිහිටියකුට ආදි ලෙස කිසිවකුට අප හික්මවිය නොහැකි ය. ඔවුන්ට කළ හැකි ඒ සඳහා මඟ කියාදීම පමණ ය. එහි ගමන් කරනවා ද යන තීරණය තමන්ගේ ය. ඇතැම් කෙනෙක් වැරැදි කරන්නේ මවුපියන්, දූ දරුවන් නිසා යැයි කියති. එසේත් නැතිනම් අනුන්ගේ අවශ්‍යතාවකට යැයි කියති. භෞතික වශයෙන් ඔවුහු ඒවායේ ප්‍රයෝජන අත්විඳිනවා විය හැකි ය. එහෙත් ඒ වරදෙහි දුක් විපාකය නම් බෙදා ගන්නට කිසිවෙක් තමන් සමඟ ඉදිරිපත් වන්නේ නැත. ඒවා භුක්තිවිඳිය යුතු තමන් තනිව ම ය. ඒ අවුල් වියවුල් තමන් ම විසඳා ගත යුතු ය. මේ ජීවිතයේ පමණක් නොව මතු සසරට ද ඒ දුක උරුම ය. පනින්නට පෙර සිතා බැලිය යුතු එහෙයිනි.

නිරවුල් මනස සාමකාමී ය. වරදෙහි නොබැඳෙන්නේ ය. කරන කියන කටයුතු ද අවුල් නොවන්නේ ය. ගැටලු ද නැත. එවැනි ජීවිතයකට කළ යුතු පළමු පියවර අපගේ තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළ ලෙස පංචශීලයෙහි පිහිටීම ය. එවිට කය වචනය සංවර වේ. අපගේ ඇසට, කන, නාසය, දිව ශරීරයට හසුවන දේ ගැන හික්මීමක් ඇති වේ.

එමෙන් ම ලෝකය ගැන අවබෝධ කොටගෙන ලෝකය සමඟ ජීවත් විය යුතු වේ. අට ලෝ දහමට කම්පා නොවී, සම්බුදු වදන අනුව යමින් මැදුම් පිළිවෙත අනුගමනය කරනවා නම්, තමන්ගේ පිහිට තමන්ට ම සලසා ගැනීමට පුළුවන. ඒ ජීවිතය අවුල් වියවුල්වලින් තොරය.



# දෙලොවටම සුව දෙන සතර සුව

**අද මේ පින්වතුන්ට ධර්ම දේශනාවෙන් විස්තර කරන්න බලාපොරොත්තු වන්නේ, අප කවුරුත් විඳින්නට කැමැති සැප ගැනයි. ලොව වාසය කරන සෑම ජීවියකුම දුක් විඳින්න කැමැති නැහැ.**

හැකි තරම් සැප විඳින්න තමයි කැමති. මනසේ ඇතිවන පිනවන ස්වභාවයටයි සැප කියන්නේ. අපේ බුදුරජාණන් වහන්සේ තරම් සැප ගැන මනාව කරුණු තෝරා දී ඇති වෙන කිසිම කෙනෙක් මේ ලෝකයේ ඇත්තේ නැහැ.

අපගේ ශරීරයේ දොරටු කීපයක් තිබෙනවා. ඇස, කන, නාසය, දිව, ශරීරය යන පහයි. පසිඳුරන් කියාත් මේවාට කියනවා. බාහිර ලෝකයේ තිබෙන්නා වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කාම වස්තූන් මුලින් සඳහන් කළ දොරටුවලින් අපේ ශරීරය තුළට ඇද ගන්නවා.

අපේ මනසට යම් කිසි සතුටක්, වින්දනයක් මේ කාම වස්තුවලින් ඇති කරනවා නම්, ඒවාට තමයි සාමාන්‍ය සමාජයේ සැප කියන්නේ.

ලස්සන රූප බලනකොට සතුටක් ලැබෙනවා නේද, කනට මිහිරි ශබ්දයක් ඇසෙන විට කොපමණ සතුටක් ද සිතට නැඟෙන්නේ. රසවත් ආහාර පාන ගන්නා විට කියන්නට බැරි තරම් ප්‍රියජනක තත්ත්වයක් ඇති වෙනවා. අපි ගොඩක් ආශා කරන්නේ සුවඳට, හොඳ මල් සුවඳක්. විලවුන් සුවඳක් නහයට දැනෙනකොට තව තවත් සුවඳ විඳින්නටයි අප උත්සාහ කරන්නේ. මුදු මොළොක් පුටුවල, ඇඳන්වල වාඩි වෙන කොට කොච්චර සතුටක් ඇති වෙනවා ද? ස්පර්ශයෙන් දැනෙන ආස්වාදය වචනවලින් විස්තර කරන්න බැරි බව ධර්මයේ සඳහන් වෙනවා.

මෙම පංචකාම සම්පත් නොඅඩුව අනුභව කරන්නට අපට හොඳ ආර්ථික ශක්තියක් තියෙන්න ඕන. ඒක තමයි බුදුරජාණන් වහන්සේ අත්ථි සුඛය වශයෙන් දේශනා කර තිබෙන්නේ. මට ජීවත්වීමට ඇති තරම් මිල මුදල් ගෙවල් දොරවල් ආදිය තිබෙනවා යැයි කිසිවකුට හැඟෙනවා නම් ඔහුට අත්ථි සුඛය විඳින්නට පුළුවනි.

ඇතැම් මවුවරුන්, පියවරුන් වෙහෙස මහන්සි වී ඉඩකඩම්, ගේ දොර මිල මුදල් දරුවන්ට සොයා දෙනවා. එවැනි දරුවන්ට එතරම් වෙහෙස මහන්සි නොවුණත් අත්ථි සුඛය විඳීමට වාසනාව ලැබී තිබෙනවා.

එහෙත් බොහෝ දරුවන්ට අම්මාගෙන් තාත්තාගෙන් අඟලක්වත් නොලැබෙන්න පුළුවන්. මිල මුදලුත් නොලැබෙන්න පුළුවන්. එවැනි අය වෙහෙස මහන්සි වී වැඩ කරන්න ඕනෑ. කම්මැළි නොමැතිව කටයුතු කොට දහඩිය වගුරා යමක්කමක් උපයා ගන්න ඕනෑ.

අපට තිබෙනවා ශක්තීන් දෙකක්. ඒවා තමයි කායික, මානසික ශක්තිය, තමන්ගේ හැකියාවන් තෝරා ගෙන වෙළෙඳ ව්‍යාපාර, ගොවිතැන් කටයුතු, වෙද හෙදකම්, ආදි විවිධ වෘත්තීන් හි නියැළී මිල මුදල්, ඉඩකඩම් ආදිය සොයා ගන්න ඕනෑ.

බුදුරජාණන් වහන්සේ තහනම් කළ මත්පැන්, අවි ආයුධ, වස විෂ, මස් මාංශ, සත්ත්ව ආදි වෙළඳාම්වලින් වැළකිය යුතු යි. වංචනික ලෙස බඩු කිරීම, රෙදි මැනීම ආදියෙන් වැළකිය යුතුයි.

දැහැමින් සොයා ගත් ධනය මට තිබෙනවා යැයි සෑහීමට පත්වීමෙන් ඉමහත් සුවයක් තමන්ට විඳින්ට පුළුවනි.

දිළිඳුකම කාමභෝගී ගිහියාට මහත් දුකක් බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබෙනවා. අප වෙහෙස මහන්සි වී යමක්කමක් උපයා සපයා ගන්නේ අපට අවශ්‍ය සැප සම්පත් ලබා ගන්නටයි. දැඩි ලෝබකමින් කිසිවක් වියදම් නොකරන්නාට සැප ලැබෙන්නේ නැහැ.

අප ධනය සොයන්නේ "දෙන්නටයි– අනුභව කරන්නටයි" බව බුදුරදුන් දෙසා වදාළා. අදින්න පුබ්බක, මච්ඡරිය කෝසිය, ඉල්ලිස වගේ දැඩි මසුරුකමින් සිටියොත් භෝග සුවය විඳින්නට බැහැ. තම දරුවන්ට, මවුපියන්ට හැකියාවක් වෙතොත් ඥාතීන්ට උපකාර කළ යුතුයි.

එපමණක් නොවෙයි තමන්ගේ ආගම දහමේ දියුණුවට, දුගී මගී යාචකාදීන් සනසන්නට, රටේ දියුණුවට යොදවන්නට ඕනෙ. එතකොටයි භෝග සුඛය ධර්මානුකූලව විඳීමට හැකි වන්නේ.

සුරාවට, සූදුවට, සල්ලාලකමට ඇබ්බැහි වුණොත් තම ධනය ඉක්මනින් විනාශ වී යනවා. මහ ධන සිටුපුත් අසූ කෝටියක් ධනය අදැහැමි ක්‍රියාවලට යොදවා සිඟමනට පත්වුණා. සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇති අයුරින් මිල මුදල් වැය කළ යුතුයි.

තමන් කාටවත් ණයක් නැතැයි කියලා කිසිවකුට අවංකව සතුටු වීමට හැකි නම්, එම සතුටට තමයි අණන සුඛය කියන්නේ.

සමාජයේ සිටින බොහෝ දෙනකු තමන්ගේ අය අනුව වැය කිරීමට පුරුදු වී නැති නිසා එකිනෙකාගෙන් ණයට මිල මුදල් ගන්නවා. තමන්ට කලට වෙලාවට ගෙවා ගන්න බැරි වුණාම මානසික වශයෙන් පුදුම දුකක් විඳිනවා. විවිධ කරදරවලට පත්වන්නට සිදු වෙනවා. පොලිසි ගානේ, රස්තියාදු වීමට සිදු වෙනවා. අනතුරුවලට පවා මුහුණ දෙන්න සිදු වෙනවා. එම නිසා ණය නොවී ජීවත්වීමට හැකි තරම් වෑයම් කරන්න ඕන.

තමන්ට කිසියම් අවස්ථාවක, තමන්ගේ අතීතය මෙනෙහි කරන විට අසාධාරණ අයුක්ති සහගත ලෙස, අධාර්මික ලෙස ජීවත්වීම සඳහා නරක ක්‍රියාවල යෙදුනේ නැතැයි සිතා සතුටු වීමට හැකියාවක් වෙතොත් ඒ වින්දනයට තමයි අනවජ්ජ සුඛය කියන්නේ.

වාසනාවන්ත පින්වතුනි, මේ කියා දුන් සුව සතර ලෞකිකත්වයත් ලෝකෝත්තර සැපතටත් හේතු වෙනවා. ලෞකික සැප තාවකාලිකයි. පංචකාම සම්පත් බොහෝම තාවකාලිකයි. ඒවා මොහොතකින් දුකට පත්වෙනවා. ඒ ස්වභාවය තේරුම් ගෙන නිවැරැදි අන්දමින් සැප විඳින්නට උත්සාහවත් වන්න.

ගම්පහ බෙම්මුල්ල විගොඩ ශ්‍රී ධර්මරාජ විහාරාධිපති
ශාස්ත්‍රපති
**කපුහේන්තුඩුවේ ඤාණසීහ හිමි**



# සත්පුරුෂ ඇසුර සසර පුරාම පැතිය යුතු ඇයි?

## චූලපුණ්ණව සූත්‍රය

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

**අසත්පුරිසො භික්ඛවෙ අසද්ධම්ම සමන්නාගතො හොති, අසත්පුරිස භත්ති හොති,අසත්පුරිස චින්තී හොති, අසත්පුරිස මන්තී හොතී අසත්පුරිස වාචො හොතී,අසත්පුරිස කම්මනතො හොති,අසත්පුරිස දිට්ඨී හොතී, අසත්පුරිස දනං දෙති**

**පුද්ගලයකුගේ අභිවෘද්ධිය පිණිස කවර කාලයක වුවත් සත්පුරුෂයන්ගේ ආශ්‍රය අවශ්‍ය වෙනවා. පුද්ගලයා නිවනට යොමු කරවන්නේ ද සත්පුරුෂයා විසින්.**



මොරටුව ලුනාව උයන පාරේ බෝධිරාජාරාමාධිපති කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය

**අගලකඩ සිරිසුමන හිමි**

අසත්පුරුෂයා හැම කල්හිම දුසිරිතට, පාපයට ම පුද්ගලයා රැගෙන යනවා. ඒ නිසා ආශ්‍රය සඳහා සත්පුරුෂයන් ම තෝරා ගත යුතු වෙනවා.

අපි ඕනෑම පුණ්‍ය කර්මයක් අවසානයේ සත්පුරුෂ ආශ්‍රය පතමින්, අසත්පුරුෂයන් ප්‍රතික්ෂේප කරන්නට "ඉමිනා පුඤ්ඤකම්මේන" යන ගාථාව කියනවා.

සත්පුරුෂයා සහ සත්පුරුෂතරයා යනුවෙන් දෙදෙනෙක් බුදුහාමුදුරුවෝ අපට උගන්වනවා. පංච දුශ්චරිතයෙන් වැළකී තම ජීවිතය පුණ්‍යවන්ත කරගත් පුද්ගලයා සත්පුරුෂයා යි. එවැනි කෙනෙක් අන්‍යයන් ද පංච දුෂ්චරිතයෙන් මුදවා ගන්නට උත්සාහ කරනවා නම්, වෙහෙස වෙනවා නම් ඒ පුද්ගලයා සත්පුරුෂතරයා බවට පත් වෙනවා.

සත්පුරුෂයා හා අසත්පුරුෂයා හඳුනා ගන්නට වටිනා කරුණු කීපයක් චූල පුණ්නව සූත්‍රයෙහි බුදුහිමියන් වදාළා.

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර පූර්වාරාමයේ වැඩවසන සමයෙහි පුන් පොහෝ දිනයෙක සන්ධ්‍යාවේ තමන් වහන්සේ පිරිවරාගත් භික්ෂු සමූහයා වෙත සත්පුරුෂයා හා අසත්පුරුෂයා හඳුනා ගන්නා ආකාරය පිළිබඳ කළ දේශනාව මේ සූත්‍රයට ඇතුළත් වී තිබෙනවා. එයට අනුව අසත්පුරුෂයා හඳුනා ගන්නා ලක්ෂණ අටක් බුදුහිමියෝ පෙන්වා වදාළා.

මහණෙනි, අසත්පුරුෂයා පාප ධර්මයෙන් යුක්ත වෙනවා. (අසද්ධම්ම සමන්නාගතො හොති)

අසත්පුරුෂයා, අසත්පුරුෂයන් ම ආශ්‍රය කරනවා (අසත්පුරිස භත්තො හොති)

අසත්පුරුෂයා අසත්පුරුෂ සිතිවිලිවලින් යුක්ත වෙනවා (අසත්පුරිස චින්තී හොති)

අසත්පුරුෂයා අසත්පුරුෂ ලෙසට කථාවෙන් යුක්ත වෙනවා. (අසත්පුරිස මන්තී හොති)

අසත්පුරුෂයා අසත්පුරිස වචනවලින් යුතු වෙනවා. (අසත්පුරුස මන්තී වාචො හොති)

අසත්පුරුෂයා අසත්පුරිස ක්‍රියාවලින් යුක්ත වෙනවා. (අසත්පුරුස කම්මන්තො හොති)

අසත්පුරුෂයා අසත්පුරිස දෘෂ්ටි ඇත්තෙක් වෙනවා. (අසත්පුරිස දිට්ඨී හොති)

අසත්පුරුෂයා අසත්පුරිස දානයක් දෙනවා (අසත්පුරිස දානං දෙති)

මේ ආකාරයෙන් බුදුපියාණෝ අසත්පුරිස ගති පෙන්වා මෙම සූත්‍රයේ දී ඊළඟට ඒ එක් එක් කාරණාව විවරණය කර තිබෙනවා. ඒ අනුව අසත්පුරුෂයා තෙරුවන් කෙරෙහි කිසිදු පැහැදීමක් නැති, ධර්මය පිළිබඳ කිසිදු අවබෝධයක් නැති, කම්මැලි, කුසීත සිහි මුළා වූ අඥානයකු බව බුදුහිමියෝ මෙහිදී පැහැදිලි කළා.

එමෙන් ම අසත්පුරුෂයා නිතරම ශ්‍රද්ධාව නැති, විලිබිය නැති අල්පශ්‍රැත, කම්මැලි සිහිය මුළා වූ අඥනයන් ම ආශ්‍රයට එකතු කර ගන්නවා.

අසත්පුරුෂයා තමන්ට ද, අනුන්ට ද අහිත පිණිස ම සිතනවා. තමන්ටත් අන්‍යයන්ටත් නපුරු ලෙසට සිතිවිලි ගොඩනඟා ගන්නවා.

ඊළඟට අසත්පුරුෂයා හැම විටෙක ම අසත්පුරිස කථාවෙන් යුතු වෙනවා. කරන කථාව තමන්ටත් පීඩා ඇති කරනවා. අන්‍යයන්ටත් පීඩා පිණිස ම පවතිනවා. තමන්ටත්, අනුන්ටත් අනර්ථය පිණිස ම හේතුවන කථා කරන්නේ අසත්පුරුෂයායි. එමෙන්ම අසත්පුරුෂයා බොරු, කේලාම්, පරුෂ වචන සහ සම්ප්‍රප්පලාප නිතර නිතරම කියනවා.

අනුන්ගේ වතගොත සොයමින් ඒවායේ වැරැදි අඩුපාඩු තවත් කෙනෙක් සමඟ කියනවා. අන්‍යයන්ගේ කීර්තිය නැති වන විදියට විවිධ බොරු ප්‍රවාද හදනවා. කටපුරාම පරුෂ වචන පිරිලා. ඕනෑම දෙයකට පරුෂ වචනයකින් ම පිළිතුරු දෙන්න පුළුවන්.

ඊළඟට අසත්පුරුෂයා පරපණ නසමින්, සොරකමින් ම ජීවත් වෙන්න උත්සාහ කරනවා. දුෂ්ට වෙළඳාම් ආදියෙහි නිතර ම නිරත වෙනවා. මිනිසුන්ගේ ජීවිත විනාශ වන ආකාරයෙන් මිනිසුන්ට වස විෂ විකුණනවා.

සමහර විට මිනිසුන් අනුභව කරන ආහාර පාන කල් තබා ගැනීම පිණිස දැන දැනම ඒවාට වස විෂ යොදන අය අපේ සමාජයේ ඉන්නවා. ඒ සියලු දෙනාම අසත්පුරුෂයන් අතරටයි වැටෙන්නේ. ඒ වගේම තමයි කාමයෙහි වරදවා හැසිරෙමින් ජීවිත තිරිසනකුගේ තත්ත්වයට පත් කර ගන්නේ ද අසත්පුරුෂයෙක්.

තිරිසනා හැසිරෙන්නේ තමන්ට සහජයෙන් ලැබුණ චර්යාවන්ට අනුව. ඒවා වෙනස් කර ගන්න තිරිසනුන්ට බැහැ. ඒත් මිනිසුනට එහෙම නොවෙයි. මනසක් ලැබී තිබෙන්නේ සිතට එන විදියට ම වැඩ කරන්න නොවෙයි. ඒ නිසා තම හැඟීම්වලට වහල් වෙලා රාගයෙන් මුලා වෙලා, සමාජයේ සල්ලාලයන් ලෙස ක්‍රියා කරන්නේ අසත්පුරුෂයා යි.

ඒ වාගේම අසත්පුරුෂයාට හොඳ, නරක මෙලොව, පරලොව, කර්මය හා කර්ම ඵලය පිළිබඳ අවබෝධයක් ඇත්තේ නැහැ. ඒවා පිළිගන්නේ නැහැ. මෙලොවක්, පරලොවක් හෝ කුසල අකුසල පිළිබඳ විශ්වාසයෙන් තොර මනුෂ්‍යයා තම ජීවිතයෙන් මොනතරම් පාප ක්‍රියා සිදු කර ගන්නවා ද? කුසලය හා අකුසලය පිළිබඳ විශ්වාසය නැතහොත් කර්මය පිළිබඳ විශ්වාසය පුද්ගලයකු සදාචාරාත්මක දිවි පෙවෙතකට යොමු කරවනවා. වැරැද්දෙන් මිදී ජීවත් වෙන්න උත්සාහ කරනවා. ඒත් අසත්පුරුෂයාගේ හැටි බලන්න. ඔහු මේ කිසිවක් පිළිනොගෙන පව් කර ගන්නවා.

එමෙන්ම අසත්පුරුෂයා යමක් දෙන විට පරිත්‍යාග කරන විට තමන්ගේ දෑතින්ම එය කරන්නේ නැහැ. දෙන දෙය කෙරෙහිත්, ප්‍රතිග්‍රාහකයා කෙරෙහිත් කිසිම ගෞරවයක් ඇත්තේ නැහැ. තමන්ට ප්‍රයෝජනයට ගත නොහැකි දේ ම සොයා දන් දෙනවා. විපාකය පිළිබඳවත් විශ්වාසයක් නැහැ. සමාජයෙන් කීර්තියක් ලබා ගැනීම සඳහා දන් දෙන අය මේ සමාජයේ ඉන්නවා. මේ අයගේ දාන අසත්පුරිස දාන වශයෙන් වදාළා.

මේ අනුව මේ සූත්‍රයේ දී අසත්පුරුෂයා පාප ධර්මයෙන් යුතු බවත්, අසත්පුරුෂයන් ම ආශ්‍රය කරන බවත්, සිතන සිතිවිලි අසත්පුරුෂ බවත්, කතාව වචන අසත්පුරුෂ බවත්, ක්‍රියාව හා දෘෂ්ටි අසත්පුරුෂ බවත්, දන් දෙන්නේ ද අසත්පුරුෂ ස්වභාවයකින් බවත් බුදු පියාණන් වහන්සේ මෙම සූත්‍රයේ දී වදාළා. මේ අසත්පුරුෂයා මරණින් මතු නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි උප්පත්තිය ලබන බව ද බුදුපියාණන් වහන්සේ වදාළා.

> **"තමන්ටත්, අනුන්ටත් අනර්ථය පිණිස ම හේතුවන කථා කරන්නේ අසත්පුරුෂයායි. එමෙන්ම අසත්පුරුෂයා බොරු, කේලාම්, පරුෂ වචන සහ සම්ප්‍රප්පලාප නිතර නිතරම කියනවා. අනුන්ගේ වතගොත සොයමින් ඒවායේ වැරැදි අඩුපාඩු තවත් කෙනෙක් සමඟ කියනවා. අන්‍යයන්ගේ කීර්තිය නැති වන විදියට විවිධ බොරු ප්‍රවාද හදනවා"**

එබැවින් පින්වතුනි, ඔබ හැම විටෙක ම මේ අසත්පුරුෂ ගතිවලින් මිදෙන්න උත්සාහ කළ යුතු සේ ම බුදුහිමියන් වදාළේ මේ අසත්පුරුෂයන් සේවනය නොකළ යුතු බවයි. "අසේවනාච බාලානං". "නභජේ පාපකේ මිත්තේ" යන දේශනාවෙන් විමසා බලන විටත් විවිධ සූත්‍ර දේශනා විමසන විටත් අසත්පුරුෂයන් ගැන බුද්ධ දේශනාව අපට පැහැදිලි වෙනවා.

එබැවින් ජීවිතය සන්තුෂ්ඨිමත් කර ගැනීම සඳහාත්, මෙලොව අභිවෘද්ධිය සඳහාත්, දුගතියෙන් බේරීම සඳහාත්, නිවනට මඟ සාදා ගැනීම සඳහාත් සත්පුරුෂයන්ගේ ආශ්‍රය සසර පුරා ලබන්නට ප්‍රාර්ථනා කළ යුතු වෙනවා. මේ දේශනාව කියවූ ඔබට අසත්පුරුෂයා තේරුම් ගෙන ඔවුන්ගෙන් මිදෙන්නට හා සත්පුරුෂයා දැන හැඳින ගෙන ඔවුන් හා කටයුතු කරන්නට ශක්තිය සැලසේවා.

# The Offering Of The Kathina Robe To The Maha Sangha



Senior Lecturer, Pandit,
Faculty of Humanities and
Social Sciences
University of Sri Jayewardenepura
**Dr. Ven. Dodamgoda SumanasaraThero**

As mentioned in the lunar calendar of 2022, the month of the Kathina Robe offering to the Maha Sangha commences on the Vap Full Moon Day and it continues to the Il Full Moon Day (from 9 th October to 8 th November 2022) at Buddhist monasteries all over the world.

Accordingly, devotees of each temple decide on different dates with the advice of the chief incumbent within this period to organize their respective days for the Kathina ceremony.

The word 'Kathina' originated during the time of our great teacher, the Buddha. First, he used the word Kathina to refer to the frame which was used for spreading the cloth that was used to make the robe. Gradually, with time the basic meaning of the Kathina has changed to be known as the extra or special robe called 'Kathina Robe' to offer to the Maha Sangha at the end of the rainy season retreat. The literal meaning of the Kathina comes diversely such as 'hard', 'unbreakable', 'stable', 'solid', 'durable', and so on.

Once when the Buddha was residing at the Jetavana monastery, a group of thirty monks decided to observe Vas (the rainy season retreat) with their great teacher, the Buddha at the same monastery. With this intention, these monks left their monastery at the beginning of the Vas season to approach the Jetavana monastery in Savatthi, but they were unable to reach there on time before the Vassana began. Therefore, they had to observe Vas close to Savatthi practising meditation. Just after finishing the Vas period, the group of monks approached the Jetavana monastery to visit the Buddha in the torrential rain and they were drenched. Then, the Buddha saw that they were in the wet robes and granted his permission to hold an additional Kathina Robe for the monks who have observed 'Pera Vas' regardless their prevailing three robes.

At present, the Kathina Robe is offered by the devotees to the Maha Sangha who have observed 'Pera Vas' within a three-month period from the Esala Full Moon Day to the Vap Full Moon Day each year. However, if a monk fails to observe Vas continuously in this period, he is not eligible to accept the Kathina Robe. Eventually, this robe is offered by the Maha Sangha of the temple to one of the monks who is most qualified to accept it according to the Vinaya rules and regulations in the Vassupanaikakkhanda of the Mahavagga Pali.

The final day of the three months of rainy season retreat marks the end of Vassana with 'Pavarana' monastic discipline at the Uposathagara. At this Pavarana ceremony, each monk is invited by other monks to honestly reveal any misbehavior or offence that they have committed during the time in order to purify from their offences in the presence of the Maha Sangha. Prior to this Maha Pavarana disciplinary rule of the Maha Sangha, the Kathina Robe ceremony commences in each monastery.

The offering of the Kathina Robe to the Bhikkhus is a great meritorious deed and both the clergies and laypeople in this society can obtain merit through it. Additionally, merit can also be gained by doing some wholesome acts during the Vas season such as offering alms for monks and the poor, listening to the Dhamma, participating in poojas, organizing meritorious activities, doing meditation, and so on. As mentioned in Buddhist literature, offering a Kathina Robe to the monks is one of the great eight merits (Attha punnani) which are mentioned below.

1. Offering Kathina Robe
2. Offering eight essentials
3. Offering residential facilities (Buildings)
4. Offering alms to the Buddha and his disciples
5. Writing and offering the books regarding the Dhamma
6. Offering lands and estates
7. Erection and offering the Buddha statues
8. Building and offering sanitary facilities

Also, by offering these items and other necessary requisites with the Kathina, people would obtain more merit for the betterment of this life and the life after as well.

According to the Vassupanaikakkhanda, the following five specific consequences (pancanisansa) can be accumulated by the monk who holds the Kathina Robe.

1. He has the full freedom to walk in the village without informing the resident monks. (Anamantacara)
2. He is allowed to stay in the two robes (outer robe and inner robe) using the double robe until the Medin Full Moon Day. (asamadacara)
3. He is allowed to receive alms by requesting from devotees to have it with the company. (ganabhojana)
4. He is allowed to keep an additional robe or additional clothes for a robe for more than ten or thirty days. (yaavadattacivara)
5. He is allowed to obtain all robes and clothes offered by devotees to the monastery for the monks until the Medin Full Moon Day. (yo ca tattha civaruppada)

Lay Dhamma followers would also obtain a lot of merit by offering Kathina Robe to the monks. The well-known story of the Arhat Nagitha Maha Thero tells us how he accumulated merit byoffering a Kathina Robe to the Vapassi Buddha and his disciples ninety-one aeons (kalpa) ago.

As a result of his meritorious deed, he was never born in the Four Hells like naraka, tirisan, preta, and asura in his cycle of existence. Further, he has stated that he was only born in divine worlds and human realms with luxurious facilities due to offering a Kathina Robe.

In brief, both monks and lay Dhamma practitioners can accumulate more merit by engaging in diverse religious activities and offering a Kathina Robe to the Maha Sangha respectfully during this special time of every year.



**ගම්පහ**
**වැඩිහිටි නිවාසයක් සඳහා**
**වැඩිහිටි දෙමාපියන්**
**බඳවා ගැනේ.**
**0711535335**
**(සේවය සඳහා**
**ගැ/පි අවශ්‍ය වේ)**

## ගුරු පුරප්පාඩු

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහ පිරිවෙනක් සඳහා සංස්කෘත /ත්‍රි-ධර්මය/ දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාව/ භූගෝල විද්‍යාව ඉගැන්විය හැකි ගිහි - පැවිදි ගුරුවරුන් දෙදෙනෙකු සඳහා පුරප්පාඩු ඇත.

**0776112512**

## නොමිලේ වටිනා දහම් පොතක්

**ත්‍රිපිටක දහම් පොත් ඇසුරෙන් සකස් කර ඇති මෙම දහම් පොතෙහි සත්තිස් බෝධි පාක්ෂික ධර්ම - චතුරාර්ය සත්‍යය - පටිච්ච සමුත්පාදය, සුවිසි ප්‍රත්‍ය සහ සමථ විදර්ශනා භාවනා පිළිබඳව කරුණු ඉතා සරලව සඳහන් වේ.**

**කරුණාකර පැමිණ ලබාගන්න.**

**විමසීම් : සම්පාදක**
**පී.ජයසිංහ (ශාස්ත්‍රවේදී)**
**නො. 08, රෝහල පාර,**
**වැත්තෑව, මතුගම.**
**ටෙලි : 034-22 43 363**
**077 46 86 903**




## තිරුපති ශ්‍රීකාන්ත දඹදිව සංචාරකයෝ

වසර 30 ක් පුරා ශ්‍රී ලංකාවාසී බෞද්ධ බැතිමතුන් විශ්වාසවන්තව, සුරක්ෂිතව, නිවැරදිව, සුහදශීලීව වන්දනා කරවූ පුරෝගාමී ආයතනය වෙතින් පරිපූර්ණ චාරිකාවක්.

**✷ නවදිල්ලිය ✷ අග්‍රා ✷ සංකස්ස ✷ ශ්‍රාවස්ති ✷ කපිලවස්තු ✷ ලුම්බිණි (නේපාලය) ✷ කුසිනාරා ✷ විශාලා ✷ රජගහනුවර ✷ බුද්ධගයා ✷ බරණැස ඉසිපතනය**

(සියයකට අධික සිද්ධස්ථාන ප්‍රමාණයක් වන්දනා කෙරේ)

**දින 14 -** අයකිරීම රු. 2,35,000/-
(සියලුම බෞද්ධ සිද්ධස්ථාන වලට ඇතුළු වීමේ ගාස්තුව ඇතුළත්ව)

- වන්දනාව සඳහා වායුසමීකරණය කළ සුඛෝපභෝගී බස්රථ
- සුව පහසු නවාතැන්
- ප්‍රනීත ආහාරපාන ඇතුළු තවත් විශේෂ පහසුකම් රැසක්.

**පිටත්වීම : 2022 නොවැම්බර්**
**2023 පෙබ. / මාර්තු / අගෝ. / ඔක්තෝම්බර් / නොවැම්බර්**

| | | | | |
|---|---|---|---|---|
| ✷ | මැලේසියානු චාරිකාව | : | දින 5 | නවාතැන්, තරු පන්තියේ හෝටල් |
| ✷ | තායිලන්ත චාරිකාව | : | දින 5 | |
| ✷ | බුරුම (මියන්මාර්) චාරිකාව | : | දින 10 | |

- **සියලුම විමසීම් : ප්‍රධාන සංවිධායක**
**සාම විනිසුරු, දේශබන්දු, දේශශක්ති,**
**රෝහිත ශ්‍රීකාන්ත සිරිවර්ධන**
**නො. 297, දකුණු බටගම, කඳාන.**
**0714492282, 0766258221**

## බැමිණිතියා මහා සාගතය අවසානයේ ස්වාමින් වහන්සේලා ප්‍රතිපත්තිවලින් ඉවත් වීම.

වළගම්බා රජ රජ කරන අවධිය වූ ක්‍රිස්තු පූර්ව 88 සහ 76 අතර බැමිණිතියා සාගතය පැවැති කාලයේ ස්වාමින් වහන්සේලා කල්ලා ගම ජනපදයේ මණ්ඩලාරාමයට ස්වාමින් වහන්සේලා රැස්ව ශාසනයේ මූලය පරියාප්තියද නැතහොත් ප්‍රතිපත්තිය දැයි කියා විමසීමට වාදයක් විය. වළගම්බා රජුගෙන් ස්වාමින් වහන්සේලාට ඉඩකඩම්, වතුපිටි, පන්සල්, විහාරාරාම සාදා දීමත් එසේම අභයගිරි පාක්ෂිකයන්ට වැටුප් ලැබෙන ක්‍රමයක්ද ඇති කරන ලදී. රජතුමාත්, ඇමතිවරුන් තමතමන් විහාර ඉදි කරවා තිස්ස තෙරුන් වෙත ගොස් විහාර උන්වහන්සේට පූජා කරන ලදී. ඒ තන්හි සුදුසු පරිදි භික්ෂූන් නැවත්තුහ. රජතුමාද ඇමතියෝද තම තමන්ගේ විහාරවල වාසය කරහ. භික්ෂූන්ට නානා ප්‍රකාර වස්තූද පූජා කළහ. චතුරාර්ය සත්‍යයේ ඇත්තේ දුක දුකට හේතුව තණ්හාවයි. රජතුමා සහ ඇමතියෝ කර ඇත්තේ දුක නැති කිරීම නොව දුකෙහිම නියළෙන්නට තණ්හාව වැඩෙන ලෙස කටයුතු කිරීමය. වාදයේදී වැඩි ඡන්දයෙන් පාංශ කුල හිමිවරුන්ගේ ප්‍රතිපත්ති රැකීම පරදා ධර්ම කථික පරියාප්ති ජය ගන්නා ලදී.

ධර්ම කථික හිමිවරු ජයගත් අතර පාංශුකුල හිමිවරු පරාජය විය. එදා සිට බුදුරජාණන් වහන්සේ දේශනා කළ ප්‍රතිපත්ති නැති වී ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන්වන ප්‍රතිපදාවේ සහ හතර වන ප්‍රතිපදාවේ සිල්පද හතද භාවිතයෙන් ඉවත් වී ඒ වෙනුවට සිදුහත් කුමාරයා උපදින්නටත් පළමු භාවිත කළ පන්සිල්, අටසිල්, දසසිල් භාවිතයට ගෙන අද දක්වා එය භාවිතා වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඇති ප්‍රතිපදා ගැන දැනුමක් මෙන්ම භාවිතයක් නැති බැවින් කුසල්-අකුසල්, පින්-පව් දෙක හඳුනන්නේ නැත. දැන්වත් පින්-පව්, කුසල්-අකුසල් වල වෙනස හඳුනා ගන්නේ නම් මැනවි.

පින් යනු කය හා වචනින් කරන යහපත් ක්‍රියා. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන්වන ප්‍රතිපදාවේ දේශනා කර ඇති සිල් පදවන බොරු නොකීම, කේලාම් නොකීම, පරුෂ වචන නොකීම, හිස් වචන නොකීම වචනින් සිදු කරන පින් හතර සහ හතරවන ප්‍රතිපදාවේ කයෙන් සිදු කරන පින් තුන සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීම. මෙම සිල්පද හත කය හා වචනින් කරන සිල්පද හතයි. පව් යනු කය හා වචනින් කරන නරක අයහපත් ක්‍රියාවේ. වචනින් පවසන පව් හතරකි. බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස්වචන කීමයි. කයෙන් කරන පව් තුනකි. එනම් සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීමයි. කුසල් යනු සිතේ ඇතිවන යහපත් සිතිවිලි වන කරුණාව, මෛත්‍රිය, දයාව, පරාර්ථකාමී සිතිවිලි වැනි සිතිවිලියි. අකුසල් යනු සිතින් සිතන සිතේ ඇතිවන නරක සිතිවිලි වන තණ්හාව, ඊර්ෂ්‍යාව, ක්‍රෝධ, වෛර ආත්මාර්ථකාමී සිතිවිලි වැනි සිතේ ඇතිවන නරක සිතිවිලියි. සිතින් කිසිම විටෙක කිසිම කෙනෙකුට පින් හෝ පව් කිරීමට නොහැක. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දේශනා කර ඇති පින් හත හෝ පව් හත අනුව කිසිම පවක් හෝ පිනක් සිතින් කිරීමට නොහැක. එහෙත් සිතින් පින් පව් කිරීමට සිතිය හැකිය. එහෙත් සිතින් පින් පව් කිරීමට නොහැක. කය හා වචනින් කිසිවෙකුටත් කුසල් අකුසල් කිරීමට නොහැක. කරුණාව, මෛත්‍රිය, දයාව පරාර්ථකාමී සිතිවිලි වන කුසල් කයට හා වචනයට ඇති කර ගැනීමට නොහැකිය. එසේම තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධය, වෛර හෝ ආත්මාර්ථකාමී සිතිවිලි වන අකුසල් කයට හා වචනයට ඇති කරගැනීමට නොහැක. කය හා වචනින් කළ හැක්කේ පින් පව් පමණි. සිතින් කළහැක්කේ කුසල් අකුසල් පමණි. දැන්වත් ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කර නිවන් මඟ අවබෝධ කර ගැනීමට බලනු මැනවි.

**මෙය දැන්වීමකට වඩා පින්-පව්, කුසල්-අකුසල් ගැන දැනගැනීමට සලස්වන දහම් පණිවිඩයකි.**

**ත්‍රිපිටකය හැදෑරීමට ඒ. පී. ද. සොයිසා මහතා සරල බසට නැඟූ ත්‍රිපිටකය කියවන්න.**

- පින් සහ පව් කුසල් සහ අකුසල් - 120/-
- පින සහ කුසලය දෙකක්ද? එකක්ද? - 200/-
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය - 350/-
- බැමිණිතියා මහා සාගතය දැනගැනීමට ඉතිහාසය පිළිබඳ ගෞරව ශාස්ත්‍රවේදී රාජකීය පණ්ඩිත කවුඩාගම්මන රතනසාර හිමි ලියන ලද පොත - 550/-
- චිත්ත නියාම ධර්ම - 125/-
- සිතිවිලි සහ සිතින් සිතීම - 150/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය සහ වචනින් පින් පව් - 100/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම - 125/-
- කය වචන දෙකින් පින් - පව්, සිතින් කුසල් - අකුසල් 250/-
- සිතෙහි සතුට ඇතිකර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න - 125/-
- සිත මනස සහ ආගම 80/-
- පංච උපාදානස්කන්ධය 250/-
- සිත ගැන දැනගන්න - 125/-

**සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**
**661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකථන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187**

# ශ්‍රේෂ්ඨත්වයේ ආරම්භය අප්‍රමාදී බවයි



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

**'ගමන දුරයි හෙමින් යන්න' මෙය අජාන්වා හිමියන්ගේ සඳහනකි. මේ තුළ අපට කියාදෙන පාඩම අප්‍රමාදී වීමයි. තථාගත ශ්‍රාවකයෙක් හැටියට උන්වහන්සේ අප්‍රමාදී ගුණයට තම ජීවිතය තුළ වටිනාකම් ලබා දුන්හ. එහි ආස්වාදය විඳි උන්වහන්සේ මුළු මහත් සමාජයට කියා සිටින්නේ අප්‍රමාදී වන ලෙසයි.**

සංයුත්ත නිකායේ අප්පමාද සූත්‍රයේ දී කොසොල් රජු අප්පමාදය පිළිබඳ තථාගතයන් වහන්සේගෙන් මෙසේ විමසුවේ.

"තථාගතයන් වහන්ස, මෙලොව පරලොව අභිවෘද්ධියට හේතුවන එක් දෙයක් දේශනා කරන්න" යනුවෙනි.

බුදුරදුන් එහිදී පුද්ගලයාගේ දියුණුවට හේතුවන කරුණු ලෙස දේශනා කළේ අප්‍රමාදී වීමයි.

වනයෙහි ඇත් පාදය තුළ ඕනෑම සත්ව පාදයක් තැබිය හැකි වන්නේ යම් සේ ද ඕනෑම දියුණුවකට අවශ්‍ය ගුණය අප්‍රමාදී වීමයි. මෙහිදී තවදුරටත් භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනුයේ ආයුෂ, නිරෝගී බව, ලස්සන, සැපයෙන් අග්‍ර බව, උසස් කුලයන්හි ඉපදීම ඇතුළු කුඩුමහත් උදාර සම්පත්තීන් පතන්නා අප්පමාදය පුරුදු කළ යුතු බව ය. බාල, තරුණ, මහලු සියල්ලෝ ම මෙලොව මෙන්ම සසර ම ඉහත දැක්වූ වරප්‍රසාද ලබා ගැනීමට නම් අප්‍රමාදීව සියලු කටයුතු මෙහෙයවීම අවශ්‍ය බවය.

එසේම තථාගතයන් වහන්සේ දේශනා කරනුයේ ප්‍රමාද වූ අප සියලු දෙනාගේ මිත්‍රයා මාරයා බවයි. සසර ගමන කෙටි කරගෙන නිවන් අවබෝධ කරගනු කැමති සියල්ලෝ ම අප්‍රමාදී බව පුරුදු කළ යුතු ම ය. තථාගත දේශනාවේ අප්පමාදය ලෙස විස්තර කරනුයේ එළඹසිටි සිහිය ඇති බවයි. මෙහිදී එළඹසිටි සිහිය ලෙස දක්වන්නේ වර්තමානයේ නිසි අවබෝධයෙන් කටයුතු කිරීම ය. එය තවත් ආකාරයකින් දක්වන්නේ නම් යෝනිසෝ මනසිකාරය, සති සම්පජඤ්ඤය (සිහිය සහ බුද්ධිය) මේ මොහොත ලෙස විස්තර කොට ගත හැකි ය.

ප්‍රමාදයට පත්වන්නේ අතීතයේ හෝ අනාගතයේ ජීවත් වීම නිසයි. එළඹි වර්තමානයේ ජීවත් වන්නේ නම්, ප්‍රමාදයට පත් නොවේ. මෙම සිහිය දහම තුළ ගෝචරසීමාව, පිය උරුමය ලෙස ද විස්තර වේ.

ගෝචර සීමාව නොදත් බව බොහෝ ගැටලුවලට මූලයකි. ඒ මත ප්‍රමාදය හටගනී. පසුගිය කාලයෙහි සීදුව ප්‍රදේශය තුළ සිදුවූ භික්ෂු ඝාතනය එවැන්නකි.

තරුණ හිමියන් සහ ගුරු හිමියන් තම තමන්ගේ ගෝචර සීමා හඳුනා නොගැනීම කෙනකු සිරගත වීම හා තව කෙනකුට ජීවිතය අහිමිවීමට බලපෑහ. මෙයින් පැහැදිලි වන්නේ ප්‍රමාදයෙහි ආදීනව ගිහියන්ට පමණක් නොව භික්ෂුවට ද සමාන බව ය.

මෑත ඉතිහාසය තුළ ප්‍රමාද වූ බොහෝ දෙනකු ගේ සෝචනීය ඉරණම් අපි අත්වින්දෙමු. එහෙයින් එළඹසිටි සිහිය තුළ කටයුතු කිරීම තමන්ගේ ජීවිත දේපළ පවා ආරක්ෂා වීමට හේතුවේ. සකුණග්ගි සූත්‍රයේ ද කැටකුරුල්ලාගේ ජීවිතය අවසානයේ දී ආරක්ෂා වූයේ පිය උරුමය හෙවත් සිහිය මත කටයුතු කිරීම මත ය.

බුදුරදුන්ගේ අවසාන බුද්ධ වචනය වූයේ ද " සියලු සංස්කාර ධර්ම අනිත්‍යයයි . එහෙයින් නොපමාව කුසල් සම්පාදනය කර ගන්න" යනුවෙනි.

එය තථාගත වචනයෙන් ම සඳහන් කළේ 'අප්පමාදේන සම්පාදේථ" වශයෙනි.

අවශ්‍ය කුසල් වඩන්න අප්‍රමාදිවීම, සදාචාරවත් ජීවිතයක් ගත කරන්න අප්‍රමාදිවීම , පංචශීලය ආරක්ෂා කිරීමට අප්‍රමාදීවීම, සරලවම දැන්වුවහොත් පිනට ලැබිච්ච ජීවිතය පවට නැඹුරු නොකිරීමට අප්‍රමාදීවීමයි.

අපායේ භයංකාරත්වය, සසර දුක්ඛයාගේ විශාලත්වය නුවණින් හඳුනා ගන්නා පුද්ගලයා කායික මානසික සුවය ඇති කල්හි සසර අවශ්‍ය මඟ වියදම් සකසා ගත යුතු වේ. එතැන දී උකටලී නොවීම අප්‍රමාදයයි. අප්‍රමාදී බව වඩාත් අර්ථවත් වන්නේ සත්තිස්බෝධිපාක්ෂික ධර්ම වැඩීමේදී ය.

විශේෂයෙන් බෞද්ධයකුගේ නිෂ්ඨාව නිවනයි. ඒ වෙනුවෙන් දියුණු කළ යුතු ගුණ ධර්ම බෝධි පාක්ෂික ධර්මයන් ය.

අප්‍රමාදී බව සියල්ලන්ගේ ම ප්‍රශංසාවට ලක්වන අතර, ප්‍රමාදය ගැරහීමට පත්වේ.

අප්පමාදං පසන්සන්ති පමාදො ගරහිතෝ සදා" වර්තමාන තරුණ පරම්පරාවට මේ වෙනුවෙන් හඳුනාගත හැකි ප්‍රධාන චරිතය කුම්භඝෝෂක චරිතයයි. ධම්මපදයේ අප්පමාද වර්ගය තුළ දැක්වෙන "උට්ඨානවතෝ සතිමතෝ" යන ගාථාව දේශනා වෙන්නේ ඔහු අරභයා ය.

බුදුරදුන් ඔහුගේ අප්‍රමාද බව ප්‍රශංසාවට ලක්කර එවැනි ගුණ සහිත අයගේ යසස වැඩෙන බව දේශනා කළහ. උත්සාහයෙන්, සිහියෙන්, යහපත් කර්මාන්ත සිදුකරන අය, සංයමයෙන් කටයුතු කිරීම තුළ අප්‍රමාදීව කීර්තිය හෙවත් යසස වැඩෙනවාට කැමැති අය සිහිය, උත්සාහය මෙන් ම යහපත් කටයුතු සිදුකළ යුතු ම ය.

එසේ නොවන ඕනෑම කෙනකුගේ කීර්තිය ඉතා තාවකාලික ය . කම්මැලිකමින්, බොරුවෙන්, සාහසිකකමින් ලබන කීර්තිය ඉතා තාවකාලික ය. එමෙන්ම වැඩ කළ හැකි කාලවල දී එසේ නොකිරීම පසුතැවීම්වලට ද හේතු වේ. 'අචරිත්වා බ්‍රහ්ම චරියං" යන ගාථාව තුළ දැක්වෙන්නේ වැඩ කළ හැකි අවස්ථාවන්වල දී එසේ නොකිරීම පසුතැවීමට හේතුවන බවයි.

නාකි කොස්වා ලිහිණියෙක් වතුර මඩ වලක දැන් දැන් මාළු එතැයි බලා සිටින්නා හා සමානව වයසට ගිය කල පසුතැවේ. සාමාන්‍ය වහරෙහි එය අප දක්වන්නේ මහන්සි විය යුතු කළ හාන්සි වුණාම හාන්සි විය යුතු කළ මහන්සි විය යුතු වේ යනුවෙනි.

ශක්‍රයා ශ්‍රේෂ්ඨත්වයට පත්වූයේ අප්‍රමාදී බව මත ම ය.

"අප්පමාදේන මඝවා දේවානං සෙට්ඨතං ගතො" සසර භවය තුළම සක්‍රයා අප්‍රමාදී වූ අතර, සක්‍ර සැපය තුළ පවා අනාගාමී වූහ. තථාගතයන් වහන්සේගෙන් බණ අසා සක්‍රයා සඳහන් කරන්නේ තමනට දහම් ඇස පහළ වූ බවත්, අවසාන ආත්මය අකනිට්ඨා බ්‍රහ්ම ලෝකයෙහි උපදින බවත් ය. අකනිට්ඨාව ඇතුළු සුද්ධාවාසවල උපදින්නේ අනාගාමී වූ පිරිස් ය.

> ප්‍රමාදයට පත්වන්නේ අතීතයේ හෝ අනාගතයේ ජීවත් වීම නිසයි. එළඹි වර්තමානයේ ජීවත් වන්නේ නම්, ප්‍රමාදයට පත් නොවේ. මෙම සිහිය දහම තුළ ගෝචරසීමාව, පිය උරුමය ලෙස ද විස්තර වේ.

එමෙන්ම වාසව, පුරින්දද යන ගෞරව නාම ලැබුණේ අප්‍රමාදීවීම නිසා ය. වාසස්ථාන සකසා දීම, මුලින්ම දන්දීම එතුමාගේ චර්යාව විය. ලෞකික අග්‍රඵලයන් ලැබීමට අප්‍රමාදය හේතු විය. කුසීතකම මත ප්‍රමාද වූ තැනැත්තා දහම තුළ හඳුන්වන්නේ බාලයා ලෙසෙනි. දෙව්දත් තෙරුන්, මාගන්දිය වැන්නවුන් ඒ අරුතින් බාලයන් විය. තමන් සමඟ පැවිදි වූ ආනන්ද, භගු , කිම්බිල, අනුරුද්ධ, උපාලි වැනි හිමිවරුන්ට අප්‍රමාදීව නිවන් සුවය විඳින්නට ලැබුණ ද දෙව්දතුන් අවීචියෙහි බවකීල දුක උරුම කර ගත්හ.

සුභ සූත්‍රයට අනුව ද ප්‍රමාද වූ තැනැත්තා පංච නීවරණවල ගොදුරක් බවට පත් වන බව දේශනා කළහ.

අප්‍රමාදී වීමට ඇති ප්‍රධාන බාධා රාශියකි. ලෝභය, ද්වේෂය, මෝහය, මාන්නය, ධනය, කුලය, අලසකම ඒ අතර ප්‍රධාන වේ.

ලෝභයෙන් යුතු තැනැත්තා අනෙක් සියලු දේ පසෙක ලා ලෝභය, පිරිමසා ගැනීමට පෙළඹේ. එහිදී ඔහුගේ සිහිකල්පනාව ඒ මත රැඳේ. ඒ වෙනුවෙන් බොහෝ දුරාචාර සිදුකරයි. තමන්ට ද ලැබුණ බලය දැනුම පවා අවභාවිතකිරීමට පෙළඹේ. මේ සියල්ල තුළම සිදුවන්නේ ප්‍රමාදයකි. අනෙක් කාරණා ද එසේ ම ය.

බෝසතාණන් වහන්සේ වීර්යය වැනි පාරමිතා පුරමින් සසර අප්‍රමාදවීම මත උතුම් සත්‍ය අවබෝධ කොට ගෙන ලෝක සත්වයා ද දුකින් මුදවීමට කටයුතු කළහ. ඒ අප්‍රමාදී ගුණය නිසා ය.



**මීගමුව ආසන්නයේ හිමි නමක් සතු පර්චස් 32 ඉඩම විකිණීමට**

ආශ්‍රමයක්, වැඩිහිටි නිවාසයක්, නිවසක් සඳහා සුදුසුයි.

**0777-820389**

**(O+) පොසිටිව් වර්ගයේ වකුගඩුවක් ඕනෑකර තිබේ**

වයස 36 ක පිරිමි පුද්ගලයෙකු සඳහා වකුගඩුවක් පරිත්‍යාග කළහැකි දයකයෙක් සිටිනම් අමතන්න.

**0774300028**
**0712725969**

**බෞද්ධ විශ්‍රාමිකයින්ට විවේකාශ්‍රමයක්**

ජීවිතයේ අවසානය දක්වා බණ දහමෙහි යෙදෙමින් දැහැමි දිවියක් ගතකිරීමට වැඩිහිටි නිවාසයක් "නොවන" සියලු පහසුකම් සමග ඇතුළත නාන කාමරය සහිත තනි කාමර ඇත.

**ලේකම්තුමිය**

071-8064204,
071-5310800

## සිල් මාතාවන්

**උගත් ධර්මාවබෝධය ඇති දස සිල් මෙහෙණින් වහන්සේලා දෙනමකට සියලු පහසුකම් සහිතව වැඩ විසීමට ඉඩ ඇත.**

***කුණ්ඩගල සේනාසනය,***
**තෙලඹියාව,**
**නිකදළුපොත.**

078-7799606

**ආරාමයක් සඳහා නිවසක් අවශ්‍යයි**

පිරිවෙනේ ඉගෙනුම් ලබන

**පොඩි සාමනේර මෑණිවරු හය නමකට**

වැඩ සිටීමට

**නිවසක්**

(ඕනෑම ප්‍රදේශයකින්)

පූජා කිරීමට කැමති පිංවතෙක් අමතන්න.

0752679823, 0742544464

**පැවිදිවීමට කැමති ඔබට අවස්ථාවක් බාල, තරුණ, වැඩිහිටි සැමට මහණ වීමට ආරාධනා. බලගල්ල සරස්වතී මහ පිරිවෙන.**

**විමසීම් : 077-4498975**

## පිංවතුනි

74 වියැති විහාරවාසී හිමිනමක් වන මා පදිංචි කුටිය කැඩී ගොස් ඇත. එය අලුත් වැඩියාකර ගැනීමට සහ අසනීපයෙන් පසුවන මට බෙහෙත් ලබා ගැනීමටත්, 75 වෙනි උපන් දිනය සමරා පිංකමක් කිරීමටත්, අදහස් කර සිටින බැවින්, එයට ලක්ෂයක පමණ මුදලක් වියදම් වෙයි. එම මුදල පරිත්‍යාග කිරීමට හැකි පිංවතෙකු පහත අංකයට කථා කරන මෙන් කරුණාවෙන් ඉල්ලමි. තෙරුවන් සරණයි.

**0766183305**

## භාවනායෝගී භික්ෂුවකට උවටැන්කරමින් තමාටත් දහම් මග වැඩීමට අවස්ථාවක්

**සුදුසුකම් -** වයස 30 – 50 අතර
ආහාර පිසගැනීමේ හැකියාව
අධ්‍යාපනික සුදුසුකම්
සැලකේ

*වැටුප කතාකරගත හැක.*

**විමසීම් :**

**කුමාර - 071-9006658**

## "විනයෝ නාම සාසනස්ස ආයු"
### (විනය නම් සාසනයේ ආයුෂයි)

- අප බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ විනයටම සම්පාදිත පහලොස්කඩ ගැබ චීවරයක් 2022 මෙවර කඨිනය උදෙසා පූජා කිරීමට උතුම්ම අවස්ථාවක්.
- අප බුදුරජාණන් වහන්සේ චීවර විසිහයක් (26) තම ශ්‍රාවක භික්ෂූන්ට අනුදැන වදාළහ.
- මෙම චීවර 26 අතරින් බුදුන් පරිභෝජනය කළ චීවරය පහලොස්කඩ ගැබ චීවරයකි. එය සුගත චීවරයක් නම් වේ.
- මෙම පහලොස්කඩ ගැබ චීවර සීමිත සංඛ්‍යාවක් අප සකසා ඇත.
- බුදුන් වහන්සේ අනුදැන වදාළ චීවරයක තිබිය යුතුම දිග / පළල / ගැබ / කඩ / නුවාව / ගණ්ඨිය / ගණ්ඨිපායාසය / ගීවේය්‍ය / ජඞගෙය්‍ය යන නවාංගයෙන් යුක්ත මෙම චීවරය විනයානු කූල බව අප සහතික කරමු.
- මෙම චීවරයක බර 900 g පමන වේ.
- දහස්කඩ / පන්සියකඩ / දෙසිය පනස් කඩ / අඩි චීවර බුදුන් අනුදැන වදාළ නොවන බව කනගාටුවෙන් සහ සාසණාලයෙන් දන්වමු.

**සියලුම විමසීම් :**

**0762111438 / 0726138881**

**භාවනානුයෝගීව වැඩ වසන තෙර නමකට දානය සකසා දීමට හැකි නිරෝගී උපස්ථායකයෙක් අවශ්‍යයි.**

**දීමනාවක් දෙනු ලැබේ. රියදුරු පුහුණුව ඇත්නම් වඩාත් හොඳයි.**

**077-5204573**

**විස්සෙන් පහළ ළමයෙක් පන්සලට අවශ්‍යයි**

මාසික වැටුප,
කෑම බීම, ඉඳුම් හිටුම් සමග
රු. 12,000
ඒවා නැතිව රු. 20,000

**074 3153366**

**බුද්ධ ප්‍රතිමා / දේව ප්‍රතිමා / චිත්‍ර, මියුරල් උද්‍යාන අලංකරණය, පුද්ගල ප්‍රතිමා ඇතුළු සියලු කලා කටයුතු (කලාභූෂණ, කලාකීර්ති, කලා මාන්‍ය දේශබන්දු) චන්දන ශාන්ත.**

T.P. 077-5888992

## පියල් භාරත සංචාරකයෝ

චෙන්නායි / සාංචි/ සද්ධාරා /
දඹදිව නේපාල ලුම්බිණි නේපාල කපිල වස්තු ඇතුළු

### අංග සම්පූර්ණ වන්දනා චාරිකාව

**රාත්‍රී 14 දින 15**

**සම්පූර්ණ අයකිරීම රු. 215,000/-**



සංවිධායක
පියල් ජයතිලක

කොළඹ - චෙන්නායි / දිල්ලි - කොළඹ
සෘජු ගුවන් සේවා මගින්
(ශ්‍රී ලංකන් / ඉන්දියන් එයාර්)
මිල අඩු බජට් එයාර් භාවිතා නොකරයි.
චෙන්නායි/බෝපාල්/කාන්පූර්
(සාංචි/සද්ධාරා යාම සඳහා
AC සුඛෝපබෝගී
නිදන ඇඳන් සහිත
ඉතා ඉහළ පහසුකම්
වලින් සමන්විත
දුම්රිය පහසුකම්
කෙටි ගමන් සඳහා)

චාරිකාව දිල්ලියෙන් අවසන් කර සෘජු ගුවන් මගින් කොළඹට පැමිණෙනු ඇත

සංවිධායකවරයා සෑම චාරිකාවකටම සහභාගී වන අතර, මුළු චාරිකාව පුරාවටම ඉන්දිය පළපුරුදු වෛද්‍යවරයෙකුගේ පූර්ණ රැකවරණය

**නොමිලේ**

**නව කාර්යාලය :**
5ඒ, 1 වන පටුමග, පිංවත්ත දුම්රියපොළ පාර, පිංවත්ත, පානදුර.
: 0777-889686 : piyalbt@yahoo.com

ඩුබායි / සිංගප්පූරු - මාලදිවයින් චාරිකා සඳහා විමසන්න

## දයාභාරත දඹදිව චාරිකා - මොරටුව

### ඉන්දියාව, නේපාලය, තායිලන්තය, බුරුම, සිංගප්පූරුව, මැලේසියාව, වියට්නාමය, ඩුබායි

**චාරිකා පිටත්වීම**

2022 සැප්තැම්බර්, ඔක්තෝම්බර්

**වන්දනා කරන ස්ථාන**

**බුද්ධගයාව, බරණැස, රජගහනුවර, විශාලාමහනුවර, කුසිනාරානුවර, ලුම්බිණිය, කපිලවස්තු, සැවැත්නුවර සංකස්ස, දිල්ලි ඇතුළු අනු ස්ථාන 100 වැඩි ප්‍රමාණයක් වන්දනා කෙරේ. දුම්රියේ ගමන් නැත**

→ දින 12 චාරිකාව රු. 225,000.00
→ තායිලන්තය පිටත්වීම 2022 නොවැම්බර්
→ 2022 ඔක්තෝම්බර් බුද්ධගයා කඨිනයට සහභාගී වීම
→ 2022 නොවැම්බර් 4 බරණැස නව මූලගන්ධකුටි විහාරයේදී අති පූජනීය බලංගොඩ රාධ ස්වාමීන් වහන්සේ විසින් පවත්වන සර්ව රාත්‍රික භාවනාමය බුදු ගුණ දේශනාව
→ 2022 නොවැම්බර් 3 මහා පහන් ආලෝක පූජාව
→ සීමිත සංඛ්‍යාවක් සහභාගි වන බැවින් ආසන කාලවේලා ඇතිව වෙන් කර ගන්න

**වැඩි විස්තර සඳහා,**

**ප්‍රධාන සංවිධායිකා : එම්. චන්දිමාලි ප්‍රනාන්දු**

072 2803454 / 075 6343377 / 071 0632025
011 2657222 / 077 7425726 / 077 7307851
බී. උදාර - 075-4068100

**නො. 14/4A, මෝසස් පටුමග, කටුකුරුන්ද, මොරටුව.**

# මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ප්‍රධාන ලේඛකාධිකාරී පදවියෙන් පිදුම් ලද

## ආචාර්ය පහමුණේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ



ඓතිහාසික සෝමවතී රාජමහා විහාරාධිපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශයේ වැඩබැලූ අංශාධිපති, මල්වතු මහාවිහාර පාර්ශ්වයේ නියෝජ්‍ය සහ වැඩබලන ලේඛකාධිකාරී ආචාර්ය පහමුණේ ධර්මකීර්ති ශ්‍රී සරණංකර සුමංගල නාහිමිපාණන් වහන්සේ වල්ගොව්වාගොඩ ශ්‍රී මේධංකර විමලබුද්ධි නාහිමිපාණන් වහන්සේ අපවත් වීමෙන් පුරප්පාඩු වූ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ප්‍රධාන ලේඛකාධිකාරී පදවිය සඳහා අගෝස්තු මස හය වැනි දින අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පත් කොට වදාළ සේක.

මල්වතු මහා විහාරීය විංශත්වර්ගික කාරක මහා සංඝ සභාවේ ලේඛකාධිකාරී පදවිය අතිපූජ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා සංඝ සභාව වෙත ලැබෙන සියලු ලිපිලේඛන ගරුතර කාරක මහා සංඝ සභාව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගෙන ඒ අනුව ක්‍රියා කිරීම, රාජ්‍ය හා අධිකරණ කටයුතුවල දී මල්වතු විහාරය නියෝජනය කිරීම, වාර්ෂිකව තුන්සිය නමකට වැඩි ප්‍රමාණයක් සාමණේර හිමිවරුන් උපසම්පදාවට පමුණුවන මල්වතු මහා විහාරයේ උපසම්පදා පුජෝත්සවය සංවිධානය කිරීම හා ලිපිලේඛන සම්පාදනය, නායක පදවි හා විහාරාධිපති පදවි සංඝ සභාවේ අනුමැතිය පරිදි පිරිනැමීම, සංඝසභා රැස්වීම් පැවැත්වීම ඇතුළු භාරධූර වගකීම් සමුදායක් පැවරී ඇති තනතුරකි.

පහමුණේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ වර්ෂ 1954 අප්‍රේල් මස 25 වැනි දින සත් කෝරළයේ පහමුණේ ග්‍රාමවරයේ දී වෙලේගම මුදියන්සේලාගේ රම්බණ්ඩාර මැතිතුමාගේ සහ තල්ගොඩපිටියේ කුලතුංග මුදියන්සේලාගේ සෝමවති මැතිණියගේ දරුවන් සය දෙනා අතුරින් ජ්‍යෙෂ්ඨ පුත් රුවන ලෙස ජන්මලාභය ලබා ඉබ්බාගමුව ප්‍රාථමික විද්‍යාලයෙන් සහ මධ්‍ය විද්‍යාලයෙන් අධ්‍යාපන කටයුතු සිදු කළහ.

බෝධිසත්ව ගුණෝපේත වැලිවිට පිණ්ඩපාතික අසරණසරණ සරණංකර සංඝ රාජයන් වහන්සේගේ සහ අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහා නායක මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍ය ඊරියගොල්ලේ ශ්‍රී මහා විපස්සි නාහිමි, පහමුණේ ශ්‍රී සුමංගල මහ නාහිමි වැනි සම්භාවනීය යතිවරුන් වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට අයත් රාජකීය පණ්ඩිත පහමුණේ ශ්‍රී ගුණානන්ද අනුනාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1968 මැයි මස 08 වන දින ප්‍රව්‍රජ්‍යා සම්පත් ලබා යථෝක්ත අනුනාහිමිපාණන් වහන්සේ, සියඹලන්ගමුවේ ශ්‍රී ධම්මක්ඛන්ධ නාහිමි සහ උපාධ්‍යාය උඩුගොඩ ශ්‍රී පේමානන්ද නාහිමි යන ආචාර්යයන් වහන්සේලාගේ ශිෂ්‍යභාවයෙන් 1974 ජුනි මස 12 වෙනි දින වාහලනාග නාමයෙන් අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදා ශීලයට පත් වූහ.

මහනුවර මල්වතු මහා විහාරීය සංඝරාජ පිරිවෙණින් ප්‍රාචීන අධ්‍යාපනය නිමවා 1975/76 අධ්‍යයන වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ නාහිමිපාණන් වහන්සේ පාලි, සංස්කෘත සහ වාග්විද්‍යා විෂයයන්ගෙන් අධ්‍යාපන කටයුතු ආරම්භ කළ අතර, තෙල්වත්තේ ශ්‍රී රාහුල හිමියන් විසින් පිහිටුවා තිබූ මේධා ශ්‍රී ආර්යවංශ මාහිමි සිහිවටන ශිෂ්‍යත්වය දිනා ගනිමින් සංස්කෘත භාෂාව පිළිබඳ විශේෂවේදී උපාධිය ලබා ගත්හ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා තදනුබද්ධ දුම්බර මණ්ඩපයෙහි සංස්කෘත භාෂාව පිළිබඳ කථිකාචාර්ය පදවියක් හොබවන ලද නාහිමිපාණන් වහන්සේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශයෙහි සංස්කෘත විෂයය ඉගැන්වීම් ආරම්භ කිරීමට පුරෝගාමී වූහ.

සඟරජවත සංස්කරණය, වුත්තමාලා ව්‍යාඛ්‍යා, සදහම් කැඩපත, බුදුරැස් විහිදෙන සෝමවතිය, හිතෝපදේශ අභිනව ව්‍යාඛ්‍යාව (මිත්‍රලාභ කථා සංග්‍රහය), සංස්කෘත ද්විතියාදර්ශ ශ්‍රී සුමංගල අභිනව ව්‍යාඛ්‍යාව, ඇතුළු ග්‍රන්ථ සමුදායක් නාහිමිපාණන් වහන්සේ අතින් සකස් වී ඇත.


1979 වර්ෂයේ දී මල්වතු මහා විහාරයේ කර්මවාචාචාර්යයන් වහන්සේ නමක ලෙස ද 1982 වසරේ දී සිරිමල්වත්තේ ශ්‍රී ආනන්ද මහ නාහිමියන් විසින් මල්වතු පාර්ශ්වයේ කාරක සභික පදවියක් සඳහා පහමුණේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ පත් කරන ලද අතර, පහමුණේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ මල්වතු මහා විහාරීය විංශත්වර්ගික කාරක සංඝසභාවේ ධුර කාලය දෙවෙනි වන්නේ වර්තමාන අතිගෞරවාර්හ මහ නාහිමිපාණන් වහන්සේට පමණි. 2009 මැයි 08 වන දින දිඹුල්කුඹුරේ ශ්‍රී විමලධම්ම නාහිමියන් අනුනායක පදවියට පත් වීමෙන් පුරප්පාඩු වූ නියෝජ්‍ය ලේඛකාධිකාරී පදවියට හා වල්ගොව්වාගොඩ ශ්‍රී විමලබුද්ධි නාහිමියන් ගිලන්භාවයට පත් වීමෙන් පසු වැඩබලන ලේඛකාධිකාරී හිමියන් වශයෙන් පහමුණේ ශ්‍රී සුමංගල නාහිමියන් පත්වීම් ලැබූහ .

කෙතරම් කාර්යබහුල ජීවිතයක් ගත කළ ද තමන් වහන්සේ හමුවට පැමිණෙන කා හටත් අනතිමානී ගුණයෙන්, සුහදශීලීව වත සරසා ගත් මඳ සිනහවෙන් හා කාරුණික ප්‍රිය වදනින් සලකා කටයුතු කරන පහමුණේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ හට ලෝක ශාසනික සංග්‍රහයෙහි යෙදීම පිණිස ආයු ආරෝග්‍යාදී සම්පත් සකලාභිවෘද්ධිසාධනය වේවා'යි ප්‍රාර්ථනා කොට සිටිමු.

✍ දිමුතු පුන්සර කොළඹගේ

# දිවි මගේ හැටහත් වන වියට පා තබන

## බද්දේගම සිරිරතන නා හිමි



දකුණු ලක ගාලු පුරවරයේ ගිංගඟ මිටියාවතේ පිහිටි සුන්දර, සරුසාර හැම්මැලිය නම් ගම්පියසෙහි සම්භාවනීය කුල පරපුරක නානායක්කාර ආගරගේ හෙන්ද්‍රික් හා ඩැසී සුරිආරච්චි මවුපිය දෙපළට දාව 1955 ඔක්තෝබර් 16 දින උපන් පින්වත් කුමරු නානායක්කාර ආගරගේ රතනසිරි නම් විය.

සොළොස් හැවිරිදි වියේ දී බද්දේගම සිරිරතන නමින් පූජ්‍ය බද්දේගම ප්‍රඥාසාර හා විද්‍යෝදය මහ පිරිවෙන්පති ධුරය හෙබ වූ රාජකීය පණ්ඩිත, මහෝපාධ්‍යාය, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය පූජ්‍ය අකුරැටියේ අමරවංශ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් ප්‍රව්‍රජ්‍යා භූමියට පත් කළහ. විසි වයස් ගතවත් ම වර්ෂ 1975 මැයි 30 දින උන්වහන්සේගේ ම ආචාර්යත්වයෙන් මහනුවර මල්වතු මහා විහාරීය රාජකීය මංගල උපෝසථාගාරයේ දී උපසම්පදාවට පත් කළහ.

ප්‍රාථමික අධ්‍යාපනය සඳහා හික්කඩුව නාලාගස්දෙණිය ශ්‍රී සෝරත පිරිවෙණටත්, වර්ෂ 1975 වර්ෂයේ දී උසස් අධ්‍යාපනය සඳහා මාළිගාකන්ද විද්‍යෝදය පිරිවෙණටත් ඇතුළු වූ බද්දේගම සිරිරතන හිමිපාණෝ ඉතා දක්ෂ ලෙස අධ්‍යාපන කටයුතුවල යෙදුණහ. 1981 සැප්තැම්බර් මස 08 වැනි දින තම ගුරු දේවයන් වහන්සේ අපවත්වීමෙන් අනතුරුව ස්වකීය විහාරස්ථානයේ අධිපතිත්වය භාර ගැනීමට සිරිරතන හිමිපාණන්ට සිදු විය.

ඉතා ක්‍රියාශීලී දක්ෂ තරුණ භික්ෂුන් වහන්සේනමක් වූ සිරිරතන ස්වාමීන් වහන්සේ තම විහාරස්ථානයේ විහාරාංග වැඩිදියුණු කරමින් හා ප්‍රතිසංස්කරණය කරමින් නව ආලෝකයක් එක් කිරීමට සමත්ව සිටිති.

පූජ්‍ය සිරිරතන ස්වාමීන් වහන්සේ සිදුකරන ජාතික ආගමික සේවාවන් අතර ඉතා උත්කෘෂ්ඨ සේවාව ලෙස කැපීපෙනෙනුයේ තම ගුරු දේවයන් වහන්සේට උපහාර පිණිස ශාසනයට අවැසි සිල්වත් ගුණවත් භික්ෂු පිරිසක් බිහි කිරීම සඳහා ශ්‍රී අමරවංශ නමින් පිරිවෙණක් ආරම්භ කිරීමයි. අද මෙම පිරිවෙණ සියයකට ආසන්න පැවිදි ශිෂ්‍ය පිරිසකට ශාස්ත්‍රාලෝකය ලබා දෙන ගාලු දිස්ත්‍රික්කයේ ප්‍රධාන පහන් ටැඹක් බවට පත්වී ඇත. කීමෙහි හා බිණීමෙහි දක්ෂ වූ උන්වහන්සේ පිරිත් දේශනා ආදී ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා ජපානය, අමෙරිකාව, කොරියාව, චීනය, ඉන්දුනීසියාව, තායිවානය, මැලේසියාව, සිංගප්පූරුව ආදී බොහෝ රටවලට වැඩමකරවීමට උන්වහන්සේ සමත්ව සිටිති.

තව ද අනාගතයේ ශාසනය බැබළවිය හැකි උගත්, දක්ෂ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ පහළොස් නමකට වැඩි පිරිසක් බිහි කිරීම උන්වහන්සේ සිදු කළ විශිෂ්ට ශාසනික සේවාවන් අතර ප්‍රමුඛස්ථානය ගනිති.

පූජ්‍ය බද්දේගම සිරිරතන ස්වාමීන් වහන්සේ ශාසනානුලෝමී ගුණයෙන් හෙබි අල්පේච්ඡ, චාම්, සරල දිවිපෙවෙතකින් යුක්තය. එසේම සිල්වත් හා ගුණවත් බවින් යුක්ත වූ උන්වහන්සේ ගිහි පැවිදි සැම දෙනාගේ ම ප්‍රසාදය දිනා ගැනීමට සමත්ව සිටිති. ප්‍රදේශයේ සිදුකෙරන ජාතික ආගමික සාමාජික කාර්යයන්හි දී අනුශාසකත්වය ගෙන කටයුතු කරන උන්වහන්සේ විශේෂයෙන් බද්දේගම සුහද භික්ෂු සංසදයේ වර්තමාන අනුශාසක ධුරය හොබවමින් ප්‍රදේශයේ මහා සංඝරත්නයට ලබා දෙන නායකත්වය ප්‍රශංසනීය යය. උන්වන්සේගේ ශාසනික සේවාව අගය කළ මල්වතු මහා විහාරීය අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන සානුනායක කාරක මහා සංඝ සභාව උන්වහන්සේ වෙත 'විනය කීර්ති ශ්‍රී විචිත්‍ර භාණක' යන ගෞරව නාමය සහිතව කර්මාචාර්ය පදවියක් ද, 'විනය කීර්ති ශ්‍රී ප්‍රඥාසාර' යන ගෞරව නාමය සහිතව ගාලු පළාතේ උපප්‍රධාන සංඝනායක පදවිය ද පිරිනමා ඇත.

පූජ්‍ය බද්දේගම සිරිරතන නායක ස්වාමීන් වහන්සේගේ හැටහත් වන ජන්ම දිනය මෙම මස 16 දිනට යෙදී ඇත. ඒ නිමිත්තෙන් විශේෂ පින්කම් රාශියක් සිදුකොට උන්වහන්සේට ආශිර්වාද පළ කිරීමට ශිෂ්‍ය පිරිස හා විහාරස්ථ දායක සභාව කටයුතු සංවිධානය කොට ඇත. මෙම 15 වැනි දින රාත්‍රී ප්‍රදේශවාසී මහා සංඝරත්නයේ සහභාගිත්වයෙන් සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් හා පසුදින (16) දහවල් සඟ සතු දානයක් පිරිනැමීමටත්, කටයුතු සංවිධානය කර ඇත.

සම්බුද්ධ ශාසනය විෂයෙහිත් මුළු මහත් සමාජය විෂයෙහිත් අපමණ සේවාවක් සිදු කරන කිරිබත්ගොඩ සුධර්මාරාමාධිපති ශ්‍රී අමරවංශ මහා පිරිවෙණේ කෘත්‍යාධිකාරී, විනය කීර්ති ශ්‍රී විචිත්‍රභාණක ගාලු පළාතේ උප ප්‍රධාන සංඝ නායක පූජ්‍ය බද්දේගම සිරිරතන නායක ස්වාමීන් වහන්සේට චිරාත් කාලයක් තව දුරටත් සේවය සලසන්නට නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමු.

කොළඹ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ
රාජකීය පණ්ඩිත
බද්දේගම සුහද භික්ෂු සංසදයේ ප්‍රධාන ලේකම්
**වැලිවිටියේ සුජීව හිමි**



# සතුටුවීමේ වගකීම ඔබම බාරගන්න

**යමකු නිරෝගී නම් එය කායික සුවය වන අතර, සිතේ සතුට පවතී නම්, එය මානසික සුවය යි.**

විශ්වසනීය මිනිසුන් අතර ජීවත් විය හැකි නම්, එයින් සාමාජීය සුවය ලැබෙන අතර, කුසල ක්‍රියාවන්හි නිරතවීම තුළ ළඟාකර ගත හැක්කේ ආධ්‍යාත්මික සුවය යි.

ජීවිතයේ මෙතෙක් පැමිණි ගමන් මඟ තුළ ඔබේ අරමුණ වූයේ කුමක් ද? 'සතුටුවීම' යන්න ඔබේ අනිවාර්ය පිළිතුර විය යුතු ය. එහෙත් එය ඔබට ලැබුණේ ද? තාවකාලිකව, කාලානුරූපීව විවිධ අවස්ථාවන්හි සතුටට පත්වුවත්, ඊට එහා ගිය සතුටක් සොයමින් කල් ගත කිරීම එම අරමුණ ඉටුනොවීමට හේතුවයි.

සමාජයේ බොහෝ දෙනකුගේ ජීවිත දුකෙන් බරවීමට ප්‍රමුඛ සාධකය ලෙස තමා සතු දෙයෙහි තෘප්තිමත් නොවීම දැක්විය හැකි ය. මේ පිළිබඳ අන්තර්ගත අපූරු කතා ප්‍රවෘත්තියක් පහත සඳහන් කෙරේ.

තම ජීවිතය පිළිබඳ කලකිරී ගසක අත්තක හඬමින් සිටි එක්තරා කපුටකුගේ කඳුළු, ගස මුල වැඩසිටි භික්ෂුවකගේ කම්මුල මත පතිත විය. හැඬීමට හේතුව මන්දැයි භික්ෂුව විසින් විමසනුයේ තමාව කිසිවකුට ප්‍රිය නොමැති බවත්, දුටු දුටුවන් තමා එළවා දමන බවත්, එබැවින් තමා ඉතා දුකෙන් පසුවන බවත් කපුටා හේතු වශයෙන් දැක්වීය. තව ද, හැකියාව පවතින්නේ නම්, තමාව හංසයකු බවට පත්කරන ලෙසත් හේ ඉල්ලීය.

එයට එකඟ වූ භික්ෂුව සඳහන් කර සිටියේ හංසයකු වෙත ගොස් ඔහු සතුටින් සිටින්නේ දැයි විමසා නැවත පැමිණෙන ලෙසයි. ඒ අනුව කපුටා ඉතා සතුටින් පියාඹා විලක් මැද පීනමින් සිටි හංසයකු වෙත ගොස්

"ඔබ බොහෝ ලස්සන අයෙකි, කිරි මෙන් ඉතා සුදු වූයේ ද වෙයි, ඔබට හැමෝම කැමැතියි, ඒ නිසා ලොව සිටින සතුටුදායක ම කුරුල්ලා ඔබ විය යුතු ය" යනුවෙන් පැවසීය.

එවිට හංසයා

"නැත යහළුව, මා සතුටින් නොවේ, ලොව කොතරම් ලස්සන පාට වර්ග ඇතත්, මට ඇත්තේ කිසි වැඩකට නැති සුදු පාට පමණයි, එහෙත් ගිරවා වර්ණවත් ය, එමනිසා, මා සිතන්නේ ලොව සතුටුදායකම කුරුල්ලා ගිරවා බවයි" යනුවෙන් පැවසීය.

කපුටා එසැණින් ගිරවකු වෙත ගොස් "ඔබ හරිම වර්ණවත් හා ලස්සනයි, ඔබ ලොව සතුටින් සිටින කුරුල්ලා විය යුතු ය" යනුවෙන් කීය.

එවිට ගිරවා "නැත, යහළුව, මා අල්ලා කූඩුකරාවි යන නිරන්තර බියෙන් මම පසුවෙමි, මට නම් සතුටක් නැත,

එහෙත්, ලොව සිටින සතුටුදායී ම කුරුල්ලා මොණරා විය යුතු ය" යනුවෙන් පිළිතුරු දුනි.

ඉක්බිතිව, කපුටා බොහෝ දුර ගෙවා ඉතා අමාරුවෙන් සත්තු වත්තක සිටි මොණරකු වෙත පියෑඹීය.

"ඔබ ඉතා වර්ණවත් ය. දහස් ගණන් මිනිසුන් දිනපතා ඔබ බැලීමට පැමිණේ. නමුත්, මා දිහා බලන්න. මිනිසුන් මා දුටු දුටු තැන එළවනවා. මා කිසිවකු ගණන් නොගනී. හැබැයි ඔබට හොඳ වටිනාකමක් තියෙනවා, එනිසා ලොව වඩාත් සතුටින් ම සිටින කුරුල්ලා ඔබ විය යුතු ය" යනුවෙන් කපුටා පැවසීය.

එවිට මොණරා "මම සිතුවේ මේ මිහිපිට වර්ණවත් ම කුරුල්ලා මා බවට යි, එනමුදු, මගේ ලස්සන නිසා මට මේ සත්තුවත්තක් තුළ සිරවීමට සිදුව තිබේ- මිනිසුන් මාගේ වර්ණවත් පිහාටු සැරසිලි සඳහා උගුලාගන්නා විට, මට එය මහත් වේදනාවකි" යනුවෙන් පවසා දිගු සුසුමක් හෙළමින් දැක්වූයේ තමන් සතුටින් පසුනොවන වගයි.

මෙයින් විශ්මයට පත් කපුටා ලොව සතුටින්ම සිටින කුරුල්ලා කවුරුන් දැයි මොණරාගෙන් විමසීය. එවිට මොණරා

"මම මේ සත්තු වත්තේ සියලුම කුරුල්ලන් පිළිබඳ විමසිල්ලෙන් අධ්‍යයනය කළෙමි. මිනිසුන් කපුටන් අල්ලා කූඩු කිරීමට වෙර නොදරයි, ඒ නිසාම, පහුගිය දිනවල මාගේ කල්පනාව වුයේ මට කපුටකු වීමට හැකි වුණි නම්, මට සතුටින් ඕනෑම තැනක සංචාරය කිරීමට හැකියාව ලැබෙනු ඇති බවටයි" යනුවෙන් පැවසීය.

කපුටා ද තමන් කපුටකු වීම පිළිබඳ සතුටු වූ පළමු දිනය බවට එදින පත්විය. වහාම භික්ෂුව කරා පියඹා ගිය කපුටා

තමාට කිසිවකු වීමට අවැසි නොවන බවත්, කපුටකු වීම පිළිබඳ තමා සතුටු වන බවත් කියා සිටියේ ය.

මෙයින් පැහැදිලි වන්නේ සතුට බාහිර වශයෙන් ලැබිය නොහැක්කක් බව හා එය තමා තුළින් ම අත්විඳිය හැක්කක් බවී ය. එසේම, අන් අය සමඟ තමා සංසන්දනය කිරීම සතුට අහිමි වීමට හේතුවක් වග ද දත යුතු ය.

මිනිසුන්ට සතුට අහිමි කිරීම පිණිස බලපාන තවත් එක් හේතුවක් පිළිබිඹු කරන කතා ප්‍රවෘත්තියක් ගෙනහැර දැක්වීමකි මේ.

එක්තරා මවක් විසුවා ය. ඇයට දූවරු දෙදෙනෙක් වූහ. මේ අතරින් වැඩිමල් දියණිය කුඩ වෙළෙන්දකු සමඟත්, බාල දියණිය නූඩ්ල්ස් සාදන්නකු සමඟත් විවාහ වූහ. කෙසේ වුව ද, මේ මවගේ මුහුණ නිරන්තර දුක්බර වූවක් වුණි. හොඳින් ඉර පායා ඇති දිනවල

"වැසි පොදක් නැහැ, ඉදිරියටත් මෙලෙස වුවහොත්, වැඩිමල් දියණියට කුඩ විකුණාගත නොහැකි වේවි" යනුවෙන් සිතා ඇය ශෝක කළා ය.

එසේ ම, වැසි දිනවල දී "මෙහෙම වැසි වැටුණොත්, කුඩා දියණියට නූඩ්ල්ස් වේළාගත නොහැකි ව, ව්‍යාපාර කඩාවැටේවි" යනුවෙන් සිතා ඇය දුක් වූවා ය.

මෙලෙස වැසි දිනවල දී මෙන් ම හොඳින් පායා ඇති දිනවලද, හැඬූ කඳුළින් කල්ගත කළ මවට එක්තරා ප්‍රඥාවන්ත මිනිසකු මුණගැසුණි. ඔහු ඇයගෙන් ප්‍රශ්න විමසා, කරුණු දැන, ඇයට සතුටින් සිටීම පිණිස උපදෙසක් ලබා දුන්නේ ය.

"අම්මේ, ඔබ දුවලා පිළිබඳ සිතා දුක්විය යුතු නෑ, මා ඔබට විසඳුමක් දෙන්නම්, ඔබ සිතන විදිය වෙනස් කරන්න, ඒ අනුව, පායන දවස්වලට ලොකු දුව ගැන හිතන්නේ නැතිව පොඩි දුව ගැන හිතන්න, පෑවිල්ල නිසා නූඩ්ල්ස් හොඳට වේළා, විකුණා ලැබිය හැකි ලාභය ගැන සිතා සතුටු වන්න.

එසේම වැසි දිනවල දී පොඩි දුව ගැන නොසිතා ලොකු දුවගේ කුඩ කර්මාන්තය ගැන සිතන්න, කුඩ වැඩිපුර විකුණා ලැබිය හැකි ලාභය ගැන සිතන්න". යන්න ඔහුගේ උපදෙස විය.

මෙය ඇසූ මව තමා මෙතරම් ශෝක කළේ තම චින්තනයේ පැවැති වරදක් නිසා බව තේරුම් ගෙන, උපදෙස් පරිදි සිතීමේ ක්‍රමය වෙනස් කොටගෙන සතුටින් විසුවා ය.

සතුට ලැබිය හැකි මාර්ග කොතරම් පැවතිය ද, මිනිසුන් ඉක්මගිය අතීතය පිළිබඳ හෝ නොපැමිණි අනාගතයක් ගැන හෝ සිතා ශෝක කරන වගට බුදුන් වහන්සේ වදාළේ ද වර්තමානයට අනුව ජීවත් වීම සතුට ලැබීමට හැකි ඉහළම ක්‍රමවේදය බව දක්වමිනි.

එනිසා පුද්ගලයකු සතුටින් නොවේ නම්, එය සිතීමේ ක්‍රමය පිළිබඳ පවතින ගැටලුවක් බව අවබෝධ කටයුතු.

සතුටින් සිටීමට අවැසි තවත් වටිනා අංගයක් ලෙස "බලාපොරොත්තු නොවීම" යන්න දැක්විය හැකි ය. "අසවල් පුද්ගලයාගෙන් මට මෙවැනි දෙයක් ලැබේවි" යනුවෙන් පැතීම මින් අදහස් කෙරේ. ලබන්නට දෙයක් බලාපොරොත්තුවන කල, නොලැබීම ද සිදුවිය හැකි හෙයින්, ඉන් ශෝකයට පත්වීමේ ප්‍රවණතාවඅධික වේ.

යමක් ලබන්නට නොපතන්නේ නම්, අහිමිවීමට කිසිවක් නොමැති හෙයින්, අසතුටු වීමට හේතු නොසැකසේ.

ජපන් සෙන් කතාවකට අනුව, එක්තරා භික්ෂුවක් වාසය කිරීමට ආරාමයක් නොමැතිව හිඟන්නන් පිරිසක් සමඟ කල්ගත කළේ ය. උන්වහන්සේ පිණ්ඩපාතයේ වඩින අතර, සිඟන්නන් කළේ හිඟමනේ යෑමයි. මෙලෙස සිඟමනේ යමින් සිටි එක්තරා හිඟන්නකුට, අතක් ද කැඩී පැවති බුදු පිළිමයක් හමුවිය. "මේ අර භික්ෂුව විසින් වඳිනු පුදනු ලබන කෙනාගේ රුවකි" යනුවෙන් කල්පනා කළ හෙතෙම එය රැගෙන ගොස් තමන් සමඟ වසන භික්ෂුවට දුන්නේ ය. මේ හැමෝම නැවතී සිටියේ පාලමක් යට ය. මෙම භික්ෂුව එය අතට ගෙන පහළ බිත්තියක සිදුරක් සාදා බුදු පිළිමය එහි තැන්පත් කොට

"බුදු හාමුදුරුවනේ, මටත් ඉන්න තැනක් නෑ. හැබැයි ඔබ වහන්සේට වැඩවාසය කරන්නට තැනක් මම දුන්නා. ඒත් බුදුහාමුදුරුවනේ, ඔබ වහන්සේගෙන් නම් මට කිසිවක් එපා" යනුවෙන් පැවසුවේ ය. එම භික්ෂුව තුළ පැවති බලාපොරොත්තු නොවීමේ ස්වභාවය ඉන් ප්‍රකට වේ. එය අහිමිවීම් කෙරෙහි බලපාන්නක් නොවන බැවින් සතුටින් සිටීමේ මඟ තනන්නේ වේ. එබැවින්, සතුටු වීමේ මාර්ගය සොයා ගත යුත්තේ ඔබ විසින් ම ය. අන් අය මත ඔබේ සතුට පිළිබඳ වන වගකීම නොතැබිය යුතු ය.

ලැබුවා වූ කෙටි මනුසත් දිවිය විඳින්නකු වනවා වෙනුවට විඳවන්නකු නොවීමට තරම් ප්‍රඥාගෝචර විය යුතු ය. ඒ සඳහා සියල්ලෝ අධිෂ්ඨානශීලී වෙත්වා!



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ,
සහකාර කථිකාචාර්ය,
**මොරවක සිරි ධම්මරක්ඛිත හිමි**



# කුරුන්දි ජාතික උරුමයට ඇයි මේ බාධා



**කුරුන්දි විහාරය එහෙමත් නැත්නම් කුරුඳුමලේ ගැන අපි මීට පෙරත් කතා කළා. අවාසනාවට අදත් මේ ඓතිහාසික සිද්ධස්ථානය ගැන අපට කතා කරන්නට සිදුව ඇත්තේ ඊට එරෙහිව පිරිසක් කටයුතු කරන නිසයි.**

මුලතිව් කෝකිලායි මාර්ගයේ නාගචෝලේ වන රක්ෂිතයේ පිහිටා ඇති කුරුන්දි විහාරය මෙරට එකම කබොක් ස්තූපය බවට සැලකෙනවා. ඒ බව පුරාවිද්‍යා චක්‍රවර්ති එල්ලාවල මේධානන්ද හිමියන් විසින් ද තහවුරු කර තියෙනවා. 1933 වසරේ දී බ්‍රිතාන්‍ය පාලකයන් විසින් නාගචෝලේ රක්ෂිතයක් ලෙස ගැසට් කරන ලද්දේ එහි ඇති ඓතිහාසිකත්වය නිසයි.

සේරුවාවිල විහාරස්ථානය අපට දායාද කළ දඹගස්ආරේ මේධංකර හිමියන් විසින් කුරුන්දි විහාරය ගැන පැහැදිලිව කරුණු දක්වා තිබෙනවා. කුරුන්දි විහාරය අයත් භූමි භාගය 80 දශකයේ දී නියමිත පරිදි හඳුනා ගැනීමෙන් පසු එය සංරක්ෂණයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළා. එහෙත් පසුව ඇති වූ ත්‍රස්තවාදී යුද ගැටුම් නිසා ඒ සියල්ල පසුවට නතර කර දමන්නට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සිදු වුණා.

යුද්ධයෙන් පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කුරුන්දි විහාරයීය පුනරුත්ථාපන කටයුතු ආරම්භ කළත් ප්‍රතිපාදන නොමැති වීම නිසා ගැටලුවකට මැදි වන්නට ඔවුන්ට සිදුවුණා. එහෙත් බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල මහතා විසින් ලබා දුන් මුදල් ප්‍රතිපාදන නිසා එහි සංරක්ෂණ කටයුතු සිදු කරන්නට හැකි වීම භාග්‍යයක් බව පෙන්වා දිය යුතුයි.

එහෙත් ජාතිවාදය මුල් කර ගත් දේශපාලකයන් කිහිප දෙනකු විසින් මේ කටයුතු අඩපණ කරන්නට කටයුතු කළේ බෞද්ධ සිද්ධස්ථානයක් විසින් දෙමළ ජනතාවගේ භූමියක් අයිතිකර ගෙන ඇති බවට ව්‍යාජ කරුණක් මතු කරමින්. ඔවුන් ඒ සම්බන්ධයෙන් නඩුවක් ද ගොනු කළා. එම කරුණ නිසා මතුවූ නීතිමය ගැටලු නිසා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වැඩ කටයුතු තාවකාලිකව නවතා දමන්නට සිදුවුණා.

නඩුවේ තීන්දුව ලැබුණේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට කුරින්දි සංරක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කරගෙන යාමට හැකි වන පරිද්දෙන්.

එයින් පසුව කුරින්දි විහාරයේ සංරක්ෂණ කටයුතු කර ගෙන යන්නට හැකි වුණා. කබොක් ස්තූපය සංරක්ෂණයට අවශ්‍ය කටයුතු සිදු කෙරුණා. අමාරුවෙන් වුණත් කබොක් ගල් සොයාගෙන මේ සංරක්ෂණ කටයුතු සිදු කෙරුණේ බෞද්ධාලෝක පදනම විසින් ලබා දුන් ප්‍රතිපාදන නිසයි. කුරුන්දි සර්ව ආගමික සංකල්පයක් ලෙසින් ඉදි කෙරුණා යැයි කිවහොත් එය නිවැරැදි වන්නේ එහි ඉදිකිරීම් සඳහා දෙමළ ජනතාවත් සහාය ලබා දුන් නිසයි.

ඒ අනුව ගොඩනැඟුණු කුරුන්දි විහාරයේ ධාතු නිදානෝත්සවය පසුගිය පොසොන් පුන් පොහෝ දිනට යොදාගෙන තිබුණා. එහෙත් එම පුණ්‍ය උත්සවයට බාධා කරන්නට දෙමළ ජාතික සන්ධානයේ දේශපාලකයන් කිහිප දෙනකු විසින් කටයුතු කළා. ඒ කුරුන්දි චෛත්‍යය අසලට ම ගොස් එහි කටයුතුවලට බාධා පමුණුවමින්.



බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල

එහි පැවැත්වීමට නියමිත වූ ධාතු නිධානෝත්සවය නවතා දමන්නට පුරාවිද්‍යා කොමසාරිස් ජෙනරාල්වරයාට සිදුවුණා. එය ඇත්තෙන් ම රාජ්‍ය ආයතන ප්‍රධානියකුගේ රාජකාරියට බාධා කිරීමක්. රාජ්‍ය ආයතන ප්‍රධානියකුගේ රාජකාරියටත් වඩා රාජ්‍ය කටයුත්තකට බාධා කිරීමක් බව පෙන්වා දිය යුතුයි.

පසුව අන්තවාදී පිරිස් මුලතිව් අධිකරණයේ තිබූ නඩුව යළි කරළියට ගෙනාවේ කුරුන්දි විහාරයට තවත් බාධා කරමින්. එම නඩුවට කරුණු ගෙන හැර දක්වන ලද්දේ ව්‍යාජ තොරතුරු මුල් කර ගනිමින් වූ අතර පුරාවිද්‍යා රක්ෂිතයක් යන්න මෙහිදී වසන් කර තිබුණා. එමෙන්ම නාගචෝලේ වන රක්ෂිතයක් දෙමළ හෝ සිංහල හෝ ජනතාවකට අයත් වන්නේ කෙසේද යන්න පවා එහිදී වසන් කර තිබුණා.

මුලතිව් මහේස්ත්‍රාත්වරයාට වාර්ථා කළ මේ කරුණුවල ප්‍රතිඵලය වූයේ කුරුන්දි විහාරය කඩා ඉවත් කර දමන ලෙසට අධිකරණ නියෝගයක් පැනවීමයි. ඒ පසුගිය ජූලි මාසයේ 14 වෙනිදායි .

එහෙත් පුරාවිද්‍යා කොමසාරිස් ජෙනරාල්වරයා විසින් ඊට එරෙහිව මුලතිව් අධිකරණයට කරුණු වාර්තා කෙළේ ජූලි 21 වැනි දා. මහේස්ත්‍රාත්වරයා එම කරුණු පරීක්ෂා කර බලා අවසානයේ කුරින්දි විහාර භූමියට ගොස් ස්ථානීය පරීක්ෂාවක් කළා. පසුව අධිකරණයට ගිය මහේස්ත්‍රාත්වරයා තීන්දුව ලබා දුන්නේ තමන් විසින් මීට පෙර ලබා දුන් නියෝගය බල රහිත කරනු ලබන බවත්, කුරුන්දි විහාරයේ සංරක්ෂණ කටයුතු කර ගෙන යාමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුමැතිය හිමිවන බවත් ය.

ඒ අනුව සියලු ජාතීන්ගේ ගෞරවාදරයට පාත්‍ර වන කුරුන්දි විහාරයේ සංරක්ෂණ වැඩ කටයුතු යළිත් ඇරැඹුණා. එහෙත් පසුගියදා එහි ගිය ජාතිවාදී පිරිස් විසින් එහි සේවයේ යෙදී සිටි පුරාවිද්‍යා නිලධාරීන්ට මරණ තර්ජන පවා එල්ල කර තිබුණා. මේ නිසා කුරුන්දි විහාරයේ කටයුතු කළ පුරාවිද්‍යා නිලධාරීන් පොලිසියේ පැමිණිල්ලක් දමා එම භූමියෙන් ඉවත්ව තිබෙනවා.

එයින් කුරුන්දි විහාරයීය වැඩ කටයුතු මුළුමනින් ම අඩපණ වෙලා.

ජනප්‍රවාදවලට අනුව බුදුරජාණන් වහන්සේගේ දෙවන ලංකා ගමනය වූ නාගදීපයට වැඩම කළ අවස්ථාවේ දී කුරුඳුමලේ විහාරය පිහිටි කඳු සහිත භූමියට වැඩම කොට තිබෙනවා. බල්ලාටනාග රජු විසින් ක්‍රි.ව. 100 -103 අතර කාලයේ දී කුරුන්දාවශෝක විහාරය තනා ඇති බවට පුරාවිද්‍යා සාක්ෂ්‍ය තිබෙනවා. යළි කබොක් ගල්වලින් මේ ස්තූපය තනා සමස්ත ජාතීන්ට ම මේ ඓතිහාසික සිද්ධස්ථානය රැක දීමට කටයුතු කළ යුතු වනවා.




කොළඹ පැවති විරෝධය

තාරක වික්‍රමසේකර

# පින සහ කුසලය දෙකක් ද? එසේ නම් එකක් ද? නැත

**මෙම සටහන, පැහැදීමෙන් ශ්‍රද්ධාවෙන් තෙරුවන් සරණ ගිය පන්සිල් පටන් එයට වැඩි අධි සිල් සුරකින ගුණවතත් බොදුනුවන් (බෞද්ධ + නැණවත්) අරමුණු කොට තබන්නකි.**

එයට හේතු වන්නේ පෙරදාත් මෙදාත්, අනාගතයේත් පින් කොට සදෙව්ලොව හෝ මිනිස් ලොව සුගති සම්පත් ද, කුසල් කොට රූපාවචර - අරූපාවචරාදියෙහි බ්‍රහ්ම සම්පත් ද ලැබූ හා ලබන බෞද්ධ නොවන පුණ්‍යවන්තයන් එක්තිස් (31) ලොවම සිටින හෙයිනි.

බෞද්ධ අපගේ පරම නිෂ්ඨාව වනුයේ, පරම නිෂ්ඨාව (අවසන් කෙළවර) විය යුත්තේ, එකී 31 ලෝකයෙන් (අපාය 4 + මනුලොව + දෙව්ලොව 6 + දෙපාවචර බඹතල 16 + අරූපාවචර බඹතල 4 = 31 ) කෙනකුටවත් මේ මරණයෙන් පසු යන අයුරෙන් මෙලොව ජීවත්වීම නොව මේ මරණයට පෙර (මෙලොවදීම) අරහත් ඵලය සාක්ෂාත් කොට පුනර්භවයක් නොලබන අයුරින් පින් කුසල් තුළ හැසිරීමක් චුති සිතට යාම ය.

අපට මහා කරුණාවෙන් පරිපූර්ණ භාග්‍යවත් තථාගත සම්බුද්ධ රාජයාණන් වහන්සේ, ඒ උත්තම ශාන්ති නායකයාණන් වහන්සේ ස්වයම්භූ ඤාණයෙන් අවබෝධ කළ මුලක්, මැදක්, අගක් ඇති ස්වක්ඛාත වූ, තමන් තුළින්ම දැකිය හැකි සන්දිට්ඨික වූ, හැම කාලයටම ඔබින අකාලික වූ, ඕනෑම මතවාදියකුට නොබියව 'එව බලව' යනුවෙන් දැක්විය හැකි ඒහිපස්සික වූ, සියලු වැඩ පසෙකලා ළං කර ගත් වේලෙහි පල ලැබිය හැකි ඕපනයික වූ, අසා තම තමා දැනගත් තමාට ප්‍රතිඵල ලැබෙන පච්චත්තං වේදි තබ්බ නම් වූ, ශ්‍රී සද්ධර්මය ද,

අඤ්ඤා කොණ්ඩඤ්ඤ මහා සාරිපුත්ත, මහ මුගලන් ආදී අවිච්ණ්ණ මහ සඟ පරපුරෙහි වර්තමාන නියෝජනය ආදී සමඟින් වූ සඟ රුවන ද මුණ ගැසී තවම ගතව ඇත්තේ වසර (2566+45 ) 2611 වැනි කෙටි කාලයකි.

එයට පෙර ද මේ විශ්වය මේ එක්තිස් ලෝකය තිබුණි. එකල් හි ද මේ ලොව බුද්ධිමතුන්, ප්‍රඥවන්තයන් විසූහ. එහෙයින් පින් කළ අය සුගති ලෝකවල ද කුසල් කළ අය බ්‍රහ්ම ලෝකවල ද දීර්ඝායුෂ ලබමින් දැනුදු වෙසේ.

අපි මේ වනවිටත් ධර්මය අසා දැන සිටින කරුණකි. පින් කිරීමෙන් එහි විපාක වශයෙන් සුගති සම්පත් ලැබිය හැකි බව. එනම් භවගාමී ස්වභාවයෙන් මිනිස් දෙව්ලොව උපත ලබන බව. එමෙන්ම කුසල් කිරීමෙන් නිර්වාණගාමී විය හැකි බව ද ධර්ම දේශනා තුළින් අපි අසා ඇත්තෙමු.

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ද වරක් සසර සැරිසරද්දී "පස්ස පුඤ්ඤානං විපාකං කුසලානං සුබෙසිනො' යනාදී වශයෙන් දේශනා කරමින්

මහණෙනි, පින් කිරීමට බිය නොවන්න. සත්වසක් මෙත් සිත් වඩා කල්ප සතක් මනු ලොවට නොපැමිණියෙමි' යනුවෙන් මා පුඤ්ඤාභාසි සූත්‍රයේ දී (අං.නි. 4 - විට 412 ) වදාළ ස්ථාන ඇත.

ඉහත සියලු කාරණා සැලකිල්ලට ගනිමින් අති දීර්ඝ කාලයකට පසු සමතිස් පෙරුම්දම් පුරා සම්මා සම්බුදුවරයකු මිනිස් ලොව පහළ වන්නේ ම අනුගාමිකයා නැවත භවයකට ගෙන යාමට නොව, මේ උපන් භවයේ දී ම භව ගමන නවතා දීමට ය.

ත්‍රිපිටකාගත බුද්ධ දේශනා තුළ මේ අනුශාසනාව විවිධාකාරයෙන් බොහෝ සූත්‍රවල සාර යම වේ. (උදා - එකක් පමණක් ස.නි.2 කස්සප සංයුත්තයේ ජිණ්ණ සූත්‍රය පිටුව 308 කියවා බලන්න)

පින පාලියෙන් පුඤ්ඤ යනුයි. අර්ථය පිරිසුදු යහපත් ක්‍රියාවන් ය. කුසල යන්ට අර්ථ කීපයක් ඇතත් මෙහිලා උපකාර වනුයේ දක්ෂ වූ, නිපුණ වූ අදහසයි.

මෙතෙක් පහළ වූ සියලු බුද්ධෝත්තමයාණෝ ද
"සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා"
යනුවෙන් මෙත්ත සූත්‍රයේ
"කරණීය මත්ථ කුසලේන - යං තං සන්තං පදං අභිසමෙච්ච" (ශාන්ත පදය නම් නිර්වාණයට එළඹෙනු කැමැති අත්ථ කුසල හෙවත් අරමුණ ඉටුකර ගැනීමට දක්ෂ පුද්ගලයා) යනුවෙන් ද ඇති තැන් සිහිපත් කරමින් මෙසේ ඉදිරි සටහන් තබමු.

සසරෙහි ආදීනව නොදැන අනවබෝධයෙන් මතු සම්පත් අපේක්ෂාවෙන්, ඥාන විප්‍රයුක්තව අවිජ්ජා පච්චයා සංඛාරා ලෙසින් පුණ්‍ය ක්‍රියා කරන්නෝ වෙති.

සසරෙහි යථාර්ථය දැන සසරින් මිදීම පිණිස කර්ම භව නිරෝධය සලකා ඥාන සම්ප්‍රයුක්තව පුණ්‍ය කරන පිරිසක් ද වෙති.

මේ දෙපිරිස ම සුගති සම්පත් ලබති.

මේ අතර තවත් සමහරු දස අකුසලින් ම වෙන් ව වාසය කරයි. එහෙත් ලෝභ, ද්වේෂ, මෝහ ක්ෂය කරමින් සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්හි දැනුම ලැබ ඒවායෙහි හැසිරීමට දක්ෂ නොවෙති.

එහෙයින් ඔවුහු පින්වත් වුවත් ගුණවත් වුවත්, ලෞකික කුසල් (දක්ෂ කම්) ඇත්තවුන් ලෙසින් සුගති සම්පත් ලබන්නට ම සුදුස්සෝ වෙති.

මෙසේ ලෞකික කුසල් ඇත්තෝ මෙන්ම ලෝකෝත්තර කුසල් ඇත්තෝ ද බුද්ධ ශ්‍රාවකයන් අතර වෙති. ඔවුහු පින් කිරීමේ දී ඥාන සම්ප්‍රයුක්තයෝ වෙති.

සසරට බිය ඇතිව, සතර ප්‍රධාන වීරිය වඩමින් සියලු බුදුවරු දෙසූ අයුරින් සියලු පව් අකර්මණ්‍ය කරමින්, කුසල් උපදවමින්, සම්මා දිට්ඨිගත ව, නිවන් අරමුණට ගෙන, සිත දමනයෙන් ප්‍රඥව පහළ කරවා ගෙන, පටිච්ච සමුප්පාද අවබෝධයෙන් සංසාර තුන් වටය වටහාගෙන, පරම චතුස්සත්‍යය අවබෝධය මෙලොව දී ලබන්නකු වේ.

ඔවුහු පුනර්භවය නැත්තන් විය. අපිදු එසේ වන්නට වීර්ය වඩන්නෝ වෙමු.

අනභි සම්බුද්ධ කාලයන්හි ද පින් කළෝ දිව්‍ය මනුස්ස සම්පත් ද, කුසලයෙහි දක්ෂයෝ ධ්‍යාන වඩා බඹතලවල කෙලෙස් සහිතව පහළව කාකාරාගත් කෂායෙහි ජලය චිත්තය මෙන් ද, ඒ ජලයෙහි අඩංගු වූ නානාවිධ බෙහෙත් රස චෛතසික මෙන්ද, සලකන්නාක් මෙන් යහපත් ක්‍රියා නම් වූ පින් සිත් නැත්තේ එවන් කවරකු හට හෝ ඒ ක්‍රියාකාරකම්වල දක්ෂයකු (කුසලතා) විය නොහැක.

එහෙයින් පිනෙන් තොර කුසලයක් නැත. කුසලයෙන් තොර නිවනක් නැත. නිවන් අධිෂ්ඨානයෙන් ම පින් ද කුසල් ද කරන්නෝ වෙමු.





ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ ලේකම්
( බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව බුද්ධශාසන අමාත්‍යාංශය)
**කේ.කේ. සුගතපාල**

## අතරමං වී

එන දා එනවා
තනිවම එනවා
හිස් අතකින් එනවා
යන දා යනවා
තනිවම යනවා
හිස් අතකින් යනවා
එන යන ගමනේ
පින් පව් මඟ හිඳිනා
තනිකම සිත දවනා........

සුවඳ මලක් වී
මව් තුරුලේ
පුංචි පැළය වී
පිය සෙවණේ
සිනාසී හඬනා
නැණ ගුණ වඩනා
නිසි මඟ සොයනා
ගමනක යන මිනිසා......

තණ්හා ආශා
සිත තුළ බැඳෙනා
මෝහෙන් මුළා වෙලා
ලෝභකමින් මත් වී
අඳුරු මන්දිරේ
සිත තනි වීලා
අතරමං වෙලා මිනිසා
සසරේ
සසරේ තවමත්
අතරමං වෙලා මිනිසා....

නීතිඥ
**කීර්ති කපුවත්ත**
රිදීගම



# අවිද්‍යාවේ අන්ධකාරය දුරු කොට ප්‍රඥාවේ ආලෝකය උදාකර ගනිමු

**අපි කවුරුත් වන්දනඥ මානන සඳහා ගාථා සජ්ඣායනය කරමු. පරම්පරායානුගතව අපට හුරුවීමෙන් එම ගාථා සජ්ඣායනා කරනු ලැබුව ද ඒවායේ අර්ථය පිළිබඳ හෝ අන්තර්ගත ධර්මානුකූල භාවය පිළිබඳ අප මොහොතකටවත් සිතා බලන්නේ ද නැත.**

ප්‍රායෝගික බුදු දහම තුළ විශේෂයෙන් ථෙරවාද සම්ප්‍රදාය පවතින රටවල භාවිත කෙරෙන වන්දනා ගාථා කවුරුන් විසින්, කවදා ප්‍රබන්ධ කරන ලද්දක් ද යන්න තහවුරු නො වුව ද, ඒවායේ බොහෝ දුරට අන්තර්ගත වන්නේ බුදු ගුණ හෝ බුදු දහමයි. පහත ගාථාව එලෙස බුදු ගුණ හා බුදු දහම ප්‍රකට කෙරෙන කදිම අවස්ථාවකි.

***"නමාමි බුද්ධං ගුණසාගරන්තං***
***සත්ථා සදා හොන්තු සුඛී අවේරා***
***කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ***
***ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච"***

බුදු දහමෙහි ඉගැන්වෙන පරිදි භාවනාව යනු මනස සංවර කරන ප්‍රධාන අවියයි. මනස සංවර වූ තරමට පුද්ගලයාට ධර්ම මාර්ගය තුළ ජීවත්වීමට හැකියාව ලැබේ. මනසට ආරක්ෂාව ද එනිසා ලැබේ. එසේ මනසට ආරක්ෂාව ලබා දෙන භාවනා මාර්ග 04ක් ඉහත ගාථාව තුළින් ප්‍රකාශ වේ.

චතුරා රක්ඛා හෙවත් චතුරා රක්ෂාව යනුවෙන් හඳුන්වන එම භාවනා බුද්ධානුස්සති භාවනාව මෙත්තා හෙවත් මෛත්‍රී භාවනාව, අසුභ හෙවත් පිළිකුල් භාවනාව හා මරණය පිළිබඳ මෙනෙහි කරන මරණානුස්සති භාවනාවයි.

අනුස්සති යනු සිහිකිරීමයි. බුද්ධානුස්සති යනු බුදු ගුණ සිහිකිරීමයි. 'නමාමි බුද්ධං ගුණ සාගරන්තං' යනු සාගරයක් බඳුවූ, අපරිමිත වූ බුදුගුණය නමදිමි යනුයි.

'සත්ථා සදා හොන්තු සුඛී අවේරා' යනු සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා. නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා යන පැතුමයි. එය මෛත්‍රී භාවනාවයි.

'කායෝ ජිගුච්ඡෝ සකලො දුගන්ධෝ' යනු කය දුගඳ හමන බැවින් එය පිළිකුල් කළ යුතු බව ය. එය අසුභ භාවනාවයි.

'ගච්ඡන්ති සබ්බේ මරණං අහංච' යනු සියලු සත්ත්වයන් මෙන්ම (තමා ද) මරණයට පත්වන බවයි. එය මරණානුස්සති භාවනාවයි.

මරණය ස්වභාව කොටගෙන සියලු සත්ත්වයෝ ජීවත් වෙති. ජීවිතය ද මරණයෙන් කෙළවර වන්නේ ය.

"සබ්බේ සත්තා මරිස්සන්ති
මරණං තම්හි ජීවිතං"

යනුවෙන් ධර්මය එම සනාතන ධර්මය විග්‍රහ කොට ඇත. මෙකී සනාතන දහම ප්‍රායෝගිකව පෙන්වා දෙන අවස්ථාවක් ලෙස මල් පූජා කිරීමේ දී අප භාවිත කරන ගාථාව පෙන්වා දිය හැකි ය.

"පුප්ඵං මිලායාති යථා ඉදං මේ
කායෝ තථායාති විනාස භාවං"

මෙහි සරල තේරුම වන්නේ මල් පරවන්නේ යම් සේ ද, එසේම කය ද විනාශ ස්වභාවයට පත්වන්නේ ය යනුයි.

බුදු දහමෙහි ප්‍රධාන ඉගැන්වීම වන්නේ සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බවයි. ඒ නිසා ම දුක් සහගත බවත්, එබැවින් "මම" ය "මාගේ" යැයි ගත හැකි ආත්මීය වූ කිසිවක් නොමැති බවත් බුදු දහමෙන් ඉගැන්වෙන මුඛ්‍ය පණිවුඩයයි.

එබැවින් බුදු දහම වනාහි අනාත්මවාදී දහමකි.

මජ්ඣිම නිකායේ රට්ඨපාල සූත්‍රයේ දී ඉහත අනාත්මවාදී දහම පිළිබඳ සඳහන් කරන්නේ "උපනීයති ලෝකෝ අද්ධුවො"

පුද්ගලයා ජරාවටත් මරණයටත් පත් වේ. එම නිසා (අධ්‍රැවයි) "අත්තනෝ ලෝකෝ අනභිස්සරෝ" ජීවිත ගමනේ යම් අවස්ථාවක අපට පිළිසරණයට, අපව අස්වසාලීමට යමකු නොමැත. "අස්සකො ලෝකෝ සබ්බං පහාය ගමනීයන්ති" යම් දිනක දී තමාට අයත් සියල්ල අත්හැරිය යුතු ය යනුවෙනි. "අත්තාහි අත්තනෝ නත්ථි"

තමාට යම් දිනක තමා ද අහිමි වෙයි. මේ තත්ත්වය කිසිවකුට ඉක්මවාලිය ද නොහැක්කේ ය.

"මරණ ධම්මෝම්හි මරණං අනතීතො ති" යනුවෙන් ජීවිතයේ අනිත්‍ය ස්වභාවය බුදු දහම තුළ විවිධාකාරයෙන් විග්‍රහ කොට ඇත.

එලෙස බුදු දහමින් ප්‍රකාශවන ජීවිතයක අනිත්‍ය ස්වරූපය අප පූජා කරන මල් උපමා කරගෙන මල් පූජා කරන ගාථාවෙන් ප්‍රායෝගිකව උගන්වන්නේ ද ජීවිතයක අනිත්‍ය ස්වභාවය පිළිබඳ ගැඹුරු දර්ශනයයි.

බුදු දහමෙහි සංක්ෂිප්තය වන්නේ සියලු පාපයන් දුරුකිරීමත්, කුසලයන් රැස්කිරීම හෙවත් සමාධියට සිත යොමු කිරීමත්, සිත පිරිසුදු කිරීම එනම්, ප්‍රඥාවෙන් සිත පිරිසුදු කිරීමත් ය. එය නිර්වාණය හෙවත් බුදු දහම තුළ ඉගැන්වෙන පරම සත්‍යයට ප්‍රවිෂ්ඨ වීමේ මාර්ගය ද වන්නේ ය.

අප විසින් පිළිපැදිය යුතු මෙකී ධර්ම මාර්ගය ඛුද්දක නිකායේ ධම්මපදය තුළ අන්තර්ගත වී ඇත්තේ,

***සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා***
***සචිත්ත පරියෝදපනං - එතං බුද්ධානුසාසනං***

යනුවෙන් ය.

බුදු දහමේ ඉගැන්වෙන නිර්වාණගාමී මාර්ගයට ප්‍රවිශ්ඨ වීමට උපකාරි වන බෞද්ධ ප්‍රතිපත්ති මාර්ගය ත්‍රිශික්ෂා නම් වේ. එනම් සීල, සමාධි හා ප්‍රඥා යනුයි.

ඉහත ගාථාවේ සබ්බ පාපස්ස අකරණං යනු සියලු පව් නොකිරීම, "සීල"නම් වූ ශික්ෂාව පරිපූර්ණ කිරීමයි.

එහි කුසලස්ස උපසම්පදා යනු කය වචන සංවරයයි. එය සමාධියට සිත යොමු කිරීමකි.

සචිත්ත පරියෝදපනං යනුවෙන් ප්‍රඥාවෙන් සිත දියුණු කිරීමයි.

මේ අනුව ඉහත ගාථාවෙන් ප්‍රකාශ වන්නේ බුදු දහමෙහි ප්‍රතිපත්ති මාර්ගය ලෙස සැලකෙන සීල, සමාධි, පඤ්ඤා නම් වූ ත්‍රිශික්ෂාවයි.

පහන් දැල්වීම ද ආගමික වතාවත්වල දී නිරන්තරයෙන් සිදුකරනු ලබන චාරිත්‍රයකි. බුදුන් වැඳීම, බෝධි පූජාවක් පැවැත්වීම, පිරිත් සජ්ඣායනාවකට පෙරාතුව ද පහන් දැල්වීම අප විසින් සිදුකරන චාරිත්‍ර විධියකි. මීට අමතරව ශාන්ති කර්මවල දී ද උත්සව ආරම්භයක දී පමණක් නොව මෘත ශරීරයක් අභියස ද පහන් දැල්වීම බෞද්ධ අබෞද්ධ සියල්ලෝ ම සිදුකරනු ලබති. මෙවැනි අවස්ථාවල දී පහන් දැල්වීම අඳුර දුරු කිරීමට චාරිත්‍රයක් ඉටුකිරීමට හෝ වෙනත් අදෘෂ්‍යමාන දෝෂ සමනයට හේතුවන පූජාවක් ලෙස සිදුකළත් බුදු දහමට අනුව පහන් දැල්වීම හා දැල් වූ පහන නිවීම මරණානුස්සති භාවනාවට සිත යොමුකිරීමකි.

බුදු දහමට අනුව ජීවිතයේ අවසානය හෙවත් මරණය සිදුවන අවස්ථා 04 කි. ඒ බව

"ආයුක්ඛයෝ කම්මක්ඛයෙන
උභයක්ඛයෙන උපච්ඡේදක කම්මුනා
චෙති චතුධා මරණච්ඡාති නාම"

යනුවෙන් සඳහන් වේ. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි දැක්වෙන ඉහත පරිදි ජීවිතයක් මරණයකින් කෙළවර වීම පහන නිවීමේ ක්‍රියාවලියට උපමා කරගෙන දක්වා ඇත්තේ පහත පරිදි ය.



ආයුක්ඛය මරණය හෙවත් ආයුෂ ය අවසන් වීමෙන් සිදුවන මරණය වැටිය දැල් වූ පහන් අවසන් වීමෙන් පහන නිවී යාමට උපමා කර ඇත.

එසේම කම්මක්ඛය මරණය හෙවත් කර්මය අවසන් වීමෙන් සිදුවන මරණය පහනේ තෙල් අවසන් වීමෙන් පහන නිවීයාමය.

උභයක්ඛය මරණය හෙවත් කර්මය හා ආයුෂය යන දෙකම අවසන් වීමෙන් සිදුවන මරණය පහන් වැටිය හා පහනේ තෙල් අවසන් වීමෙන් පහන නිවීයාමය.

උපච්ඡේදක මරණය හෙවත් කර්මය හා ආයුෂ තිබිය දී අතුරු ආන්තරාවකින් සිදුවන මරණය පහනේ තෙල් හා පහනේ වැටිය එසේම තිබිය දී සුළං වැදීම වැනි අනපේක්ෂිත ක්‍රමයකින් පහන නිවීයාම උපමා කර ගෙන පෙන්වා දී ඇත.

පහන් පූජාවෙන් හා එහි ආලෝකය නිවී යාම ක්‍රම 4 තුළින් ජීවිතයක් නිමාවීමේ ක්‍රියාවලිය සිදුවන අයුරු පැහැදිලිව බුදුදහමින් පෙන්වා දෙනවා සේ ම පහන් ආලෝකයෙන් අන්ධකාරය දුරු වී ආලෝකය උදාවීම අවිද්‍යාවේ අන්ධකාරය දුරු වී ප්‍රඥාවේ ආලෝකය උදා වී නිර්වාණාවබෝධය ලබා දීමේ සිහිකැඳවන බෞද්ධ ක්‍රියාවලියට ද උපමා කර ඇත.

නිර්වාණාවබෝධ යනු ආලෝකය උදාවීමයි. (ආලෝකො උදපාදි) යනුවෙන් ධර්මයේ දැක්වෙන්නේ එම ක්‍රියාවලියයි.

බුදුවදනට සවන් දුන් බෞද්ධ උපාසක උපාසිකාවෝ ධර්මාවබෝධය තුළින් ආර්ය මාර්ග ඥාණාලෝකය ලැබීම පිළිබඳ උදම් ඇනුවේ

"අන්ධකාරේවා තේලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති" යනුවෙනි.

අඳුරෙහි පහනක් දරන්නාක් මෙන් ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි ආදි ලෙසට ධර්ම ඥාණය උදා වූ බව එයින් ප්‍රකට වෙයි.

එසේම අප චෛත්‍යය වන්දනා කිරීමට අනාදිමත් කාලයක සිට භාවිත කෙරෙන

***"වන්දාමි චේතියං සබ්බං***
***සබ්බඨානේසු' පතිට්ඨිතං***
***සාරීරික ධාතු මහා බෝධි***
***බුද්ධරූපං සකලං සදා"***


යන ගාථාව ද ශාරීරික, පාරිභෝගික හා උද්දේසික යන බුදු දහමේ ඉගැන්වෙන ත්‍රිවිධ චෛත්‍ය එකවර වැඳීමට උපයෝගි කර ගන්නකි. එම ගාථාවේ අදහස එය සනාථ කරවයි. පළමුව ශාරීරික ධාතු තැන්පත් සියලු තැන්හි මනාව පිහිටවූ ශාරීරික චෛත්‍යයත්, දෙවනුව පාරිභෝගික චෛත්‍ය වූ මහාබෝධියත්, තෙවනුව උද්දේසිකය හෙවත් බුදුන් වහන්සේ වෙනුවෙන් නිර්මාණය කළ බුද්ධරූපය ද වන්දනා කරමි යනු එයින් ප්‍රකාශිත බුදු දහමේ ඉගැන්වෙන වන්දනා කරන පිළිවෙළයි.

බෝධීන් වහන්සේට වන්දනා කරන්නේ "යස්සමූලේ නිසින්නෝව" යන ගාථාව සජ්ඣායනා කරමිනි.

නො සැලෙන අධිෂ්ඨානශිලී වීර්යයෙන් යුතු ව සියලු අභියෝග ජය ගෙන බුද්ධත්වය අවබෝධ කළ උතුම් වීර්ය පාරමිතා ගුණය ආවර්ජනා කරමින් ඒ සඳහා උපකාරී වූ බෝධි හෙවත් ආර්ය මාර්ග සංඛ්‍යාත ඥාණයත් සිහිකරමින් බෝධි වන්දනය සිදුකරයි. එය බුදුගුණය ආවර්ජනය කිරීමකී.

ආරක්ෂක දේශනාව හෙවත් පිරිත් දේශනාව අවසානයේ දී "දේවෝ වස්සතු කාලේන සස්සසම්පත්ති හේතු ච" යන ගාථාව සජ්ඣායනය කරන්නේ ධාන්‍ය සම්පත්තියට හේතුවන වර්ෂාව සුදුසු කල ලැබේවා'යි ප්‍රාර්ථනා කිරීමටයි.

එම ප්‍රාර්ථනය සඵල වීමට නම් දැහැමි පාලනය ද බොහෝ දුරට බලපාන බව ගාථාවෙන් ම ගම්‍ය කරවයි. එදිනෙදා වන්දනමානන සඳහා අප ව්‍යවහාර කරන ගාථාවන් තුළින් ප්‍රකාශ කෙරෙන බුදු ගුණ හා බුදු දහම අවබෝධ කර ගැනීමට කාලය පැමිණ ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි.



බෙල්ලන්විල රජමහා විහාරාධිකාරී, ශාස්ත්‍රපති
**බොරලැස්ගමුවේ ප්‍රේමරතන හිමි**

# කඨින සිවුරේ කතාව

**භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන කාලයේ කොසොල් රට පාවා නුවර වැසි පිණ්ඩපාතික වූ ද, පාංශුකූලික වූ ද, ආරණ්‍යවාසී වූ ද ධූතාංගධාරී භික්ෂූන් වහන්සේ තිස් නමක් සාකේත නුවර වස්විසූහ. අවසානයේ වස් පවාරණය කොට මහ වැසි වසිද්දීම සැවත් නුවර බලා පිටත්වූහ.**

මාස කිහිපයක් පුරා ඇදහැලුණු ධාරානිපාත වැසි නිසා මාර්ගය වලවල්හැරී මඩගොහොරු බවට පත්ව තිබුණි. තබන තබන පියවර ලිස්සනසුලු විය. මඩෙහි වැටෙමින් ද, වැස්සට තෙමෙමින් ද දිය බේරෙන සිවුරුවලින් යුතුව ක්ලාන්තව ශීතලෙන් වෙව්ලමින් දෙව්රමට වැඩම කොට බුදුරජාණන් වහන්සේ වන්දනා කළහ. මෙම භික්ෂු පිරිසට අනමතග්ග සංයුක්තයෙන් දහම් වදාරා සසරේ ඇති බියකරු බව පෙන්වා වදාළහ. මෙම ශ්‍රාවක පිරිස අරමුණු කරගෙන

මහණෙනි වස් වැස නිම කළ භික්ෂූන් වහන්සේගේ පහසුව සඳහා කඨිනයක් අනුදනිමි'යි කඨිනයක් ඇතිරීමට අනුදැන වදාළහ.

කඨිනයක් ඇතිරීමට සුදුසු කවර වස්ත්‍රයකින් වුව ද සිවුරක් කිරීමට හැකි ය. මහා වග්ග පාලියේ වස්ත්‍ර වර්ග දහ හතක් (17) පෙන්වා දී තිබේ.

අලුත්ම වස්ත්‍රයක්, අලුත් වස්ත්‍රයකට සමාන වූ රෙදි කඩක්, රෙදි කැබැලිවලින් කළ සිවුරක්, පාංශුකූල වස්ත්‍රයක්, වෙළෙඳසල් දොරටුවෙහි අතහැර දමා තිබී අහුලාගත් වස්ත්‍රයක්, කලින් ඇඟවීමක් නැතිව ලැබුණ වස්ත්‍රයක්, කලින් අනුසස් නොකීමෙන් ලද වස්ත්‍රයක්, තාවකාලික නොවූ වස්ත්‍රයක්, කලින් තැන්පත් කොට නොතැබූ වස්ත්‍රයක්, නිසඟි නොවූ වස්ත්‍රයක්, කප් බිංදු තැබූ වස්ත්‍රයක්, තනිපට සිවුරක්, අඳනයක්, එදිනම කඩ කපන ලද අතු පහක් හෝ ඊට වැඩි ගණනක් ඇති සිවුරක්, පුද්ගලයකුට අයිති වීම් වශයෙන් ඇතිරීමෙන් ලද සිවුරක්, මැනවින් අතුරන ලද එම සීමාවෙහි භික්ෂූන් විසින් අනුමෝදන් වන ලද කඨිනය, මනා කොට අතුරන ලද කඨිනය ලෙස දක්වා තිබේ.

වස් විසීමෙන් පසු තෙමීගත් සිවුරුවලින් යුතුව බුදුරජාණන් වහන්සේ දකින්නට වැඩිය තිස්නමක් පාවෙය්‍යක නුවර භික්ෂූන් මුල් කොටගෙන කඨිනය පනවන ලදි. එය කඨිනයේ නිදානය නම් වේ. කඨිනය කුමක් පිණිස වේද? වස් විසූ භික්ෂූන් වහන්සේට පහසු විහරණය පිණිස තුන්සිවුරට අතිරේකව කඨින සිවුර ලබා ගැනීමට අනුදැන වදාරා ඇත.

කඨිනය යැයි කියන්නේ කුමක් නිසාද? නොසෙල්වෙන, නොබිඳිය හැකි, කම්පා නොවන, ස්ථාවර ආනිසංස ගෙන දෙන බැවින් එයට කඨිනය යැයි කියනු ලැබේ.

වස් විසීමට ආරාධනා කළ පින්වතුන් හෝ කවර සැදැහැවතකුට වුවද වස් වසා නිම කළ භික්ෂුවකට පූජා කළ හැකි ය.

පෙර වස් පවාරණය කළ භික්ෂුවකට පමණක් කඨින චීවරය ලබා ගත හැකි ය. මෙය සංඝරත්නයට පූජා කළ පසු සංඝ රත්නය විසින් එබඳු සුදුසු භික්ෂුවකට කඨින චීවරය පැවරිය හැක.

ඉහත සඳහන් කළ වස්ත්‍රවලට අයත් වස්ත්‍රයකින් සිවුරක් මැසීමට ප්‍රමාණවත් රෙද්දක් ලබා දී එම වස්ත්‍රයෙන් දෙපට සිවුරක්, තනිපට සිවුරක් අඳන සිවුරක් වශයෙන් මසා නිම කර දීමට ද පිළිවන.

කඨින චීවරයක් හැමදාම පූජා කළ නොහැකි ය. වස් වසා අවසානයේ පවාරණයෙන් පසු චීවර මාසයේ එනම් වප් පොහෝ දා දින සිට ඉල් පුර පසළොස්වක පොහෝ දින දක්වා කාලය ඇතුළත පූජා කළ හැකි ය.

කඨින චීවරයක් පූජා කළ යුත්තේ භික්ෂූන් වස් විසූ විහාර සීමාව තුළදී ය. ඇතැම් විටක ගෘහ මන්දිරවලද සැදැහැවතුන් විසින් ඒ ඒ භික්ෂූන් වහන්සේ වස් වසවා ගනු ලැබේ. එවිට එම ස්ථානයේ දී කඨිනය දිය යුතු යි. ඉහත දැක්වූ කරුණු නවය පැරැණි ආචාර්යයන් වහන්සේ කඨිනය සම්බන්ධයෙන් පෙන්වා දී ඇති කරුණු ය. ඒ බව,

ලොව පවත්නා සියලු සියලු වර්ගයේ දානයන් නිරන්තරයෙන් අවුරුදු සියයක් දුන්නේ වී නමුත් එහි ආනිසංසය එක් කඨින දානයකින් සොළොස් කලාවෙන් එක් කලාවක් තරම් පමණ වේ. කඨින දානය ම උතුම් වේ.

මෙම පෘථිවි මණ්ඩලයෙහි ම සියලු දන්දීම් අතර සංඝරත්නයට පුදන ලද කඨිනය ම උතුම් වේ. මිනිස් ලොව උසස් මිනිස් සම්පත් ද, දෙව්ලොව උසස් දිව්‍ය සම්පත් ද, කෙලෙස් දුරු කිරීමෙන් ලබන අජර වූ ද අමර වූ ද නිවන් සම්පත් දක්වා සියලු සම්පත් කඨිනානිසංසයෙන් ලැබෙන්නේ යැයි නාගිතාපදානයේ ස්වකීය කඨින වර්ණනාව දේශනා කොට තිබේ.


කඨිනය ලබන පින්වත් ස්වාමීන් වහන්සේට ද ආනිසංස පහක් ලැබෙන බව දක්වා තිබේ.

1. ආරාමයෙහි භික්ෂුවකට නොදන්වා කුල ගෙවල්වල හැසිරිය හැකි ය.
2. අධිෂ්ඨාන කළ තුන් සිවුරෙන් තොරව රාත්‍රිය ගත කළ හැකි ය.
3. ගෞරවනීය ආරාධනාවකින් තොරව කරන ඉල්ලීමකට අනුව ගොදුරුගමෙහි දී ආහාරපාන ලබාගෙන වැළඳිය හැකි ය.
4. ආරාමයට ලැබෙන සිවුරු පිරිකර ළඟ තබා ගත හැකි ය.
5. කඨින චීවරය සමඟ ලැබෙන සියලු පූජා භාණ්ඩ තමාට ලබා ගත හැකිය.

මෙම වරප්‍රසාද පහ වප් පොහෝ දින සිට මැදින් පුර පසළොස්වක පොහෝ දිනය දකවා ලබා ගත හැකි ය.

මෙසේ සෑම අයුරකින්ම කඨිනයේ ආනිසංස උත්කර්ෂයෙන් වර්ණනා කොට ඇත්තේ සැදැහැවතුන්ගේ ශ්‍රද්ධාව වර්ධනය කොට කුසලයට නැඹුරු කරවීමට ගත් උදාර ප්‍රයත්නයක් ලෙස බව සැලකිය හැකි ය.





දඩල්ල වාලුකාරාම විහාරවාසී ශාස්ත්‍රපති
**රත්ගම සුනීත හිමි**

# ඥාන ගවේෂණයේ පෙර මං සලකුණු කළ විද්‍යාලංකාර ශාස්ත්‍ර නිකේතනයේ මහගෙදර

# රත්මලාන පුරාණ විහාරය



**රත්මලාන පුරාණ විහාරාධිපතිව සිටි බෝධිසත්වගුණෝපේත රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ස්වකීය අග්‍රගණ්‍ය ශිෂ්‍යවර කලපළුවාවේ ධර්මාරාම (පසුව රත්මලානේ ශ්‍රී ධර්මාරාම) ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු දායකකාරකාදීන්ගේ ඉල්ලීමකට අනුව පෑලියගොඩ තොරණ හන්දියට යාබද වූ ගාලගොඩවත්ත නම් වූ රමණීය භූමිභාගයක වර්ෂ 1875 නොවැම්බර් මස 01 වැනි ද පෑලියගොඩ විද්‍යාලංකාර ශාස්ත්‍රශාලාව ආරම්භ කළහ.**

එසේ ආරම්භ කළ විද්‍යාලංකාර ශාස්ත්‍රශාලාව කෙටිකලක දී ඥාන පිපාසිත ශාස්ත්‍රකාමීන්ගේ සිප්හල බවට පත්විය. මෙසේ ඥාන ගවේෂණයේ පෙරමං සලකුණු කළ විද්‍යාලංකාර ශාස්ත්‍ර නිකේතනයේ මහගෙදර රත්මලාන පුරාණ විහාරය බව අමුතුවෙන් කිව යුතු නොවේ. විද්‍යාලංකාරයේ මහගෙදර පිළිබඳ මෙවැනි අතීතාවර්ජනයක යෙදීම අපට වැදගත් වන්නේ එය අපේ උරුමය මෙන් ම අපේ මූලය ආරක්ෂා කර තැබීමේ යුගකාරක අවශ්‍යතාව නිසා බව ප්‍රථමයෙන් ම කිව යුතුව ඇත.

විද්‍යාලංකාර පළමු පරිවේණාධිපති ව වැඩ සිටි බෝධිසත්ව ගුණෝපේත රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1887 අගෝස්තු මස 15 වැනි දින අපවත්වීමෙන් පසුව උන්වහන්සේගේ අග්‍රගණ්‍ය ශිෂ්‍යරත්නය වූ ධර්මාරාම ස්වාමීන්ද්‍රයෝ විද්‍යාලංකාර පිරුවන්හි දෙවන පරිවේණාධිපතීන් වහන්සේ බවට පත්වූහ. උන්වහන්සේ ස්වකීය ගුරුදේවයන් වහන්සේ කෙරෙහි තමන් වහන්සේ තුළ තිබූ අසීමිත ගුරු ගෞරවය නිසාම ස්වකීය උපන් ගම කලපළුවාව වුවත් එය පසෙකලා රත්මලානේ ධර්මාරාම ලෙස භාවිත කිරීමට තරම් සත්පුරුෂ වූහ.

උන්වහන්සේ අත්සන් කිරීමේ දී පමණක් 'කේ. ධර්මාරාම' ලෙස භාවිත කර ඇත.

උන්වහන්සේ විද්‍යාලංකාර පිරිවන්හි පරිවේණාධිපති බවට පත්වීමත් සමඟම රත්මලානේ පුරාණ විහාරයේ ද විහාරාධිපති බවට පත් වූහ. එහෙත් රත්මලානේ ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය රත්නය මෙන් ම ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ සහෝදරයා වූ වඩුවාවේ සෝභිත මහා ස්ථවිරයන් වහන්සේ විද්‍යාලංකාර පරිවේණාස්ථානයේ හෝ රත්මලාන පුරාණ විහාරයේ හෝ අධිපති බවට පත් නොවී ය. එයට හේතුව වඩුවාවේ සෝභිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ විද්‍යාලංකාර පරිවේණාධිපති ධුරයට පත් නොවී ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අදහස අනුව ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ විද්‍යාලංකාර පරිවේණාධිපති බවට පත්වීමයි.

සාර්වභෞම පණ්ඩිත රත්මලානේ ශ්‍රී ධර්මාරාම කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විද්‍යාලංකාර පරිවේණාධිපතීන් වහන්සේ හැටියටත්, රත්මලාන පුරාණ විහාරයේ අධිපතීන් වහන්සේ හැටියටත් සක්‍රීයව සියලු කටයුතු සිදු කරගෙන ගිය බවට අවශ්‍ය තරම් සාධක හමුවේ.

ඒ අතර ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අභාවයෙන් අර්ධ ශතවර්ෂයක් පිරීම නිමිත්තෙන් පළවූ "ශ්‍රී සුමංගල" ශාස්ත්‍රීය සංග්‍රහයෙහි එන,

"ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසකත්වයෙන් රත්මලානේ පුරාණ විහාරයෙහි දායක සභාව විසින් 1904 දී එවකට ගැළපෙන සැලැස්මකින් මනෝහර ධර්ම ශාලාවක් කරවා, එහි ධර්ම දේශනාවක් සඳහා ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වැඩම වූහ. චතුරාර්ය සත්‍යය මාතෘකා කොටගත් ධර්ම දේශනා පන්තියෙහි තෙවැනි නිරෝධ සත්‍ය දේශනාව උන්වහන්සේගේ දේශනාවාරය විය. හික්කඩුවේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ධර්ම දේශනාවන් සඳහා වැඩමවන සිරිතක් නැතත් ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ බලවත් ඕනෑකම නිසා ආරාධනාව පිළිගත්හ.

මේ පුරාණ විහාරස්ථානය ගැන මා සලකන්නේ මාගේ ඉගෙනීම සඳහා මට උපකාර වූ ගුරු භූමියක් වශයෙනි. මා මෙහි නැවතී සිට මාගේ ආචාර්ය වූ වලානේ ශ්‍රී සිද්ධාර්ථ මාහිමියන් වහන්සේගේ ශිෂ්‍යවරයකු වශයෙන් ඉගෙන ගත් අවධියෙහි මගේ ආවාසය තිබුණේ මේ ධර්මශාලාව සාදවා තිබෙන තැන දෝයි මම සිතමි. අප මෙහි වැඩමවීම ගැන විහාරාධිපති අපේ ශ්‍රී ධර්මාරාම නායක ස්ථවිර තැනට හා දායක සභාවටත් අපගේ ආදරය හිමිවෙයි."යන

උද්ධෘත පාඨය සාක්ෂ්‍යය සපයයි.

සාර්වභෞම පණ්ඩිත රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ව්‍යවහාර වර්ෂ 1918 මැයි මස 03 වැනි දා අපවත් වූහ. උන්වහන්සේගේ අපවත් වීමෙන් පසුව විද්‍යාලංකාර පරිවේණාධිපති ධුරයට පත් වූයේ ලුණුපොකුණේ ධර්මානන්ද (මුලදී ලුණුපොකුණේ රතනපාල) කොළඹ හලාවත දෙදිසාවේ උප ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ යි. මුන්වහන්සේ ද,



රත්මලානේ ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගත් මඟ ම ගෙන ස්වකීය උපන් ගම වූ 'ලුණුපොකුණ' වෙනුවට 'රත්මලානේ ධර්මානන්ද' යනුවෙන් භාවිත කළ අතර, අත්සන් කිරීමේ දී 'එල්. ධර්මානන්ද' ලෙස භාවිත කර ඇත.

රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යරත්නය ධර්මානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ නොවුණි. උන්වහන්සේගේ වැඩිමහල් ශිෂ්‍යයා වූයේ උඩවෙල සුමන ස්ථවිරයන් වහන්සේ ය.. එහෙත් ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සුජීවත්ව වැඩ සිටිද්දී උන්වහන්සේගෙන් පසුව විද්‍යාලංකාර පරිවේණාධිපතීන් වහන්සේ විය යුත්තේ ධර්මානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අධිපතිත්වය හා භාරකාරත්වය යටතේ පැවති සියල්ලෙහි ම අධිපතිත්වයට හා භාරකාරත්වයට විද්‍යාලංකාර පරිවේණාධිපති, කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පත්වූහ.

**මෙම ලිපියේ ඉතිරි කොටස වප් අව අටවක පෝදා (17 ) බුදුසරණ අන්තර්ජාල කලාපයේ පළවේ.**

---

විද්‍යාලංකාර සභාවේ සමලේකම්

**උඩගලදෙණියේ ධම්මවිමල**


## සිරි සදහම් පැන විසඳුම්

**සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුර ලියා එවා ගුණසේන සහ සමාගමෙන් "මහ පිරිත් පොත් වහන්සේ " ධර්ම ග්‍රන්ථය හිමිකර ගන්න.**

බුදුසරණ

සතියේ ප්‍රශ්නය - 88

**සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ**

**අට මහා පින්කම් අතර උසස්තම පින්කමක් නම් කරන්න**

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

පිළිතුර : ........................................


නම : ........................................

නිවසේ ලිපිනය : ........................................

........................................

දුරකතන අංකය : ........................................

ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම් , බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10



# භාග්‍යවතුන් වහන්සේ දැකීමට තබන පියවර

***සතං හත්ථී සතං අස්සා සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි ආමුත්ත මණිකුණ්ඩලා
ඒකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝන්ති සෝළසිං***

**"ඇතුන් සිය දහසක් ද අශ්වයන් සිය දහසක් ද, වෙළඹ සියදහසක් ද, රිය සියදහසක් ද, මැණික් කුණ්ඩලාභරණයන්ගෙන් සරසන ලද කන්‍යාවන් සියදහසක් ද (යමකුට ලැබුණේ ද භාග්‍යවතුන් වහන්සේ දක්නට යන්නහුගේ) එක් පියවරක සොළොස්වන කලාවෙන් කලාවටත් නොඅගී."**

ඉහත සඳහන් කරනු ලැබුවේ සංයුත්ත නිකායේ යක්ඛ සංයුත්තයේ අඩංගු සුදත්ත සූත්‍රයේ අඩංගු ධර්ම කොට්ඨාසයකුයි. අපි මෙම දහම් කතාව, දහම් අවබෝධය පිණිසත්, කෙලෙසුන් හි නැසීම පිණිසත් සතිය උපදවාගෙන විවරණය කර ගනිමු.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි වූ සීත වනයෙහි වැඩ වසන සේක. එකල්හි අනාථපිණ්ඩික ගෘහපති කිසියම් කටයුත්තක් පිණිස රජගහ නුවරට පැමිණියේ ය. අනාථපිණ්ඩික සිටුවරයාට මහා කාරුණික සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වූ සේකැ යි අසන්නට ලැබිණි. එසේ අසන්නට ලැබුණු මොහොතේ දී ම භාග්‍යවතුන් වහන්සේ දක්නට බලවත් සිතක් පහළ විය. එනමුත්, ඒ මොහොතේ දී ම අනාථපිණ්ඩික ගෘහපතීන්ට මෙවැනි අදහසක් ද පහළ විය. භාග්‍යවතුන් වහන්සේ, දකින්නට අද යාම සුදුසු නොවේ. හෙට දිනයේ භාග්‍යවතුන් වහන්සේ දකින්නට යමි'යි යන අදහසින් භාග්‍යවතුන් වහන්සේ සිහිකර ගෙනම නින්දට සැරසුණේ අලුයම යැයි සිතා තුන් වරක් ම නැඟී සිටියේ ය.

ඉන්පසු ගෘහපති සොහොන් දොර වෙත පැමිණියේ ය. අමනුෂ්‍යයෝ දොර විවෘත කළහ. අනාථපිණ්ඩික ගෘහපති නුවරින් නික්මෙද්දී එළිය අතුරුදහන් විය. අඳුර පහළ විය. ගෘහපතීන්ගේ සිතට බිය සහ තැති ගැනීම් ද ඇති විය. මේ නිසා ආපසු හැරී යන්නට සිත් විය. ඒ අවස්ථාවේ සීවක නම් යක්ෂයා නොපෙනෙමින් ඉහත සඳහන් කළ ගාථාව ඇසෙන්නට සැලැස්වීය.

මෙසේ පවසමින් ගෘහපතීන්ව උනන්දු කළේ ය.

ගෘහපතියෙනි ඉදිරියට යන්න. ඉදිරියට ම යන්න. නුඹගේ ඉදිරියට ම යාම සුදුසුයි. ආපසු යාම නොමැනවි යනුවෙනි.

එවිටම අඳුර අතුරුදන් වී ආලෝකය පහළ විය. යම් බියක්, තැති ගැනීමක්, ලොමු පණ ගැනීමක් වී නම් එය මේ නිසා සන්සිඳිණ.



බත්තරමුල්ල
සිරි සුදස්සනාරාම
සදහම් සෙනසුනෙහි
ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික
නා හිමි**

දෙවැනි, තෙවැනි වරට ද නැවතත් එළිය අතුරුදන් වී අඳුර පහළ වන විට ගෘහපතීන්ට බිය තැතිගැනීම් ලොමු පණ ගැන්වීම් ඇතිවී පෙරළා යාමට සිත් ඇතිවූයේ ය. සීවක යක්ෂයා පළ මු ගාථාව නැවතත් ඇසෙන්නට සලස්වා ඉදිරියට යන්න, ඉදිරියට යන්න. ඉදිරියට ම යාම මැනවි, ආපසු යාම නොමැනව යනුවෙන් පැවසීය.

අඳුර පහවී ආලෝකය පැතිරිණි. යම් වූ ද බියක්, තැතිගැනීමක්, ලොමු පණගැනීමක් වූයේ නම් එය සන්සිඳිණි. ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපති ශීත වනයට ගියේ ය.

මේ අවස්ථාවේ භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම නැඟිට එළිමහනේ සක්මන් කරමින් වැඩ සිටින සේක. භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ දෙසට එන්නා වූ අනාථපිණ්ඩික ගෘහපති දුරදීම දුටු සේක. භාග්‍යවතුන් වහන්සේ සක්මනින් බැහැරව පනවන ලද ආසනයෙහි වැඩ සිටිමින් අනාථපිණ්ඩික ගෘහපතීන්ට

"සුදත්ත" මෙහි එන්න යි වදාළහ.

මෙහිදී අනාථපිණ්ඩික ගෘහපති, භාග්‍යවතුන් වහන්සේ විසින් මාගේ නමින් ම මට කථා කරන්නේ යැයි සතුටුව භාග්‍යවතුන් වහන්සේගේ දෙපා සමීපයෙහි හිසින් ගෞරව කොට මෙසේ ප්‍රශ්න කළේ ය.

භාග්‍යවතුන් වහන්ස, සුව සේ සැතපුණ සේක් ද?

භාග්‍යවතුන් වහන්සේ පතළ මහා කරුණාවෙන් මෙසේ වදාළහ.

"යමෙක් කාමයන්හි නොතැවරේ ද? කෙලෙස් ගිනි නැති බැවින් සිහිල් වූයේ ද? කෙලෙස් රහිතව පිරිනිවියා වූ ඒ පැවිදි උතුමෝ හැම කල්හි ඒකාන්තයෙන් සුව සේ සැතපෙයි"

"සියලු තෘෂ්ණාවන් සිඳ, හෘදය ඇසුරු කළ විඩාව දුරු කොට සිත්හි සන්සිඳීමට පැමිණි උපශාන්ත වූයේ සුව සේ සැතපෙයි."

මෙම සදහම් පෙළ විවරණය කර ගනිමු. යමෙක් කාමයන්ගෙන් සන්සිඳුණේ ද ඒ සිත සන්සුන් ය. සුවපත් ය. වස්තු කාම සහ ක්ලේශ කාමයෝ පෘථග්ජන සිත් රාග ගින්නෙන්, ද්වේශ ගින්නෙන්, මෝහ ගින්නෙන් අවුලවති. මේ නිසා එවැනි කාමයෙන් දැවෙන, තැවෙන සිත් ඇති යමකුට සුව නින්දක් නොව සුවපත් වූ සිතකින් මොහොතක් හෝ ගත කළ හැක්කේ දැයි සැක සහිත ය. වස්තු කාමයන්ට හසුවුණේ මහා සාගරයට ජලය ගලා එන්නාක් මෙන් ද, ගින්නට දර දමන්නාක් මෙන් ද සෑහීමක් නොවන්නේ ය.

මහිච්ඡතා නම් වූ දුර්ගුණයෙන් යුක්ත වූයේ කොපමණ ලැබුවත් සෑහීමකට පත්නොවන්නා සේ ම තිබෙන වස්තුව පවා නිසි ලෙස පරිහරණය නොකොට වස්තුවකට අරක්ගත් රාක්ෂයෙක් සේ ද, තෘෂ්ණාවෙන් සහ ඒ නිසා හටගත් බියෙන්, සැකයෙන්, ඊර්ෂ්‍යාවෙන් යුතුව කල් ගෙවයි.

පළඟැටියා පහන් දැල්ලට සමීප වී මිය යන්නාක් මෙන්, වස්තු කාමයෙන් මුසුපත් වූවෝ එයින් ම දුක් විඳ කයින් ද මනසින් ද දුබල වී මිය යති. මරණින් මතු බොහෝ ලෙස දුක් දෙන නිරයක උපදිත්.

"තෝදෙය්‍ය" නම් බමුණාගේ කථාව මෙයට නිදසුනකි. වස්තු තණ්හාවෙන් මියගිය බමුණා තම නිවසේ ම සුනඛ දේනුවකගේ කුසින් සුනඛ පෝතකයෙක් ව උපත ලැබීමයි.

ක්ලේශ කාමයන්හි කතාව මෙයටත් වඩා භයානක ය. ලෝභ, දෝස, මෝහ ලෙසිනුත් නැවතත් ලෝභ, දෝස, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ථීන, උද්දච්ච, අහිරික, අනොත්තප්ප ලෙස දස ආකාරයකින් පසුව එක්දහස් පන්සියයක් ලෙසිනුත් දක්වා තිබේ.

භාග්‍යවතුන් වහන්සේ, කාමයෝ අල්ප ආස්වාද ඇතියහ. බොහෝ දුක ඇතියහ. බොහෝ උපායාස (බලවත් සිත් තැවුල්) ඇතියහ. බොහෝ දුක් සහිත ආදීනව වදාරන ලදහ. කාමයෝ ඇටසැකිල්ලක් වැනිය යි... දෙසූහ.


මෙසේ බොහෝ දුක් දෙන, තවන, දවන, කාමාදී කෙලෙස්වලින් සන්සිඳුණේ, එසේ සන්සිඳුණු රහතන් වහන්සේ උපශාන්තව, අති පාරිශුද්ධියට පත් වූ හදවතින් යුතු වූයේ, සුව සේ සැතපෙයි.

ඉතාමත් කෙටියෙන් විවරණය කළ සදහම් පෙළ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ වූ අපගේ ශාස්තෘවරයාණන් වහන්සේ කෙරෙහි බලවත් ශ්‍රද්ධා ගුණය දියුණු කොට ගෙන අනාථපිණ්ඩික ගෘහපතීන්ගේ, භාග්‍යවතුන් වහන්සේ දැකීම ද සිතට නඟාගෙන උතුම් වූ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධය පිණිස වීරිය දරමු.

## ප්‍රහේලිකා අංක 27

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය බෞද්ධාලෝක පදනම
බෞද්ධාලෝක පදනම
BAUDDHALOKA FOUNDATION

***බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් සම්මානිත ආචාර්ය කේ. එල්. ඒ. රණසිංහ මහතා විසිනි.***




**හරහට**

1. මහාමායා දේවිය උපන් නුවරයි.
3. බුදුරදුන් පිරිනිවන්පා වදාළේ මෙම රජුන්ගේ රාජධානියෙහිදීය.
5. භාවනානුයෝගීන් වසන පෙදෙස මෙනම් වනය ලෙස හැඳින්වේ.
7. යුද්ධ කරන අරුත දෙන විශේෂණ පදයකි.
8. ඉදිරියට විහිදෙන ශබ්ද මෙනම් වෙයි.

**පහළට**

1. දකුණු ඉන්දියාවෙන් පැමිණි මෙම දෙවියන් ගැන ශාන්තිකර්ම විෂයෙහි කියැවේ.
2. මෙම වර්ණයෙන් පරිසරය පවත්වා ගැනීමට උනන්දුවක් දැනට පවතී.
3. කුස ජාතකයේ එන පබාවතිය විසූ දේශයයි.
4. ලාකඩ සඳහා භාවිතවන නාමයකි.
6. මෙනම් කුඩා වේදිකාවක් මත නංවා අතපැන් වත්කිරීම බෞද්ධ විවාහ චාරිත්‍රයයි.
8. අකුසල මූලයන්ගෙන් එකකි.

**පිරුවානා පොත් වහන්සේ ඇතුළු වටිනා ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්,
ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ
ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා,
එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

**ජීවිතයේ එක් වරක් හෝ දඹදිව වන්දනා කර ගැනීම බෞද්ධ අපගේ සිතෙහි ඇති ඉමහත් බලාපොරොත්තුවක්. ගත වූ අවුරුදු තුන පුරාම එය ගිලිහී ගියේ මුළු ලෝකය පුරා පැතිරී ගිය කෝවිඩ් වසංගතය නිසයි. එහෙත් මේ වන විට වසංගත තත්ත්වය කෙමෙන් පහව යමින් පවතිනවා. දඹදිව වන්දනා කිරීමට කැමැති ඔබට ඒ පිළිබඳ විස්තර දැන ගැනීමට අවශ්‍යතාවක් ද පවතිනවා විය හැකියි. එනිසාම නැවත ආරම්භ වන දඹදිව චාරිකා සිදුවන අයුරු අප විදේශ බෞද්ධ චාරිකා සංවිධායකයන්ගේ සංගමයේ ලේකම් ආචාර්ය මහේන්ද්‍ර හල්ඔලුව මහතා සමඟ සාකච්ඡා කළ අතර, මේ එතුමා දැක් වූ අදහස් ය.**



# දඹදිව චාරිකා නැවතත් සෞඛ්‍යාරක්ෂිතව ඇරඹෙයි

බෞද්ධ අප හැමගේ ම සිහිනයක් තමයි අපගේ බුදුරජාණන් වහන්සේ සම්බන්ධ සුවිශේෂ වූ ස්ථාන සියැසින් දැකබලා වන්දනා කර ගැනීම. එහෙත් පසුගිය අවුරුදු තුන පුරාම ලෝකය පුරා පැතිරී ගිය වසංගත රෝගය නිසා මෙම වන්දනා ගමන් තාවකාලිකව නවතා දමන්නට සිදු වුණා.

දැන් ඒ තත්ත්වය සාමාන්‍යකරණය වී තිබෙන නිසා රජයේ පූර්ණ අනුග්‍රහය මත නැවත වතාවක් අප වන්දනා නඩ රැගෙන යාම ආරම්භ කළා. බුද්ධ ශාසන අමාත්‍යංශය සහ සෞඛ්‍ය අමාත්‍යංශයේ නිර්දේශ මතයි අපි ඒ සුවිශේෂ කටයුත්ත නැවත ආරම්භ කළේ.

මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යංශය යම් යම් සීමා පනවලයි තිබෙන්නේ. ලියාපදිංචි එක් ආයතනයකට එකවර වන්දනාකරුවන් රැගෙන යා හැක්කේ 45 ට අඩු පිරිසක් පමණයි. මේ වන විට අප සංගමයේ ලියාපදිංචි ආයතන 282 ක් පමණ තිබෙනවා.

රජය මෙම ව්‍යාපාරය නැවත කරගෙන යාමට අපට අවසර දුන් නිසා අප මැදිහත් වෙලා ඉන්දියාවේ සිද්ධස්ථානවල සිටි අපගේ ස්වාමීන් වහන්සේ සමඟත්, එරට බලධාරීන් සමඟත් සාකච්ඡා කළා. ඔවුන් අපට පැවසුවේ මේ වන විට වසංගත රෝගයෙන්



ඉන්දියාව සම්පූර්ණයෙන් ම සුරක්ෂිත බවයි. අද වන විට ඇතැම් සංවිධායකවරුන් විසින් මගීන් 45 ට අඩු කණ්ඩායම් පහක් ඉන්දියාවට ගොස් නැවත ලංකාවට පැමිණ තිබෙනවා. ඔවුන් කිසිදු කරදරයක් නැතිව පැමිණ ඇති බව සඳහන් කරන්නේ සතුටෙන්.

මේ වකවානුවේ අප 45 ට අඩු පිරිසක් රැගෙන යන්නේ හේතු කිහිපයක් නිසයි. එකක්, එරට බස්රථවල ආසන ප්‍රමාණයට. ඒ වගේ ම එරට දී එක කාමරයක රැඳවිය හැක්කේ දෙදෙනකු පමණයි. අපි මේ වසංගතයට පෙර 100 - 200 මගීන් ඇතුළත් කර වන්දනා නඩ දඹදිව රැගෙන ගියා. නමුත් අද වන විට එය 45 ට අඩු කර තිබෙන නිසා මගියාට උපරිම පහසුකම් දෙන්න සංවිධායකයෝ කටයුතු යොදා තිබෙනවා.

මේ වන්දනාකරුවන්ගෙන් එක් අයකුට හෝ වෛරසය තිබෙන බව හඳුනාගත්තොත් ඔහු සුව කර නැවත ලංකාවට එනතුරු සම්පූර්ණ වගකීම සංවිධායකයා සතුයි. සෑම කෙනකුටම වතුර බෝතල්, විෂබීජ නාශක ලබාදීම මෙන්ම සෞඛ්‍ය නිර්දේශ මත ආහාරපාන ලබාදීමේ දී ද අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියක් හඳුන්වා දී තිබෙනවා. ඒ සියල්ල එලෙසම ඉටු කිරීම සංවිධායක සතු වගකීමක් වෙනවා.

මීට පෙර නොතිබුණු තවත් වාරණයක් වන්නේ අවුරුදු 80 ට වැඩි වැඩිහිටියෙක් ගමනකට සහභාගි වෙනවා නම්, ඔහුගේ වගකීම භාරගත හැකි පවුලේ කෙනකු ගමනට සම්බන්ධ විය යුතුමයි. ඒ වගේම ගමනට සුදුසු බව නිර්දේශ කළ පිළිගත් වෛද්‍යවරයකුගේ සහතිකයක් අවශ්‍ය වෙනවා.

මේ වසර තුළ දී අප ඉන්දියාව තුළ දුම්රිය ගමන් සිදු කරන්නේ නැහැ. එයට හේතුව වෛරසයෙන් අපි වැඩිදුරටත් ආරක්ෂා වීම සඳහායි. එනිසා අපි ලංකාවේ සිට බරණැසට හෝ ලංකාවේ සිට බුද්ධගයාවට නැත්නම් ලංකාවේ සිට දිල්ලියට ගුවන් මඟින් යාමට තීරණය කොට තිබෙනවා.

ඒ වගේම විශේෂයෙන් සඳහන් කළ යුතු වෙනවා සෞඛ්‍ය අමාත්‍යංශයෙන් සහ බුද්ධ ශාසන අමාත්‍යංශයෙන් නිර්දේශ නිකුත් කිරීමේ දී අපට දැනුම් දී තිබෙනවා සෑම මගියකුම සංචාරක රක්ෂණයකට යටත් කරන්න කියා. එය අවම වශයෙන් ඩොලර් දස දහසක් වෙනවා.

ඉන්දියාවේ දී යම් හේතුවක් නිසා වන්දනාකරුවෙක් මියගියහොත් ඒ මුදල ඔහුට හිමි වෙනවා. අපි සෑම සංවිධායකවරයකුම දැනුවත් කර තිබෙනවා සෑම නඩයක් සමඟම ස්වාමීන් වහන්සේ නමක් වැඩමවා ගන්න කියලා. ඒ සිල් සමාදන් කරවීමට සහ වන්දනා කටයුතු පහසුව සඳහා යි. ඒ වගේම අපි වෛද්‍යවරයෙක් හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ දැනුම් තේරුම් ඇති අයෙක් හෝ වන්දනාවට සම්බන්ධ කර ගන්නට කියා උපදෙස් දෙනවා. එහෙම නැතත් සැවැත්නුවර, දිල්ලිය වගේ නේවාසිකව නවාතැන් ගන්න ස්ථානවල වෛද්‍ය පහසුකම් සලසා තිබෙනවා.

*ඉතිරිය 23 පිටුවට ...*



22 පිටුවෙන් ...

අපේ රටේ භික්ෂූන් වහන්සේ මුල් වීමෙනුයි ඒ සේවය සපයා දෙන්නේ. ඒ රටේ වෛද්‍යවරයෙක් සම්බන්ධ කරගෙන එය වන්දනා සමයට පමණක් සීමා කර තිබෙනවා.

සම්පූර්ණ ගමන දින 12 අවසන් කළයුතු බවයි සෞඛ්‍ය අංශ අපට දැනුම් දී තිබෙන්නේ. දින 12 වුවත් සියලු ස්ථාන වන්දනාමාන කරන අතර ගුවන් යානා වලින් පමණක් ගමන් කරන නිසා දින කීපයක් ඉතිරි වෙනවා. දින 21 චාරිකාව තමයි මෙසේ දින 12 ට සීමා කර තිබෙන්නේ.

වන්දනාවට යන මගියෙකුට ඩොලර් 100 ක මුදලක් පමණයි රටින් පිටතට රැගෙන යා හැකි වන්නේ. දින 12 ගමනට ඒ මුදල ප්‍රමාණවත්. ඒ ඩොලර් 100 මගියා පෞද්ගලිකව දරාගත යුතු වෙනවා. ඒ වගේම පසුගිය දිනක අප සංගමය ඇමැතිවරයා සමඟත් සාකච්ඡාවක් පැවැත්වූවා. දඹදිව චාරිකා නැවත ආරම්භ කිරීම පිළිබඳව. එහිදී අදහස් ඉදිරිපත් වුණා.

දැන් අප රට විශාල ඩොලර් අර්බුදයකට මුහුණ දී තිබෙන නිසාත්, ගුවන් ටිකට් පත් අධික මිලක් නිසාත් එයට විකල්පයක් ලෙස මගී නෞකාවකින් කල්කටා දක්වා ධාවනය කිරීමට. කල්කටාවල සිට බුද්ධගයාවට පැය 06 ක පමණ දුරක් තිබෙන්නේ. එය ගුවන් ගමනට වඩා අඩු මුදලකට කර ගන්න පුලුවන් වේවි.

ඒ වගේම අපි ඔබව දැනුවත් කරනවා ඔබ දඹදිව වන්දනාවට යනවා නම්, ඒ සංවිධායක පිළිබඳ හොඳින් විස්තර සොයා බලන්න. ඔහුගේ පළපුරුද්ද, මීට පෙර චෝදනාවලට ලක් වී තිබෙනවා ද? කියා සොයන්න. ඒ සියලු දේ ඔබ මුදල් ගෙවීමට පෙර සිදු කරන්න.

තොරතුරු සෙවීමේ දී බුද්ධ ශාසන අමාත්‍යංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමා හෝ අප මවු ආයතනය සමඟ සම්බන්ධ වීමට ඔබට පුළුවන්. සංවිධායක විසින් ඔබට යම් අසාධාරණයක්, අවැඩක් සිදු කළා නම් ඔබ බුද්ධ ශාසන අමාත්‍යංශය හෝ අපගේ සංගමය දැනුවත් කරන්න. එවිට අපි ඒ ගැන සොයාබලා ඔවුන්ට විරුද්ධව කටයුතු කරනවා.

එලෙසම ඔබ කෙතරම් දඹදිව වන්දනා කිරීමට ආශාවෙන් සිටියත් ඔබට, හෘද සැත්කම්, වකුගඩු සැත්කම් වගේ සැත්කම් කර තිබෙනවා නම් අනිවාර්යයෙන් ම සංවිධායකවරයා දැනුවත් කළ යුතු වෙනවා.

බොහෝ වයෝවෘද්ධ වූ පසු එවැනි වන්දනාවකට සහභාගි වූවොත් ඔබට ඒ වන්දනාවෙන් උපරිම ප්‍රයෝජන ගතහැකි වන්නේ නැහැ. එනිසා ඔබට ශරීර ශක්තිය ඇති කාලයේ මෙවැනි වන්දනාවකට සහභාගි වන්න කියා මම යෝජනා කරනවා.

මීට පෙර පෙබරවාරි සිට මාර්තු දක්වාත්, ජුලි සිට නොවැම්බර් දක්වාත් පමණයි අප වන්දනා නඩ රැගෙන ගියේ. එහෙත් දැන් ජනවාරි, අප්‍රේල්, දෙසැම්බර් මාස හැර අන් සියලු මාසවල වන්දනාකරුවන් රැගෙන දඹදිව යාමට බලාපොරොත්තු වෙනවා.

අපි කිනම් මොහොතක හෝ මිය යා හැකියි. තව කල්ප ගණනකට අපට තව බුදුරජාණන් වහන්සේ නමක් දැක බලා ගත්තා සේ වන්දනා කර ගැනීමට පුලුවන් කමක් නැහැ. ඒ නිසා අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ දැකබලා වන්දනා කර ගැනීමට ඔබට අවස්ථාව උදා වන්නේ මේ දඹදිව චාරිකාවට එක්වීමෙන් පමණයි. එනිසා බෞද්ධයකු ලෙස දැක බලා සංවේගය ඇතිකර ගත යුතු ස්ථාන වන්දනා කොට ඒ අසිරිමත් අත්දැකීම විඳගන්න කියා ඔබට ආරාධනා කර සිටිනවා.

නයනා නිල්මිණී

**ඔබ දඹදිව වන්දනාවට යනවා නම්, ඒ සංවිධායක පිළිබඳ හොඳින් විස්තර සොයා බලන්න. ඔහුගේ පළපුරුද්ද, මීට පෙර චෝදනාවලට ලක් වී තිබෙනවා ද? කියා සොයන්න. ඒ සියලු දේ ඔබ මුදල් ගෙවීමට පෙර සිදු කරන්න.**












# අනගාරික ධර්මපාලතුමාගේ ශාසනික සේවය මගේ ශක්ති ප්‍රමාණයෙන් ආරක්ෂා කරනවා

**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ**

**මහා විහාරවංශික ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ජපානයේ ප්‍රධාන සංඝනායක ශ්‍රී ලංකා මහා බෝධි සමාගමේ සභාපති ඉන්දියාවේ සාංචි චේතියගිරි විහාරාධිපති ජපානයේ ලංකාජි විහාරාධිපති**

## පූජ්‍ය බානගල උපතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.



**සමාජයේ විවිධ ක්ෂේත්‍රයන්හි උන්නතිය උදෙසා උසස් සේවාවක නියැළෙන ජාත්‍යන්තර කීර්තිධර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වන ඔබ වහන්සේ මෙතෙක් සිදු කරන ලද සමාජ මෙහෙවර සනිටුහන් කරමින් සාකච්ඡාව ආරම්භ කරමු අපේ හාමුදුරුවනේ,**

1931 වර්ෂයේ මැයි මස 31 වැනිදා ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ආරම්භ කළ ශ්‍රී ලංකා මහාබෝධි සමාගම මූලස්ථානය කර ගෙන ජාත්‍යන්තර ධර්මදූත සේවාවේ යෙදෙමින් ජාතික, ආගමික, ශාසනික ප්‍රගමනයට නව පණක් ලබා දුන්නා. ඒ වගේම බුද්ධගයා පුදබිමේ උරුමය ආරක්ෂා කිරීමටත්, බුදු දහම ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ලංකාවේ ආගමික, සමාජ, අධ්‍යාපනික ප්‍රගතියට දායකවීමට ලැබීමත් විශාල සතුටක්. ශ්‍රී ලංකාව තුළ පමණක් නොවෙයි, ඉන්දියාව, ජපානය, දකුණු කොරියාව, නේපාලය, බුරුමය, තායිලන්තය, සිංගප්පූරුව, මැලේසියාව, තායිවානය, හොංකොං, පිලිපීනය ආදි රටවලත් එම සේවය පිළිබඳ ප්‍රසාදයට පත්වුණා.

ඉන්දියාවේ සාංචි චේතියගිරි විහාරයේ වැඩ සිටිමින් සාංචි විශ්වවිද්‍යාලය ආරම්භ කළා. එම විශ්වවිද්‍යාලය භික්ෂූන් වහන්සේ පුහුණු කරන මධ්‍යස්ථානයක් පමණක් නොවෙයි, ලෝකයේ විවිධ විද්වතුන්ට බුදුදහම පිළිබඳ පර්යේෂණ පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා තිබෙන ස්ථානයක්. එම ධර්මදූත මෙහෙවර අගය කිරීමක් වශයෙන්, ඉන්දීය රාජ්‍ය අනුග්‍රහය ලැබුණා. ඒ වෙනුවෙන් ඉන්දීය මධ්‍ය ප්‍රදේශයෙන් හෙක්ටයාර් 65ක භූමි භාගයක් පරිත්‍යාග කරමින් ගෞරව දැක්වීමත් ශ්‍රී ලංකාවට විශාල ගෞරවයක්. ඒ වගේම සාංචි විහාරාධිපති වශයෙන් විශ්‍රාම ශාලා ඉදිකරමින් එම ප්‍රදේශයේ දියුණුවට කටයුතු කළා. 1956 වර්ෂයේ දී ඇතිවුණ බෞද්ධ පිබිදීමත් සමඟ ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල විහාරස්ථාන ආරම්භ කරමින් එම විහාරස්ථානවලට භික්ෂූන් වහන්සේ නමක් වැඩම කරමින් බුදුදහමේ ප්‍රවර්ධනය වෙනුවෙන් කටයුතු කළා. සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය චිරස්ථිතිය වෙනුවෙන් ශාසනානුලෝමී හැඟීමෙන් කටයුතු කරන සුපේශල ශික්ෂාකාමී ශිෂ්‍ය පරපුරක් බුදුසසුනට දායාද කළා. උන්වහන්සේ විහාරස්ථාන ආරක්ෂා කරගෙන ශාසනයේ උන්නතිය වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කරනවා. ඉන්දියාවේ ධර්මදූත සේවය සිදු කරමින් ජපානයට ථෙරවාදී බුදුදහම හඳුන්වාදීමට 1984 වර්ෂයේ දී වෙසක් පොහොය දින ජපානයේ පළමු ථෙරවාදී විහාරස්ථානය වශයෙන් ලංකාජි විහාරස්ථානය ආරම්භ කිරීමට අවස්ථාව ලැබුණා. ජපන් විහාරස්ථානය ඉදිකිරීමත් සමඟ ජපානයත්, ශ්‍රී ලංකාවත් අතර ආගමික, සංස්කෘතික, සාමාජික මිත්‍රත්ව සබඳතාවල අලුත් යුගයක් ආරම්භවීමත් විශාල සතුටක්.

ඒවගේම ජපානයේ තිබෙන ක්‍රමවත් ළදරු අධ්‍යාපනය ලංකාවටත් ලබා දීමට ලොකු අවශ්‍යතාවක් ඇති වුණා. ඒ අනුව ටෝකියෝ නිහොංගෝ ගත්තෝ පාසලෙන් ජපන් ළදරු අධ්‍යාපනය හොඳින් අධ්‍යයනය කළා. එම ක්‍රමවත් ළදරු අධ්‍යාපනය අපේ රටේ දරුවන්ටත් ලබා දීමේ අරමුණෙන් යොෂිඩා මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් සපුගස්කන්ද යොෂිඩා ළදරු පාසල ආරම්භ කළා.




ජපානයේ නරිතසන්, ෂිබමතා තායිසි කුකෙන්, සේයිගොයින්, ෂෝකන්ජනි ආදි විහාරස්ථාන, අශෝක ළදරු අධ්‍යයන ආයතනය, ලුම්බිණී ළදරු පාසල, සහජෙකා ආයතනය ඇතුළු ජපානයේ ප්‍රමුඛ විහාරස්ථාන, සමාජසේවා ආයතන රාශියක් සමඟ ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්ව සබඳතා ගොඩනඟමින්, ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු බෞද්ධ පරිසරයක ළමා අධ්‍යාපනයත් සමඟ සමාජ සංවර්ධන සේවා රාශියක් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කැපවුණා. ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් ම ආවරණය වන පරිදි ළදරු පාසල් ආරම්භ කළා. ඒවා බොහොම සාර්ථකව ක්‍රියාත්මක වෙනවා.

ඒ වගේම මහා බෝධිගම, සුරුමීගම, බානගල නරිතසන්ගම යන ගම්මාන බිහිකරමින් 500කට අධික නිවාස ප්‍රමාණයක් පරිත්‍යාග කළා.

අනතුරුව සාංචි චේතියගිරි විහාරයේ 50 වැනි සංවත්සරය නිමිත්තෙන් ගෝපාල් නුවර පැවැති ජාත්‍යන්තර බෞද්ධ සම්මේලනය, කොළඹ මහාබෝධි සමාගම පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, චීන ජනතා දේශපාලන උපදේශක සභාව සංවිධානය කළ ප්‍රථම ජගත් බෞද්ධ සම්මේලනය ආදි ජාත්‍යන්තර වැදගත්කමින් යුත් බොහෝ සම්මේලන සඳහා ආරාධිත දේශකයකු ලෙස සහභාගිවීම ලංකාවට විශාල කීර්තියක්. අනගාරික ධර්මපාලතුමා දියත් කළ ධර්මදූත සේවාව ධර්මදූත ස්වාමින් වහන්සේ නමක් වශයෙන් ඉදිරියට රැගෙන යාමට තවදුරටත් කැප වෙනවා.

කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව 1986 වර්ෂයේ දී ජපානයේ ප්‍රධාන සංඝනායක ධුරයෙන් සම්භාවනාවට පාත්‍ර කළා. ඒ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සිදු කළ ජාතික, ආගමික, ශාසනික සමාජීය සේවාවන් ඇගයීමට පාත්‍රවුණ අවස්ථාවක්.

**ප්‍රතිබල සම්පන්න භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් මේතරම් විශාල භාරදූර කාර්යභාරයක් ඉටුකිරීමට ලැබුණු ශාසනික ආභාසය මොනවගේද නායක හාමුදුරුවනේ,**

සැදැහැති මව්පියන්ගෙන් ලැබුණු ශාසනික උරුමයත්, සංසාරගත පුණ්‍යශක්තියක් මත භාරතයේ සංඝ නායකව වැඩ සිට අපවත්වී වදාළ බෝධිසත්ත්ව ගුණෝපේත හැඩිගල්ලේ පඤ්ඤාතිස්ස නාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1967 වර්ෂයේ ඔක්තෝබර් 19 වැනි දින බානගල උපතිස්ස යන උතුම් ශාසනික නාමයෙන් උත්තරීතර සම්මා සම්බුද්ධ ශාසනයේ සසුන්ගත වුණා. එ වගේම සාර්වභෞම වියත් පඬිවරුන් වන බානගල සීලරතන නාහිමිපාණන් වහන්සේ, මැටිවල සංඝරතන නාහිමිපාණන් වහන්සේ, ආචාර්යන් වහන්සේ වුණ බවත් පුණ්‍යානුමෝදනා පූර්වකව කෘතවේදී ව සිහිපත් කළ යුතුයි. උන්වහන්සේගේ ඒ ආදර්ශ සම්පන්න භික්ෂු ජීවිත තුළින් ලැබුණු ආභාසයත් සමඟ අනගාරික ධර්මපාලතුමා මහාබෝධි සමාගම, වගේම ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳ කුඩා අවධියේ සිටම ලොකු අවබෝධයක් ලැබුණා. පැවිදි දිවියට ඇවැසි ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබාගෙන ඉන්දියාවේ සාංචි රජයේ උසස් අධ්‍යාපන උපාධි විද්‍යා ආයතනයෙන් ශාස්ත්‍රවේදී උපාධියත්, බෝපාල් විශ්වවිද්‍යාලයෙන් පුරාවිද්‍යාව ශාස්ත්‍රපති උපාධියත් ලබා ගත්තා. පසුකාලීනව ජපානයේ දී ජපන් භාෂා උසස් ඩිප්ලෝමා උපාධියත්, ළදරු අධ්‍යාපනය පිළිබඳ විශේෂ පාඨමාලාවකුත් හැදෑරීමට කටයුතු කළා. අනගාරික ධර්මපාලතුමාගේ ශිෂ්‍යයකු වුණ මැටිවල සංඝරතන හාමුදුරුවන්ගේ ශිෂ්‍යයකු වීම තුළින් අනගාරික ධර්මපාලතුමාගේ නොනිමි මෙහෙවර ඉදිරියට රැගෙන යාමට අවස්ථාව ලැබීම විශාල සතුටක්.

බොහෝ රාජ්‍ය තාන්ත්‍රිකයන් මුණගැසීමේ අවස්ථාවත් ලැබුණා. ජපන් අග්‍රාමාත්‍ය කයිෂු තොෂි අකි, ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍රමෝදි, ඉන්දීය ජනාධිපති ප්‍රතිභා පටෙල්, බුරුම අග්‍රාමාත්‍ය ජිග්මේ තින්ලේ, ඉන්දීය ජනපති ප්‍රනාබ් මුඛර්ජි , තායිලන්ත රජකුමරිය මහාචක්‍රි සිරින් දෝම්, පාකිස්තාන අග්‍රාමාත්‍ය නවාෂ් ෂ රීෆ්, පෘතුගාල අග්‍රාමාත්‍ය අන්ටෝනියෝ ලුවිස් සන්තෝෂ්ද කොස්තා ඇතුළු රාජ නායකයන් මුණගැසීමේ දුර්ලභ අවස්ථාවන් උදාවුණ බවත් සිහිපත් කළ යුතුයි.

**මෙයින් සියවසකට පමණ පෙර අනගාරික ධර්මපාලතුමා බෞද්ධ සමාජයේ බිඳවැටීම් පෙන්වා දුන්නත්, එයින් මිදීමට අපට නොහැකි වුණේ කුමන කරුණක් නිසාදැයි ශ්‍රී ලංකා මහා බෝධි සමාගමේ සභාපති ස්වාමීන් වහන්සේ වශයෙන් පැහැදිලි කරමින් අපේ සාකච්ඡාව අවසන් කරමු හාමුදුරුවනේ,**

ධර්මපාලතුමා දිවි හිමියෙන් ශාසනයට කැපවුණ කෙනෙක්. ජනතාව ආර්ථික වශයෙන් නඟාසිටුවීමට කර්මාන්ත ආරම්භ කළා. ඒ වගේම ලංකාව පුරා පාසල් 112 ක ප්‍රමාණයක් ගොඩනඟල තිබෙනවා. මේ වන විට බොහෝ පිරිසකට ධර්මපාල චින්තනය අමතක වෙලා තිබෙනවා. 2000 වර්ෂයේ දී තමයි මම මහා බෝධි සමාගමේ සභාපතින් වහන්සේ වශයෙන් පත් වුණේ. අපට හැකි ශක්ති ප්‍රමාණයෙන් ලංකාව, ඉන්දියාව, ජපානය වැනි රටවල ධර්මපාල ගුණානුස්මරණ උත්සව පවත්වමින් අපේ උරුමය රැකගෙන යාමට උත්සාහ කරනවා. විනාශ වෙමින් පැවැති බුද්ධගයාව ආරක්ෂා කර ගැනීමට අනගාරික ධර්මපාලතුමා මහා බෝධි සමාගම ආරම්භ කිරීමට පියවර ගත්තා. එම උදාර පරමාර්ථය ජයග්‍රහණය කිරීමට ආරම්භ කළ මහාබෝධි සමාගමේ සභාපතිධුරයත්, කොළඹ අග්‍රශ්‍රාවක මහා විහාරයේ විහාරාධිපතිධුරයත්, ඉන්දියාවේ සාංචි චේතියගිරි විහාරාධිපති ධූරයත් දරමින් අනගාරික ධර්මපාලතුමා ආරම්භ කළ ආගමික ශාසනික සේවය මගේ ශක්ති ප්‍රමාණයෙන් ආරක්ෂා කර ගෙන යෑමට කටයුතු කරනවා.

හේමමාලා රන්දුනු



# දළදාහිමි නමාමි

අසු හාර දහසක් වන දහම් කඳ
දෙසු මහිමිගේ ඒ සදහම් පහස ළඳ
විසු සුවඳ ගැල්වූ කරඬුවක මැද
නැසු සසර හිමි දළදා වඳිමි අද

අතපත් නෙලුම පුදදෙමි සමිඳුන් නමට
සිත අන් අතක නොයැමේ ඇතිවේ සතුට
නැත අන් සරණ ඔබ සරණ ම මිස දුකට
සතපා සිරස වඳිනෙමු දළදා හිමිට

**මාස්පොත ධම්මජෝති හිමි**
මීරිගම

# සෝතාපන්න සිත

බුදුගුණ බුදුගුණ මට සිහිවේවා
අවසන අවසන නිවන ම වේවා
භවයෙන් භවයට යන්න නොවේ වා
මේ බුදු සසුනෙම නිවන් දකීවා

දහම් දහම් ගුණ නිති සිහිවේවා
දහමට දහමට සිත යොමුවේවා
මිථ්‍යා දෘෂ්ටිය ඉන් දුරුවේවා
සැනසුම සැනසුම මට ළංවේවා

සඟගුණ සඟගුණ නිති සිහිකරමි
සසුනට සසුනට මගෙ වත පුදමි
දන් පිළිගන්වා පින් රැස්කරමි
මහ සඟ ගුණයට මගෙ හිස නමමි

සසරෙන් සසරට ආ දිවි ගමනේ
ඇතින් ඇතට මේ භව ගමනේ
තව දුර යන්නට නෑ හිත බැඳුණේ
අටවැනි භවයක් ගැන නෑ සිතුණේ

**ගාමිණී ජයලත් තල්දෙන**



# සදහම් සුවය

සුදොවුන් රජු පුත්
මායා මව් පුත්
මරු පරදා ලත්
බුදු බව ලැබ ගත්

යශෝධරාවත්
රාහුල පොඩි පුත්
හැරලා ගිහි ගෙන්
හිමි බුදුවූ වෙත්

හිමි පිරිනිවනට වැඩියත්
ධර්මය බබළත්
ඒ කෙසේද යත්
ධර්මය අකාලිකවෙත්

**අජිත් වික්‍රමනන්ද වීරපුරය**
පොල්ගහවෙල

# වප් පුන් පෝ දිනෙක



සම්බුදු සමිඳු ගෞතම අපෙ තිලොවග මුනිඳු
දෙව්රජු මවුට දෙසු දම් තව්තිස් පුරසුරිඳු
නිමකර යළිදු සංකස්සය පුර පසිඳු
වැඩිය පොහෝ දිනයි දිදුලන වප් පුර තරිඳු

මෙත් බෝසතුන් මතු බුදු වන ලොව්තුරා
පන්සියයක් සිය සගයින් පිරිවරා
සිත් සතොසින් පැවිදිව කහ සිවුරු දරා
වප් පුර පොහෝ දිනකයි බැඳුනේ සසුන කරා

**ඒ.එම්.අබේසිංහ බණ්ඩා**
මාපනාවතුර - මහනුවර

**අවිස්සාවේල්ලට නුදුරු**
ආරණ්‍ය සේනාසනයකට
**ත්‍රීවිල් රථයක් සහ වෑන් රථයක් පැදවීමට හැකි කැපකරු කටයුතු කිරීමටද කැමති කෙනෙකු අවශ්‍යයි.**
මුදලක් කථා කර ගත හැක.
**077-3310973**

**මල්වතු විහාර පාර්ශවයේ විහාරස්ථානයක පැවිදිකිරීමට කුලදරුවන් හා අවුරුදු 30 - 50 අතර වයසැති ස්වාමීන් වහන්සේලා අවශ්‍යයි.**
076-1308184

**තායිලන්තයෙන් ගෙන්වන ලද**
අඩි 3 ක් උස, අඩි 2 ක් පළල පිත්තල ඉදි පිළිමය හා අඩි 1 1/2 ක් උස, අඩියක් පළල පිත්තල පිළිමය හා අඩි 4 1/2 ක් දිග, අඩි 2 1/2 ක් පළල පිත්තල ශ්‍රී පතුල විකිණීමට හා තායිලන්ත චාරිකා සඳහා
0718071009

**දුෂ්කර විහාරස්ථානයේ**
අමාරුවෙන් පවත්වන
**කඨින පිංකම සඳහා උපකාර ලබාදෙන්න**
**077-8325775**

**නොමිලේ**
**ප්‍රාණඝාතයෙන් සහ මාංශ අනුභවයෙන් වැළකී අපි ඔක් : 4 ලෝක සත්ව අවිහිංසා දිනය සමරමු.**
**අපේ අභයදාන පින්කම්වලට ඔබත් දායකවන්න.**
**නිර්මාංශික වීමේ දහම්පත් සැමදා නොමිලේ !**
0717679254

**දානන්ව, යුද්ධන්ව සමානමනු (දන්දීම යුද්ධයක් හා සමානයි)**
ස්වාමීන් වහන්සේ නමකට තනිව වැඩසිටීම සඳහා පර්චස් 10 ක ඉඩමක් පූජා කරන්න.
**ධම්මගවේසි හිමි**
**0761448641**

**60 විය ඉක්මවන බෞද්ධ අසරණ අපට ස්ථිර පදිංචියට නිවසක් ලබා දීමට හැකි පිංවත් අයෙකු අප අමතන්න.**
**072-9043140, 072-9043740**

**O+ හෝ O- වකුගඩුවක් අවශ්‍යයි**
අවුරුදු 38 තිදරු පියාට ඉතා ඉක්මනින් බද්ද කිරීම සඳහා O+ හෝ O- වකුගඩුවක් පින්වත් ස්වාමීන් වහන්සේ නමක් හෝ, පරිත්‍යාගයක් පිරිනැමේ.
**අමතන්න :**
077 2908717, 0778803114

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ කපු මහතෙක් හොඳින් අවංකව වැඩකිරීමට දේවාලයක් සොයමි.**
076-2357167

**සාමණේර හිමිනමක් වන මා ආරණ්‍යය සේනාසනයක පැවිදි වී වැඩ වාසය කිරීමට කැමැත්තෙමි.**
**ඒ සඳහා කාරුණික ඉල්ලීමකි.**
දු.අ. 077-3159888

**කොළඹ ප්‍රදේශයේ ආවාසයක කාර්යාලයක ස්වාමීන් වහන්සේගේ සාමාන්‍ය සේවයට (වැඩිය වැඩ නොමැත) මනා චරිතවත්, වයස හැටක පමණ කැපකරුවකු සොයයි.**
**දීමනා කථාකරගමු.**
**සියලුම පහසුකම් සහිතයි.**
076-4543570

**හිමි නමකට වැඩ සිටීමට විහාරස්ථානයක් සොයයි.**
**0759276329**

**O⁺ වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මණින් අවශ්‍යයි**
**දෙදරු පියෙකුට අවු. 40**
0773936290/ 0779958202

**දඹදිව වන්දනායාමට ආධාරයක් බලාපොරොත්තුවෙමි.**
**ජාතික ඉතිරි කිරීමේ බැංකුව අනුරාධපුර සද්ධාජීව හිමි ගිණුම් අංකය : 109060206962**
**දුරකථනය - 071-4081510**

**විශ්‍රාමික ගුරුවරු අවශ්‍යයි**
ශිෂ්‍ය හිමිවරුන්ට ඉගැන්වීම සඳහා විශ්‍රාමික සංස්කෘත හා ඉංග්‍රීසි ගුරුවරු අවශ්‍යව ඇත.
**0767734121**
**0778836872**

**උපසම්පදා භික්ෂුවකට වැඩවාසය කිරීම සඳහා අනුරාධපුර පූජානගරය අවටින් හිස්වූ පන්සලක් හෝ නිවසක් සහිත හෝ රහිත පර්චස් 20 ක පමණ ඉඩම් කැබැල්ලක් පූජාකිරීමට කැමැති අයෙක් සිටීනම්.**
**අමතන්න. දු.ක. අංකය. 077-8992769**

**ආරාමයක් සඳහා**
**ඉඩමක් අවශ්‍යයි**
සිල්මැණියන් වහන්සේලාට භාවනායෝගීව වැඩසිටීමට ආරාමයක්, සුදුසු නිස්කලංක පරිසරයක ඉඩමක් බලාපොරොත්තු වේ.
**0716-978283**

කළුබෝවිල ආරම්භ කිරීමට බලාපොරොත්තු වන තනි පුද්ගල ඖෂධීය ආහාර පාන සුළු පරිමාණ ව්‍යාපාරයකට පිනට දහමට ලැදියාවැති විශ්වාසනීය නිදහස් සහයිකාවක් දිගුකාලීනව අවශ්‍යයි.
**විමල් - 0772625545**

**උපසම්පදා ස්වාමීන් වහන්සේ නමක් පන්සලක් සොයයි**
අමරපුර නිකායට අයත් උපසම්පද ස්වාමීන් වහන්සේ නමක් අමරපුර නිකායට අයත් කවුරුත් නැති පන්සලක් හෝ අතහැර දමූ පන්සලක් සොයයි.
**(අනුරාධපුරය, ගම්පහ, කුරුණෑගල විශේෂයි)**
0743408510/ 0717510325

**මහණ කිරීමට**
වයස අවු. 40 - 60 අතර ධර්මාවබෝධයක් ඇති මහණ වී භාවනා කිරීමට කැමති වැඩිහිටියන්ට අවස්ථාව ඇත.
**0718618437 / 0724587633**
ගිලන් භික්ෂූන් වහන්සේලා උදෙසා ධම්මවීර ගිලන්භික්ෂුහල විවෘතව ඇත.
**මලියදේව සේනාසනය,**
**තෙලඹියාව, නිකදළුපොත**



**මනෝ විද්‍යා මෝහන ප්‍රතිකාර**
කලක් තිස්සේ බෙත් ගත්තත් සුවනොවන රෝග සඳහා එක් ප්‍රතිකාර ක්‍රමයකින් තිට්ටාවටම සුවය
**මහාධම්ම රාජාධි රාජගරු සිරිසුමන වංශාලංකාර කාරක සංඝසභික මුළු දිවයිනටම ග්‍රාම විනිසුරු ඇකියු පංච හා හෝමියෝපති වෛද්‍ය**
**මහාචාර්ය කැටියපේ ඥාණ විමල නාහිමි.**
**071-6908746**

# මඩලගම ශ්‍රී වජිරබුද්ධි මහා නාහිමි

කුරුවිට, මිල්ලවිටිය ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙන් විහාරාධිපති, ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ ඉද්දමල්ගොඩ පාර්ශ්වයේ මහා නායක ධුරන්ධර සුධර්ම වංශපාල ගණාචරිය, පරිපත්තිසාසනාභිධජ, සාහිත්‍යාචාර්ය, රාජකීය පණ්ඩිත මඩලගම වජිරබුද්ධ්‍යාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ වසර අනූ හතරක් ආයු වළඳා 2022 සැප්තැම්බර් මස 23 දින අපවත් වී වදාළහ.

1928 නොවැම්බර් මස 08 දින උපත ලැබූ උන්වහන්සේ වර්ෂ පූර්වෝපචිත කුසල බලයෙන් මෙහෙයවන ලදුව වර්ෂ 1941 ජනවාරි මස 29 දින සම්බුදු සසුන්ගත වූහ. උන්වහන්සේගේ ආචාර්යත්වයට පත් වූවාහු අතිපූජ්‍ය ගොඩකුඹුරේ ශ්‍රී සුමනතිස්ස මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා අතිපූජ්‍ය තොටමුල්ලේ සරණජෝති ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

එහිදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් උත්තීර්ත වූ උන්වහන්සේ වර්ෂ 1949දී ප්‍රාචීන ප්‍රාරම්භ පරීක්ෂණයෙන් ද සාමර්ථ්‍ය ලැබූහ. අනතුරුව උසස් අධ්‍යාපන කටයුතු සඳහා පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනට ඇතුළත් වූ උන්වහන්සේ, පණ්ඩිත ශිරෝමණී අතිපූජ්‍ය කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර, යක්කඩුවේ ප්‍රඥාරාම, හැඩිපන්නල ශ්‍රී ප්‍රඥාලෝක, කොටහේනේ ශ්‍රී ප්‍රඥාකීර්ති වැනි විදග්ධ යතීශ්වරයන් වහන්සේ වෙතින් ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය ලබා වර්ෂ 1953දී සාහිත්‍යාචාර්ය හා රාජකීය පණ්ඩිත උපාධිද්වය ලබා ගැනීමට සමත් වූහ.

ධර්ම විනය, භාෂා ශාස්ත්‍ර පිළිබඳ ප්‍රාමාණික අධ්‍යයනයක් ලබා සිටි උන්වහන්සේ නිවිතිගල සුමන මහා විද්‍යාලය, බඹරබොටුව විද්‍යාලය, පැල්මඩුල්ල ගන්කන්ද මධ්‍ය විද්‍යාලය සහ කුරුවිට මහා විද්‍යාලය යන විද්‍යාලවල ධර්මාචාර්යයන් වහන්සේ නමක ලෙස දීර්ඝ කාලයක් සේවය කොට වර්ෂ 1984දී ගුරු සේවයෙන් විශ්‍රාම ලැබූහ.

පූජ්‍ය වජිරබුද්ධි ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙතින් සිදු වී ඇති නිකායික සේවය ද මෙහිදී අගය කළ යුතු ම ය. උන්වහන්සේ වර්ෂ 1958දී ශ්‍රී ලංකා අමරපුර මහ නිකායේ ඉද්දමල්ගොඩ විහාර පාර්ශ්වයේ ලේඛකාධිකාරී ධුරයට පත්වූ අතර, එතැන් සිට ක්‍රමවත්ව හා පිළිවෙළට ලිපි ලේඛන සකස් කරමින් නිකායෙහි ලේකම් මිටිය සුපෝෂණය කළහ. තවද ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව ආරම්භක අවධියේ සිට ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් කටයුතු කළ වජිරබුද්ධි මහා නායක හිමිපාණන් වහන්සේ එම සංඝ සභාවේ විනය කර්ම, අධිකරණ හා සංගණන කටයුතු පිළිබඳ සහකාර ලේඛකාධිකාරීන් වහන්සේ ලෙස වර්ෂ 1992 සිට වසර කිහිපයක් ක්‍රියා කළහ. උන්වහන්සේ සිදු කළ සේවය අගය කරමින් ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව මෙම වර්ෂයේ දී "පරිපත්ති සාසනාභිධජ" යන ගෞරව නාමයෙන් සම්මානිත කළහ.

"මිල්ලවිටියේ පණ්ඩිත හාමුදුරුවෝ" යන නාමයෙන් බොහෝ දෙනෙක් උන්වහන්සේ ආමන්ත්‍රණය කළේ උන්වහන්සේ තුළ ධර්ම විනය ශාස්ත්‍ර පිළිබඳ දැනීම නිකසල නිසා ය.

සපරගමුව අමරපුර භික්ෂු වංශය සමඟි සම්පන්නව තබා ගනිමින් සපරගමු අමරපුර සාමග්‍රි සංඝ සභාවේ අනුශාසකයාණන් වහන්සේ ලෙස ක්‍රියා කරමින් එක්නැළිගොඩ විහාර පාර්ශ්වයට සෘජු නායකත්වය ලබා දෙමින් වැඩසිට අපවත් වී වදාළ සාහිත්‍යාචාර්ය, රාජකීය පණ්ඩිත අතිපූජ්‍ය ශ්‍රී වජිරබුද්ධ්‍යාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මතු භවයක දී ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් නිවනින් සැනසේවා'යි ශ්‍රී ලංකා අමරපුර මහ නිකායේ ස්ථවිර, මධ්‍යම, නවක සියලු දෙනා වහන්සේගේ ධර්ම සංවේගය සමඟ ප්‍රාර්ථනා කරමිහ.

ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර
මහානායක අභිධජ මහාරට්ඨගුරු
අග්ගමහාපණ්ඩිත
**දෙඩම්පහල චන්දසිරි මහාස්ථවිර**

# ගාලු මාතර දෙදිසාවේ ද්විතීය සංඝනායක පදවි ලබන

# හප්පිටියේ සුමන නා හිමි

පනන්ගල බටහිර පූර්වාරාම විහාරාධිපති පන්නල ශ්‍රී ගංගාරාම පිරිවෙන් විශ්‍රාමලත් පරිවේණාධිපති ශාස්ත්‍රාචාර්ය පූජ්‍යපාද හප්පිටියේ සුමන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලාංකීය බෞද්ධ සමාජය අර්ථයෙන් හා ධර්මයෙන් පෝෂණය කිරීම සඳහාත්, ශාස්ත්‍රීය ඥණයෙන් පිරිපුන් ගුණ නැණින් හෙබි අනාගත පරපුරක් නිර්මාණය කිරීම සඳහාත් රට දැය සමය භාෂා සාහිත්‍යය සංස්කෘතිය සුරක්ෂිත කිරීම සඳහාත් අප්‍රතිහත ධෛර්යයෙන් හා කැපවීමෙන් අමිල අපරිමිත සේවයක යෙදී සිටිනු දක්නට ලැබීම මහත්වූ ප්‍රීතියකි.




විසිවයස් සම්පූර්ණව 1978 ජූලි මස 18 වන දින රාජ පූජිත මල්වතු මහා විහාරීය මංගල උපෝසථාගාරයේ දී අධිශිල සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි පිහිටියහ. පනංගල පිරිවෙනේ පරිවේණාධිපති ධුරය දරමින් අතිවිශාල මෙහෙවරක් ඉටු කරන ලදි.

පනංගල බටහිර පූර්වාරාම විහාරයේ 1989 විහාරාධිපති පදවියට හප්පිටියේ සුමන හිමියන් පත් ව එහි සියලු විහාරාරාමයන්ගෙන් සමන්විත දර්ශනීය විහාරස්ථානයක් බවට පත් කරලන්නට දිවා රාත්‍රී නොබලා ක්‍රියා කළහ. එහි පැවති ගාමිණී දහම් පාසල ස්වකීය ගුරු දේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට උපහාරයක් වශයෙන් ශ්‍රී වජිරඥණ දහම් පාසල නමින් නම් කළහ.

ප්‍රකට ග්‍රන්ථ කර්තෘන් වහන්සේ නමක් වන අතර, 'ගම්මානෙක අපි, පිරිවාණා පොත් වහන්සේ සන්නය, පියකු දුවට යැවූ ලියුම් (ජවහල්නේරු අගමැති තුමාගේ කෘතිය පරිවර්තනය කිරීම)' ආදී කෘති උන්වහන්සේගේ ය.

සුමන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඉන්දියාව, තායිලන්තය, බුරුමය ආදි රටවල ධර්ම ප්‍රචාරය කරන ලදි. ප්‍රදේශයේ ආර්ථික අපහසුතා ඇති අය වෙනුවෙන් නිවාස ඉදිකරදීම ද උන්වහන්සේගේ පරාර්ථකාමී සේවයකි. උන්වහන්සේගේ මේ ලෝක ශාසනික සේවය අගය කළ මල්වතු මහා විහාරයෙන් ගාලු මාතර දෙදිසාවේ ද්විතීය සංඝනායක පදවියට සද්ධර්ම කීර්ති ශ්‍රී වජිරඥණ ගෞරව නාම සහිතව පත් කර ඇති බැවින් ඒ පිළිබඳ සන්නස් පත්‍ර ප්‍රදානය 2022 නොවැම්බර් 01 වන දින මහනුවර රාජ පූජිත මල්වතු මහා විහාරයේ දී ප.ව 2.30 ට ශ්‍රීමත් මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු කරනු ලබන අතර නොවැම්බර් 02 වන දින අභිනව නාහිමියන් වහන්සේ පිළිගැනීමේ අභිනන්දන උත්සවය ප.ව 2.30 ට පනංගල බටහිර පූර්වාරාම විහාරස්ථානයේ දී සිදු කරනු ලබයි. මෙදින වීරපානේ බටතුවැල්ලේ ගෙදර පුණ්‍යසිරි රණසිංහ මැතිතුමාගේ ධන පරිත්‍යාගයෙන් ඉදි කළ අභිනව විහාර මන්දිරය ද විවෘත කරනු ලබයි.

තෙල්ලඹුර ශ්‍රී පුෂ්පාරාම විහාරාධිපති
යක්කලමුල්ල ශාසනාරක්ෂක
බලමණ්ඩලයේ ලේඛකාධිකාරී
කීර්ති ශ්‍රී ශාස්ත්‍රපති
**පලල්ලේ සරණජෝති හිමි**

# බෝලියද්දේ විමලානන්ද නා හිමි

දිසානායක මුදියන්සේලාගේ විජේපාල නම් වූ පින්වත් කුලකුමරු පෙර පින් ඇති බව සනාථ කරමින් 1972 අගෝස්තු මාසයේ 24 වැනි නිකිණි පෝය දා එකල නිකවැරටිය සමදරාපිටිය සෝමාරාමාධිපති ප්‍රවීණාචාර්ය අතිපූජ්‍ය වහුමුවේ පාලිත මහා ස්වාමීන් වහන්සේ වෙතින් බෝලියද්දේ විමලානන්ද නමින් සසුන්ගත කෙරිණි.


නාහිමියන්ගේ සෙවණේ උගතමනා බණ දහම් ඉගෙන මූලික අධ්‍යාපනය සඳහා ගම්පහ බණ්ඩාරවත්ත විද්‍යාවංශ ජ්‍යේෂ්ඨ පිරිවෙනට ඇතුළත් කර මූලික පිරිවෙන් අධ්‍යාපනය ලැබීය. 1975 ජනවාරි මාසයේ කොළඹ මරදාන ශ්‍රී ලංකා විද්‍යාලයීය මහා පිරිවෙනට ඇතුළත් වූ උන්වහන්සේ ආචාර්ය පූජ්‍යපාද ගලපිටියාගම විමලධම්ම නාහිමියන් සිය ශිෂ්‍යයාට උපාධිය දක්වාම අධ්‍යාපනය ලබා දුන්හ.

මේ අතර 1981 වසරේ අනුරාධපුර මල්වතු ඔයේ උදකුක්ඛේප සීමාමාලකයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූ උන්වහන්සේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ද, කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයෙන් ශාස්ත්‍රපති උපාධිය ද ලබා ගත්හ.

1984 වර්ෂයේ නිකවැරටිය සමදරාපිටිය ශ්‍රී පාලිත පිරිවෙනෙහි පරිවේණාචාර්යවරයකු වූ උන්වහන්සේ 1986 වසරේ සිට නිට්ටඹුව නාපාගොඩ ත්‍රිපිටකෝදය පිරිවෙනෙහි පරිවේණාචාර්යවරයකු බවට පත්වූහ. 1989 මැයි 05 වෙනි දින වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේ ධර්මාචාර්යවරයාණන් ලෙස පත්වූ උන්වහන්සේ නියෝජ්‍ය විදුහල්පතිධුරයට ද පත් වී අවුරුදු 30ක් වේයන්ගොඩ මධ්‍ය විද්‍යාලයේ සේවය කොට 2019.04.09 දින විශ්‍රාම ගියහ.

මහාවිහාරවංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහා නායක මාහිමිපාණන් ප්‍රධාන කාරක පාලක සංඝ සභාවේ "ශ්‍රී පාලිත විමලධම්ම වංශාවතංස ධර්ම කීර්ති සංඝ සෝබන" යන ගෞරව සම්මානෝපාධියෙන් ද පිදුම් ලැබූහ.

අනගාරික ධර්මපාල පදනමෙන් "සද්ධර්ම කීර්ති ශ්‍රී" යන ගෞරව සම්මානය ද ආදී බොහෝ ගෞරව සම්මාන මීට අමතරව ලබා



ඇත. ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ නිට්ටඹුව ප්‍රාදේශීය සංඝ සභාවේ ලේකම් ධුරය ද, සභාපති ධුරය ද දිගුකලක සිට දරමින් කටයුතු කරන්නාහ.

විදේශීය ධර්මදූත සේවය ද නොපිරිහෙලා ඉටුකළහ.

2022 අගෝස්තු මස 24 දිනට උන්වහන්සේ සසුන්ගතව පනස් වසරක් සපිරුණි. ශ්‍රී පාලිත විමලධම්ම වංශාවතංස ධර්ම කීර්ති සංඝ සෝබන, සද්ධර්ම කීර්ති ශ්‍රී විචිත්‍රභානි, ශාස්ත්‍රපති පූජ්‍ය බෝලියද්දේ විමලානන්දාභිධාන නාහිමියන්ට සසුන් කෙත බැබළවීමට දිගාසිර් ලැබේවා.

**ධර්මසේන ගොඩගේ**

# දිගු සසර ගමනේ විරාමය දකින්නට ගිහි සැප හැර පැවිදි සුව සෙවූ පානබොක්ක සීවලී දසසිල් මාතාව

**ධර්මධර, විනයධර භික්ෂුණීන් වහන්සේ සම්බුද්ධ ශාසනය බබළවති. කාන්තාවක් සම්බුදු මඟ යමින් දසසිල් මාතාවක් වීම ද පුණ්‍යවන්ත ජීවිතයක උතුම් අවස්ථාවකි. දසසිල් මාතාවක් දුටු විට ඇතැම් කෙනෙක් සිතන්නේ ලෞකික ජීවිතයේ මුහුණදීමට සිදු වූ පසුබෑම් හෝ පරාජිත වීම් නිසා ගිහිගෙය හැර දමා ඇති බව ය. එහෙත් එය එසේ නොවේ.**



ලෞකික ජීවිතයේ අපමණ සැප සම්පත්, කීර්ති, ප්‍රශංසා, තනතුරු ලාභ ලැබිය හැකිව තිබියදීත් ඒ සැප සම්පත් සියල්ල හැර දමා සසුන් ගතවන හෙළ කුල කාන්තාවෝ ද බොහෝ වෙති.

එසේ දසසිල් මාතාවක් වූ සාඩම්බරණීය කාන්තාවකි. මහාචාර්ය කුමාරිහාමි පානබොක්කේ වෛද්‍යාචාර්තුමිය. ඇය දසසිල් මාතාවක් වන්නේ පානබොක්ක සීවලී මෙහෙණින් වහන්සේ නමිනි.

කන්ද උඩරට මහනුවර රාජධානියේ හැදී වැඩුණු කුමාරිහාමි පානබොක්කේ සුරතල් දියණිය වත් පොහොසත්කමින් සපිරි උගත්, ධනවත් පවුල් පසුබිමකට උරුමකම් කීවා ය. මහනුවර උසස් බාලිකා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබන අවධියේ සිට ම ඇය අහිංසක ගම් වැසියන් ලෙඩ රෝගයන්ගෙන් විඳින දුක් පීඩා දුටුවා ය. ඒ දැක අපමණ දුකට පත් වූවා ය.

පුංචි සිතට අපූරු අධිෂ්ඨානයක් ඇති වුණි. ඒ අසනීප වීම නිසා දුක්විඳින රෝගීන්ට හැකි අයුරින් සරණවීමට ය. බාල වියේම ඇය ඒ අධිෂ්ඨානයට ඉලක්කයක් එක් කර ගත්තා ය. ඒ වෛද්‍යවරියක් වීමට ය.

ඒ අනුව වසරින් වසර අධ්‍යාපනයේ කඩඉම් පසු කළ ඇය කොළඹ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වූවා ය. වෛද්‍ය උපාධිය ලබා කළුබෝවිල රෝහලේ සේවයට එක් වූවා ය. එයින් නොනැවතුණ ඇය, ඒ අවධියේ ම දේශීය වෛද්‍ය ක්‍රම හා වෛකල්පිත වෛද්‍ය ක්‍රම පිළිබඳව ද වැඩිදුර අධ්‍යයනය කරන්නට වූවා ය. ඒ පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමටත් විවිධ මාර්ගෝපදේශ ලබා ගැනීමටත් පෙළ ඹුණා ය.

වෛද්‍යවරිය ලෙස දිනෙන් දිනම ඉදිරියට ගිය ඇය 1971 වසරේ දී නාරිවේදය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියක් බවට පත් වූවා ය.

ඇය එතැනින් නොනැවතුණි. අපේ රටේ මෙන් ම ඉන්දියාව, චීනය, අමෙරිකා එක්සත් ජනපදය, සෝවියට් සංගමය, එංගලන්තය, ජර්මනිය සහ ඕලන්දය වැනි රටවල් හි ද පවතින විකල්ප වෛද්‍ය ක්‍රමවේද පිළිබඳ සායනික අත්දැකීම් සහිතව ගැඹුරින් අධ්‍යයනය කරන්නට විය. ඇය රටවල් 69 ක පමණ සංචාරය කර ඇත.

එහෙත් 1977 වසරේ දී ඇය තම සැමියා ද සමඟින් ස්විඩනයේ පදිංචියට යන්නට සිදුවුණි. එහි දී විශේෂඥ වෛද්‍ය කුමාරිහාමි පානබොක්කේ එහි විකල්ප වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ඇරඹුවා ය. බොහෝ රෝගීහු ඇය සොයා එන්නට වූයේ ද ඇය දක්ෂ වෛද්‍යවරියක් වූ නිසා ය. නිදන්ගත රෝග, ඇදුම, ආසාත්මිකතාවයන් සුවපත් කිරීම පිළිබඳ විශිෂ්ට ප්‍රතිඵල පෙන්නුම් කළ ඇය ස්විඩන් වැසියන් මවිතයට පත් කළ වෛකල්පිත වෛද්‍යවරියක් වූවා ය.

විකල්ප වෛද්‍ය ප්‍රතිකාර මඟින් ලෝ වැසියන් සුවපත් කිරීම වෙනුවෙන් ඇය දැක් වූ කැපවීමට ගෞරවයක් යන හේතු පාඨය සහිතව 1994 දී ලෝ ප්‍රකට අන්තර්ජාතික වෛකල්පිත වෛද්‍ය විශ්ව විද්‍යාලය මඟින් සම්මාන මහාචාර්ය ධුරයක් ඇය වෙත පිරිනමනු ලැබ ඇත.

වර්ෂ 1971 ආයුර්වේදය පිළිබඳ ආචාර්ය සම්මානයක් ද, 1980 ආයුර්වේද කීර්ති පණ්ඩිත ගෞරව සම්මානයක් ද, 1980 වසරේ දී චීනය ද, 1985 රුසියාව ද කායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ද, 1988 වසරේ දී කටු චිකිත්සාව පිළිබඳ ආචාර්ය උපාධියක් හා විකල්ප වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ද, 1989 මාණ්ඩලික චිකිත්සාව, රෙෆෙක්සෝ චිකිත්සාව සහ ඉරිඩොලොජිකල් විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් සහ දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධියක් ද, 1995 වසරේ දී ඉන්දියානු කවුන්සිලය මඟින් දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධියක් ප්‍රදානය කොට ඇත.

ස්විඩනයේ ජීවත්වන කාලය තුළ දී තම සැමියාගේ අකල් වියෝවෙන් පසු කුමාරිහාමි පානබොක්කේ නම් වෛද්‍යවරියගේ අරමුණ කෙමෙන් වෙනස් වන්නට විය.

තම තරුණ වෛද්‍යවරියන් දෙදෙනකු වූ දියණියන් දෙදෙනාගේ ජීවිත යහපත් ආකාරයෙන් ගත කිරීමට අවශ්‍ය කටයුතු සලසා දී සියලු ගිහි බන්ධනයන්ගෙන් මිදී සසර ජීවිතයේ අනේක දුක්ඛ දෝමනස්සයන් ගැන කළකිරීම ඔස්සේ ඇය යළි මව් රට වෙත පැමිණියේ ඉතා පැහැදිලි තීරණයකට එළැඹීමෙනි.

එසේ පැමිණි ඇය 2006 වසරේ අවසාන භාගයේ දී පානබොක්ක සීවලී මෙහෙණිය ලෙසින් සසුන්ගත වූවා ය. ඒ අනුරාධපුර ධම්මිකා මෙහෙණින් වහන්සේගේ ආචාර්යත්වයෙනි.

සීවලී මෙහෙණින් වහන්සේ ගිහිකල තම පරම්පරාවෙන් ලැබුණු වත්කම හා ස්විඩන් රජයෙන් වෛද්‍ය වෘත්තිය වෙනුවෙන් ලැබෙන විශ්‍රාම වැටුප තම පෞද්ගලික සුඛ විහරණයට පරිහරණයට නො කරයි.

ඒ සියලු පෞද්ගලික වත්කම් යොදවා "ශ්‍රී ශාන්තිධාර පානබොක්ක" පදනම පිහිටුවා ඇත. ඒ ඔස්සේ දිවයිනේ විවිධ දුෂ්කර ප්‍රදේශවල අසරණ ජනතාව වෙනුවෙන් සමාජ සුබසාධන සේවාවන් සිදු කරයි.

අසරණ ජනතාවගේ නිවාස බෙහෙත් වෙනුවෙන් කැප කරන අතර ඉගෙනීමට දක්ෂ අඩු ආදායම්ලාභී දරුවන්ට මාසිකව යම් මූල්‍යමය ආධාරයක් කිරීම ද මෙහෙණින් වහන්සේ අතින් සිදු වේ. දිළිඳු ජනතාවගේ දිවි සරු කරනු වස් ස්වකීය ධනය ඉත සිතින් කැප කරමින් සමාජයේ අසරණයන් වෙනුවෙන් විශාල කැපකිරීමක් ශක්තියක් වන පානබොක්ක සීවලී සිල් මාතාවට තවදුරටත් සමාජ මෙහෙවර සිදු කිරීමට ශක්තිය ලැබේවා.

දීපා පෙරේරා

## දරුවනේ මේ ලොවම ඔබට නිමැවුණ තැනක්

ආදරේ වපුරන්න
ඉතා හොඳ පින් බිමක්
ගුණ සුවඳ පතුරන්න
මහ විසල් ඉඩකඩක්
සෙනෙහෙ පල නෙළන්නට
නිකැළැල් වූ කෙම්බිමක්
පැටවුනේ මේ ලොවම
ඔබට නිමැවුණු තැනක්

දරුවන්ගෙ සිනාව ම
හුස්ම වූ අම්මලා
දරුවන්ට පණ දෙන්න
වෙහෙසලන අප්පලා
සෙනෙහසින් ශිල්ප දෙන
අදරබර ගුරුන්ලා
ඒ ඇතිය දිවියට ම
නුඹ දිනුම් හිතල්ලා

සිහින මහ ගොඩක් දැක
එළි කරනු අටියනේ
දුටු සිහින සැබෑ
කරලන්න වැඩ කරමිනේ
සිහිනයේ එළිපතට
නුඹ දිනෙක එන දිනේ
දෙගුරන්ගෙ අත් රැගෙන
සිනාසෙන් හැම දිනේ

වෙන පැතුම් ගොඩක් නෑ
මේ ලොව ළමා දිනේ
හැමදාම හැමදේම
දිනාපන් පැටවුනේ

***ඔක්. 01 වැනි දිනට යෙදුණු ලෝක ළමා දිනය වෙනුවෙනි.***

කොළඹ රාජකීය විද්‍යාලයේ ආචාරිණී
**අචලා ධර්මවික්‍රම**



# පෝදා පින්කම්

## ඓතිහාසික ශ්‍රී කලයාණි රාජමහා විහාරය

පෙරවරු 6.00 - 6.30 සීල සමාදානය සහ උදෑසන බුද්ධ පූජාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරී ශාස්ත්‍රවේදී රන්දිලිගම මහින්ද හිමි, 8.00 - 9.00 භාවනාව - ශ්‍රී කල්‍යාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්ව විද්‍යාලයේ කුලපති අග්ගමහා පණ්ඩිත , උපාධ්‍යාය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි, 9.00 - 10.00 ධර්ම දේශනාව - ශාස්ත්‍රවේදී අතුරුගිරියේ සුබෝධ හිමි, 10.00 - 11.00 ධම්ම පදයෙන් බිඳක් වත්තල වැලිකඩමුල්ල අභය විහාරාධිපති, කැලණියේ ශාසනවංශ හිමි, 11.00 - 11.30 දිවා බුද්ධ පූජාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරවාසී ඇතිමලේ සීලානන්ද හිමි, පස්වරු 2.00 - 3.00 විශේෂඥ වෛද්‍ය දේශනය, 3.00 - 4.00 ධර්ම දේශනාව - ශාස්ත්‍රපති කරවිලකොටුවේ ධම්මතිලක හිමි, 4.00 - 5.00 ධර්ම දේශනාව ශාස්ත්‍රපති සියඹලාගොඩ ධම්මින්ද හිමි, 5.00 - 6.00 භාවනාව ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත  නාහිමි, 6.00 - 7.00 ගිලන්පස බුද්ධ පූජාව ආචාර්ය දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි.

## තලවතුගොඩ සංඝමිත්තාරාමය

අලුයම 05.30 අටවිසි බුදුරජාණන් වහන්සේ සහ අසූමහා ශ්‍රාවිකාවියන් වහන්සේලා උදෙසා ක්ෂීරපායාස පූජාව, පෙරවරු 6 - 7 සීල සමාදානය සහ සම්බුද්ධ පූජාව 8 - 9 ,ධර්ම දේශනය - ගැමුණුපුර සෝමවංශ හිමි, 9 - 10.30 ධර්ම දේශනය පුහුල්මැල්ලේ සාරද හිමි, 10.30 - 11.00 දහවල් සම්බුද්ධ පූජාව, පස්වරු 12.30 - 01.30 දම්සක් පැවතුම් සූත්‍ර දේශනය, 2 - 3.30 ධර්ම දේශනය - සෝමපුර සිරිසුධම්ම හිමි, 4 - 5 ධර්ම දේශනය - මහින්ද හිමි, පස්වරු 6.00 ට අටවිසි බුදුරජාණන් වහන්සේ, අසූමහා ශ්‍රාවිකාවන් වහන්සේලා උදෙසා ගිලන්පස බුද්ධ පූජාව. එදින ධර්ම දානය සඳහා බුදුසරණ පුවත්පත බෙදා දෙන්නේ බිමල් පීරිස් මහතා විසිනි.

## මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය වැඩිහිටි සීල සමාදනය

පෙරවරු 6.00 - 7.00 සිල් සමාදන් කරවීම සහ බුද්ධ පූජාව පැවැත්වීම, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ගබ්බෙල වජිර හිමි, 8.00 - 9.00 භාවනාව රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මණ සුමනසිරි නාහිමි, 9.00 - 10.00 ධර්ම දේශනාව - ගල්කිස්සේ සෝමානන්ද හිමි, 10.00 - 11.00 සූත්‍ර දේශනාව - රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පානදුර පසන්න හිමි, 11.00 - 11.15 බුද්ධ පූජාව තලංගල්ලේ ධම්මරතන හිමි, තලංගල්ලේ ධම්මදස්සි හිමි, පස්වරු 12.20 - 1.00 පිරිත් හා තෙරුවන් ගුණ ගලහිටියාවේ නාගිත හිමි, තලහගම බුද්ධසිරි හිමි, 1.00 - 2.00 ධර්ම සාකච්ඡාව ත්‍රිපිටකාචාර්ය ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත තල්පාවිල කුසලඥාන හිමි, 2.00 - 3.00 ධර්ම දේශනය රත්මලාන පුරාණ විහාරාධිකාරී රාජකීය පණ්ඩිත කොටනෙලුවේ පුඤ්ඤානන්ද හිමි, 3.00 - 3.45 ධර්ම දේශනාව - ශාස්ත්‍රපති පණ්ඩිත වේරදූවේ මහින්ද හිමි, 4.00 - 5.00 ධර්ම දේශනාව උඩහමුල්ල පඤ්ඤෝධාරාමවාසී ශාස්ත්‍රපති පණ්ඩිත වල්ගම සුමන හිමි, 5.00 - 6.00 ධම්ම පදය ශාස්ත්‍රපති පණ්ඩිත වතුරගම ධම්මජීව හිමි, 6.00 - 6.30 බෝධි පූජාව සහ සිල් අලුත් කිරීම, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මන සුමනසිරි නා හිමි.

## මහරගමසිරි වජිරඤාණ ධර්මායතනය තරුණ සීල සමාදනය

පෙරවරු 6.00 - 7.00 සිල් සමාදන් කරවීම, අනුශාසනාව හා බුද්ධ පූජාව ශාස්ත්‍රපති පණ්ඩිත වතුරුගම ධම්මජීව හිමි, 8.00 - 9.00 භාවනාව කොත්මලේ ඤාණවංස හිමි, 9.00 - 10.00 ධර්ම දේශනාව ශාස්ත්‍රපති තුම්බෝවිල ධම්මරතන නාහිමි, 10.00 - 11.15 පරෝපකාර සංග්‍රහය - අනුශාසනාව හා බුද්ධ පූජාව ශාස්ත්‍රපති පණ්ඩිත මහඔය අනුරුද්ධ හිමි, පස්වරු 12.30 - 1.00 පිරිත් හා තෙරුවන් ගුණ අකුරැස්සේ ධම්මරතන හිමි, 1.00 - 2.00 ධර්ම සාකච්ඡාව ගල්කිස්සේ සෝමානන්ද හිමි, 2.00 - 3.00 වෙසෙසි දෙසුම ගත්කතුව චාමික මුණසිංහ මහතා, 3.00 - 4.00 ධර්ම දේශනාව ශාස්ත්‍රපති පණ්ඩිත රණස්ගල්ලේ ඤාණවීර නාහිමි, 4.15 - 5.00 ධම්මපදය ශාස්ත්‍රපති පණ්ඩිත ගබ්බෙල වජිර හිමි, 5.00 - 6.00 ධර්මදේශනාව දියතලාවේ පියදස්සි හිමි, 6.00 - 6.30 බෝධි පූජාව ශාස්ත්‍රපති පණ්ඩිත හක්මන සුමනසිරි නා හිමි.

## බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන

පෙරවරු 6.00 - 7.00 සීල සමාදානය හා අනුශාසනය, 7.00 - 7.30 තෙරුවන් වන්දනාව වැඩසටහන් මෙහෙයවීම ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි. පෙරවරු 8.15 - 09.30 භාවනාව කිරිබත්ගොඩ ධම්මධජ හිමි, 9.45 - 11.00 ධර්ම දේශනාව වලපනේ ඤාණසේන හිමි, 11.00 - 11.30 තෙරුවන් වන්දනාව පස්වරු 12.30 - 1.00 සූත්‍ර සජ්ඣායනය, 1.00 - 2.00 ධර්ම දේශනය ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි 2.00 - 3.30 ධර්ම සාකච්ඡාව ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි, 4.00 - 5.00 ධර්ම දේශනාව ගල්කිස්සේ සෝමානන්ද හිමි.

## කොබවක ශ්‍රී සුමනාරාමය

කොබවක ශ්‍රී සුමනාරාම විහාරයේ විහාරාධිපති දෙල්මැල්ලේ ශ්‍රී සුමනරතන පොඩි හාමුදුරුවන්ගේ මෙහෙයවීම පරිදි, මේ මස 09 වැනිදා පසළොස්වක පෝදා සුමනාරාමයේ දී පින්කම් මාලාවක් පැවැත්වේ. පෙරවරු. 08.30 ට ධර්ම දේශනාව බුලත්සිංහල දිවලකඩ කළුගල ශ්‍රී විජයාරාම විහාරාධිකාරී, ගල්පාත ඥානසිරි හිමි, 10.00 ට සදහම් වන්දනාව හා දහවල් සම්බුද්ධ පූජාව ආදළුවේ සුබෝධනී මෑණියන් 01.30 ට භාවනාව, ශාස්ත්‍රපති වෑකඩ භද්‍රා මෙහෙණින් වහන්සේ, සවස 6.30 ට සැමට සෙත් පතා ගිලන්පස බුද්ධ පූජාව, බෝධි පූජා පින්කම.

## රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානය

අලුයම 5.00 ට ශ්‍රී දළදා වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා ප්‍රණීත කිරි ආහාර පාත්‍ර 32 ක් පූජා කිරීම, අලුයම 5.30 ට අෂ්ඨාංග උපෝසථ සීලයෙහි පිහිටුවීම හා අනුශාසනාව විහාරාධිපති සීදුවේ සුමනවංශ නාහිමි, උදෑසන 6.00 ට  ආහාර බුද්ධ පූජාව හා තෙරුවන් වන්දනාව, පෙරවරු 7.45 සිට 8.45 දක්වා ධර්ම දේශනාව ශාස්ත්‍රවේදී මාදුවේ කෝලිත හිමි, 9.45 සිට 11.15 දක්වා ධර්ම සාකච්ඡාව කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අශෝක ප්‍රියදර්ශන, ශාස්ත්‍රපති නීල් ධර්මප්‍රිය බණ්ඩාර, ධර්මාචාර්ය කේ.ඒ.එස්. ආර්. දයානන්ද, ධර්මාචාර්ය කේ.එම්.ආර්. කුමාරසිංහ ඇතුළු වියතුන්, 11.00 ට ව්‍යාංජන, පලතුරු කැවිලි වර්ග 32 ක් ඇතුළු ශ්‍රී දළදා වහන්සේ අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා මුල්තැන් බුද්ධ පූජාව පූජා කිරීම, 12.00 සිට 12.30 දක්වා සක්මන් භාවනාව, 01.15 සිට 2.15 දක්වා කාව්‍යමය ධර්ම දේශනාව ශාස්ත්‍රවේදී රන්වල සරණසිරි හිමි, 2.45 සිට 3.45 දක්වා ධර්ම දේශනාව ශාස්ත්‍රපති ඇල්ලේ ඉන්ද්‍රජෝති හිමි, 4.00 සිට 5.00 දක්වා ධර්ම දේශනාව ආඬිඅම්බලමේ සුගුණ හිමි.

## දෙහිවල නව පොළොන්නරු ගල් විහාරය

දෙහිවල නව පොළොන්නරු ගල් විහාරාධිපති හැව්ඹිවිට ගුණානන්ද නාහිමිගේ අනුශාසකත්වයෙන් මේ මස 09 වප් පොහෝදා පෙරවරු 6.15 ට කිරිපිඬු පූජා පෙරහර, 6.30 ට සිල් සමාදන් කරවීම හා සම්බුද්ධ පූජාව හැව්ඹිවිට ගුණානන්ද නාහිමි, 8.30 කාව්‍යමය ධර්ම දේශනාව - ඇත්බොටුවේ ධම්මසිරි හිමි, 9.45 සක්මන් භාවනාව - මිද්දෙණියේ සුමංගල හිමි, පස්වරු 12.30 ට පිරිත් සූත්‍ර දේශනාව - වැල්ලවායේ සුමනරතන හිමි, 2.00 ධර්ම දේශනාව මාරඹ ධම්මරතන හිමි, 3.00 ධර්ම දේශනාව ගාල්ලේ රතනාලංකාර හිමි, 4.15 ධර්ම දේශනාව බෝකුන්දර චන්දිම හිමි, 6.30 අටවිසි බුද්ධ පූජාව.

## මහනුවර ශ්‍රී දළදා පූජා පින්කම

ශ්‍රී දළදා පූජාව සහිත විශේෂ පින්කම් මාලාව 39 වෙනි වරටත් සීදුව රද්දොළුව ශ්‍රී අමර මහා විහාරාධිපති, පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී සීදුවේ සුමනවංශ නාහිමියන් විසින් මේ මස 05 සහ 06 යන දිනයන්හි මහනුවර දී අතිඋදාර අන්දමින් පැවැත්වීමට කටයුතු සලසා ඇත.

මෙදින රාත්‍රී 7.00 ශ්‍රී දළදා වහන්සේ උදෙසා අෂ්ඨපාන සහිත ගිලන්පස බුද්ධ පූජාව හා පසුදින අලුයම 6.00 ට කිරි ආහාර බුද්ධ පූජාව, 6 වැනි දා 10.00 ට ශ්‍රී දළදා වහන්සේ උදෙසා මුල්තැන් බුද්ධ පූජාව පැවැත්වීම, එදින 11.00 ට 100 ක් නමක් විෂයෙහි අටපිරිකර 100 ක් සහිත සෙසු පිරිකර සමඟින් දහවල් සඟසතු මහා දානමය පින්කම. ශ්‍රී දළදා මාලිගාවේ දාන ශාලාවේ දී පැවැත්වීමට කටයුතු සලසා ඇත. මෙහි අරමුණ සීදුවේ සුමනවංස නාහිමිගේ ජන්ම දිනය වෙනුවෙනි.

## පිහිට පතයි

කඩවත මහර සිරිමාවෝ බණ්ඩාරණායක මාවතේ පදිංචි ඉෂාරා ජයමාලි (28) දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඇයට ඕ පොසිටිව් හෝ ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය බවද කියයි. පරිත්‍යාගශීලියකු වේ නම් 0778133853 හෝ 0773838002 දුරකතනයට දන්වන ලෙස ඉල්ලීමක් කරයි.

..............................................

පී.ඩබ්ලිව්.එම්.එස්.කේ. විජේරත්න (58) මහත්මිය දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඇයට “ඕ පොසිටිව්” වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍යවරු නිර්දේශ කර ඇති බව ද කියයි. පරිත්‍යාගශීලියකු වේ නම් 0777 531212 හෝ 077 1966587 දරණ දුරකථන අංකයන්ට දැනුම් දෙන ලෙස ඉල්ලීමක් කරයි.

..............................................

විශ්වවිද්‍යාලයක සිව්වන වසරේ ඉගෙනුම ලබන 25 හැවිරිදි තරුණයකු දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඔහුට ඉක්මණින් “ඕ පොසිටිව් හෝ “ඕ නෙගටිව්” වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍ය නිර්දේශය බව ද කියයි. පරිත්‍යාගශීලියකු වේ නම් 077 5767816 හෝ 076 3718716 දුරකථන අංකයට දැනුම් දෙන ලෙස ද ඉල්ලීමක් කරයි.



ගාල්ල, වලහන්දූව, මානවිල, බෙත්තාරාමාධිකාරී, මෛත්‍රී ධර්මායතනාධිපති ශාස්ත්‍රපති, දෑරංගල මංගල හිමි විසින් සම්පාදනය කරන ලද “දොළොස් මහේ ධර්ම දේශනාව“ සහ “භාවනාවෙන් ජීවිතයට සුවය” යන ධර්ම දේශනා ග්‍රන්ථ දෙක පසුගිය දින මහනුවර මල්වතු මහා විහාර පෝය සීමා මාලකයේ දී තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ ශ්‍රීමත් මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ අනුනායක සානුනායක කාරක මහා සංඝ සභාවට පිළිගැන්වූහ. මෙම ග්‍රන්ථය ධර්ම දානයක් ලෙස පිළිගැන්වේ.

## සසුනඹරට පෑයූ සුපුන් සඳ

# තල්අරඹේ සිරි සුදස්සි රෑමස්සල නාහිමි

**උපතින් අසූතුන් වැනි විය සහ උපසම්පදාවෙන් 62 වසර සපුරන රෑමස්සල නාහිමි වෙනුවෙන් පසුගිය 29 දින ගාල්ල රෑමස්සල පිරිවෙනේ දී සමරු පින්කම් රැසක් පැවැත්විණි. මේ ලිපිය පළවන්නේ ඒ නිමිත්තෙනි.**



දකුණුලක මාතර දිස්ත්‍රික්කයේ තල්අරඹ නම් ග්‍රාමවරයේ දී 1940 වර්ෂයේ දී උපත ලද දයාසේන නම් පින්වත් කුමරු වර්ෂ 1955 මැයි මස 09 වැනි දින කොග්ගල තලාතුඩුව ආරණ්‍ය සේනාසනයේ දී සසුන්ගතව 1960 ඔක්තෝබර් 29 වැනි දින කොග්ගල තලාතුඩුව ආරණ්‍ය සේනාසනයේ දී සසුන්ගතව, 1960 ඔක්තෝබර් 29 දින ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ නිර්මාතෘවර රාජකීය පණ්ඩිත කඩවැද්දුව ජිනවංස මාහිමි, මාතර ඥානාරාම මාහිමි යන උතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා දොරපේ ඉන්දෝභාස නාහිමියන්ගේ ආචාර්යත්වයෙන් මහෝපාධ්‍යාය ධුතංගධාරී මඩවල ධම්මතිලක මාහිමියන්ගේ උපාධ්‍යායත්වයෙන් කොග්ගල නදී උදකුක්ඛේප සීමාමාලකයේ දී උතුම් වූ උපසම්පත්ති ප්‍රතිලාභයට පත්වූහ.

මරදාන ශ්‍රී ලංකා විද්‍යාලය, ගංගොඩවිල විද්‍යෝදය විශ්ව විද්‍යාලය (හින්දි භාෂා උපාධිය) හෝමාගම බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයෙන් (ශාස්ත්‍රපති) ආදි විද්‍යස්ථානවලින් උසස් අධ්‍යාපනය ලැබූහ. භාරත දේශයේ ප්‍රධාන සංඝනායක හැඩිගල්ලේ පඤ්ඤාතිස්ස නාහිමියන් යටතේ සාංචියේ දී ධර්මදූත පුහුණුව ද ලබා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය භදන්ත ආනන්ද කෞශල්‍ය මාහිමි යටතේ හින්දි භාෂා පුහුණුවක් ලබා ගත්හ.

අම්පාර දිගාමඩුල්ල ශ්‍රී විද්‍යානන්ද මහ පිරිවෙනෙහි නියෝජ්‍ය පරිවේණාධිපති ධුරය දරමින් හෑගොඩ ඉන්දසර නාහිමියන් සමඟ අධ්‍යාපනික, ශාසනික හා ජාතික මහඟු මෙහෙවරක් ද පා ගමනින් සිදුකොට නැඟෙනහිර පළාතේ පිරිවෙන් අංශයෙන් උපහාර පවා ලබා ගනිමින් දැනට විශ්‍රාමික සුවයෙන් වැඩ වෙසෙති.

අති දුෂ්කර උපද්‍රව හා අභියෝග ඉදිරියේ නොසැලී ගාල්ල රෑමස්සල කන්දේ වර්ෂ 1974 දී පොල් අතුවලින් ආවරණය කළ කුටියකින් ආරම්භ කළ ආවාසය අද ශිෂ්‍ය හිමිවරු විශාල සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන විද්‍යස්ථානයකි. මහ පිරිවෙනකි.

තවද කතරගම පෙරගිරිගම බෞද්ධ ආශ්‍රමය නමින් විහාරස්ථානයක් ද මෑත භාගයෙහි ආරම්භ කොට සසුනට දායාද කර ඇත.


බෞද්ධාචාර්ය, ත්‍රිපිටකාචාර්ය, ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති. ප්‍රවීණාචාර්ය, විනයාචාර්ය සහ කම්මට්ඨානාචාර්ය (භාවනා පුහුණු) වැනි උපාධි සහ පාඨමාලා ගණනාවක් සමත් වී ඇත.

තවද 2018 වසරේදී ස්ව නිකාය වන ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකායේ අග්ගමහා පණ්ඩිත ත්‍රිපිටක වාගීශ්වර නාපාන පේමසිරි අභිධාන මහා නායක වරප්‍රමුඛ පාලක මහා සංඝ සභාව වෙතින් "ශ්‍රීවනරතන නාමයෙන් ද පිදුම් ලැබීය. සරල අල්පේච්ඡ ජීවිතය අගය කරමින් දැනට පනස් නමකට ආසන්න පැවිදි ශිෂ්‍ය සමුදායක් සසුනට ඇතුළත්කොට ලක් සම්බුදු සසුනට මහඟු මෙහෙයක් සිදුකරති.

ස්ව නිකායේ පමණක් නොව ත්‍රෛනිකායික භික්ෂු සංගයා අතරෙහි ද සම්භාවනාවට පාත්‍ර වූ මෙතුමන් වහන්සේට ත්‍රෛනිකායික එක්සත් භික්ෂු බල මණ්ඩලය මඟින් අධිකරණ සංඝනායක පදවිය ද පිරිනමා ඇත. අසූතුන්වැනි වියට පා තබන අප රෑමස්සල නාහිමිපාණන් වහන්සේට ලෝ සසුන් වැඩ වඩන්නට තවත් දිගාසිරි සම්පත් තෙරුවන් බෙලෙන් ලැබේවා'යි පතමු.

ශාස්ත්‍රපති
**අරුක්ගොඩ මහින්දසිරි හිමි**

## ධර්මධර විනයධර
# ගම්මුල්ලේ සුමංගල නාහිමි



වර්ෂ 1952 මාර්තු මස නව වැනිදින මාතලේ දිස්ත්‍රික්කයේ අස්ගිරිය පල්ලේසියපත්තුව ගම්මුල්ල ග්‍රාමයේ දී ජන්ම ලාභය ලබා වර්ෂ 1963 ඔක්තෝබර් 23 වෙනි දින ඓතිහාසික ගල් මඩුව රාජමහා විහාරාධිපති සුපේෂල ශික්ෂාකාමී ධර්මධර විනයධර ගම්මුල්ලේ සුමනසාර ලොකු හාමුදුරුවන් වහන්සේගේ ආචාර්යත්වයෙන් ගම්මුල්ලේ සුමංගල නමින් අති උතුම් ප්‍රවජ්ජාභූමියට ඇතුළත් විය.

ශාසන වත්පිළිවෙත් හා බණදහම් පිළිබඳ මූලික දැනුම සිය ආචාර්ය ගුරුදේව උත්තමයාණන් වහන්සේගෙන් ඉගෙනගෙන, මාදන්වල ශ්‍රී ධර්මෝදය මහ පිරිවෙනට ඇතුළත්ව පරිවේණාධිපති උඩහේවාහැට වලපන දෙදිසාවේ ප්‍රධාන සංඝනායක මාදන්වල සුමනසාර නාහිමිපාණන් වහන්සේ ප්‍රධාන බහුශ්‍රැත ධර්මධර විනයධර ධර්මාචාර්ය වහන්සේලාගෙන් සිය ධර්ම ශාස්ත්‍රය ප්‍රගුණ කරගත් සුමංගල නාහිමියෝ 1973 ජුනි අට වැනි දින මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහ නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ගොඩමුන්නේ ශ්‍රී නාගසේන ධම්මානන්ද මාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා පූජ්‍ය යටවර ශ්‍රී සංඝරක්ඛිත යටවර පියරතන යන නාහිමිවරුන්ගේ කර්මාචාර්යත්වයෙන් අස්ගිරිය මහා විහාරයීය ඓතිහාසික මංගල උපෝෂථාගාරයේ දී අධි සීල සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි විනය කර්මයට ඇතුළත් වූහ.

වර්ෂ 1991 දී ඓතිහාසික ගල්මඩුව රාජමහා විහාරාධිපති පදවියටත්, වර්ෂ 2002 දී වට්ටාරාම අරහත්ත මලියදේව ඓතිහාසික රාජමහා විහාරාධිපති පදවියටත් වර්ෂ 2002 දී තලාව රාජමහා විහාරාධිපති පදවියටත්, ගම්මුල්ලේ සුමංගල නාහිමි පත්වූහ.

සුමංගල නාහිමි සිය ශාසනික ජීවිතයේ අඩසියවසරකටත් වඩා ශාසනික හා ආගමික චිරස්ථිතිය වෙනුවෙන් කැපවීම අගයමින් ඉටුකරන ලද ශාසනික සේවය ඉතා ශ්‍රේෂ්ඨ ය.

ගම්මුල්ලේ සුමංගල නාහිමිට සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් තව තවත් ශාසනික සේවාවන් ඉටු කිරීමට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් ආයුරාරෝග්‍යය සම්පත් ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමු.

**කේ බණ්ඩාරනායක**



මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ කාරක මහා සංඝ සභාව මගින් සද්ධර්ම කීර්ති ශ්‍රී හිමරතන යන ගෞරව නාම සම්මුතිය සහිතව ගාලු තල්පේපත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක පදවියෙන් පිදුම් ලද ගාල්ල ගොඩකන්දේ ශ්‍රී සුනන්දාරාමාධිපති, විශ්‍රාමලත් විදුහල්පති, ශාස්ත්‍රපති කිරම පේමරතන නාහිමි වෙත නායක පදවිය පිළිබඳ ලිපිය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහ නාහිමියන් විසින් මල්වතු මහාවිහාර ලේකම් කාර්යාලයේ දී පිරිනමන ලද අවස්ථාව.

## දෙහිවල නව පොළොන්නරු ගල් විහාරය

දෙහිවල නව පොළොන්නරු ගල් විහාරයේ 79 වැනි කඨින චීවර පූජා පුණ්‍ය මහෝත්සවය හා විහාරාධිපතිව වැඩ විසූ කථිකාචාර්ය කණුමුල්දෙණියේ ශ්‍රී ධර්මාශෝක නාහිමි ගුණානුස්මරණ මහා සඟසතු දානමය පින්කම මේ මස 16 වැනි දා පැවැත්වේ. විහාරාධිපති හැව්ඹිවිට ගුණානන්ද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයන අංශාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නලින්ද සිල්වා මහතා සහ මහාචාර්ණී රෝහිණී ද සිල්වා මහත්මිය ප්‍රමුඛ දායකත්වය දරති.



පෑලියගොඩ විද්‍යාලංකාර පරිවේණාධිපති සහ අධ්‍යක්ෂ, කොළඹ හලාවත දෙදිසාවේ උපප්‍රධාන සංඝනායක වැලමිටියාවේ කීර්ති ශ්‍රී කුසලධම්ම... 

දිමුතු පුන්සර කොළඹගේ

## ධාතු වන්දනාව

වප් පෝ දා එනම් 08 සහ 09 දිනයන්හි පෙරවරු 07.30 සිට රාත්‍රී 10.00 දක්වා උතුම් ධාතුන් වහන්සේ වන්දනාවක් බොරැලැස්ගමුව පිල්ලෑව බෝධිරාජ විහාරයේ දී පැවැත්වෙන බව පොළොන්නරුව සීලානන්ද හිමියෝ දන්වා සිටිති.




# බොදු දූ පුතුන්ගේ නැණ ගුණ දම් වඩන
## කුඩාබුත්ගමුවේ
# ශ්‍රී සරණංකර ධර්ම විද්‍යාලය



**කොටිකාවත්ත, මුල්ලේරියාව,කුඩාබුත්ගමුව නගර මධ්‍යයේ රමණීය කඳු ගැටයක් මත පිහිටි ශ්‍රී ධර්මරක්ෂිතාරාම විහාරස්ථානයේ අනන්‍යතාව වන්නේ අවට ගම් රාශියකට දිස්වන සේ තනවා ඇති අවුකන පිළිම වහන්සේගේ අනුරුව යි.**




එම විහාරස්ථානය නිර්මාණය කරන්නට යෙදුනු නිර්මාතෘවරයාණන් වූ කොළඹ පළාතේ උප ප්‍රධාන සංඝ නායක ධුරය හෙබවූ කලකිරියාගම ශ්‍රී සරණංකරාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මූලිකත්වයෙන් 1956 නොවැම්බර් මස 04 වැනි දින එම විහාරස්ථානයේ වැඩ විසූ මහාචාර්ය කොටහේනේ පඤ්ඤකිත්ති හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී සරණංකර ධර්ම විද්‍යාලය ආරම්භ කරන ලදී.

එවකට විහාරස්ථානයේ නායක ධුරය හෙබවූ සරණංකර හිමියන්ගේ නාමය දහම් පාසල සඳහා ද යොදා ගැනිණි.

මෙහි පළමු ප්‍රධානාචාර්යවරයාණන් වහන්සේ ලෙස පත්වන්නේ කොටහේනේ පඤ්ඤකිත්ති හිමියන් ය. අලුත්දඹේවටන අත්ථදස්සි හිමියන්, යන්තම්පලාවේ නන්දසාර හිමියන් කීර්ති නාරම්පනාව මහතා යන ප්‍රධානාචාර්යවරුන් යටතේ මෙන්ම තලකිරියාගම සිරිනිවාස හිමියන් යටතේ ද ශ්‍රී සරණංකර ධර්ම විද්‍යාලය දියුණු විය.

වර්තමාන ප්‍රධානාචාර්යවරයාණන් වහන්සේ ලෙස ශ්‍රී ධර්ම රක්ෂිතාරාමයේ විහාරාධිපති දේදුණුපිටියේ අනෝමදස්සි හිමියන් කටයුතු කරයි. උප ප්‍රධානාචාර්යවරයා ලෙස දේශබන්ධු සමන් ආනන්ද මහතා කටයුතු කරයි. අද වන විට දරුවන් 750 කින් පමණ සමන්විත වේ.

ගුරු මණ්ඩලයේ සියලුම ගුරු භවතුන් දැඩි කැපවීමෙන් ධර්ම විද්‍යාලයේ අධ්‍යයන කටයුතු හා විෂය බාහිර කටයුතු සාර්ථක අන්දමින් පවත්වාගෙන යාමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගුරුහරුකම් ලබා දෙයි. ශිෂ්‍ය නායක මණ්ඩලය 66 න් පමණ සමන්විත ය.

අද වන විට ශ්‍රී සරණංකර නාමය කොළොන්නාව බටහිර ශාසනාරක්ෂක බල මණ්ඩලය තුළ කීර්ති නාමයක් දිනාගෙන සිටී. සරණංකර ධර්ම විද්‍යාලය ශාසනාරක්ෂක බල මණ්ඩල තරගවලදී ද ඉදිරියෙන් ම සිටී.

ශ්‍රී ලාංකේය මාධ්‍ය කලාවට නව මුහුණුවරක් එක් කරමින් ඉතිහාසයේ ප්‍රථම වතාවට ගුවන්විදුලි නාලිකාවක් ලෙස 96.1 හරහා 'මෙත්' ලෙසින් ගුවන්විදුලි නාලිකාවක් පවත්වාගෙන යන ලදී. අදටත් මාධ්‍ය ඒකකය මඟින් දක්ෂතා ඇති දරුවන්ගේ හැකියාවන් වැඩිදියුණු කරමින් අනාගත මාධ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් ඉතා වැඩදායි පුරවැසියන් දායාද කරයි. මේ අතරින් මනා කථිකත්වයෙන් හෙබි නිවේදක නිවේදිකාවන් බිහිකර ඇත.


'සම්මා' නම් සඟරාවක් ද පළ කර තිබේ. සෑම වසරක ම නොවැම්බර් 04 වැනි දිනට යෙදෙන දහම් පාසලේ සංවත්සරය වෙනුවෙන් වාර්ෂික ලේ දන් දීමේ පින්කමක් ද පවත්වන්නට යෙදෙයි. සෑම වසරකම දහම් පාසල් දරුවන්ගේ සහභාගිත්වයෙන් භක්ති ගීත වැඩසටහනක් ද පවත්වයි. සෑම වසරකම ජනවාරි මස අලුත්දඹේවටන අත්ථදස්සි හිමියන්ගේ ගුණානුස්මරණය වෙනුවෙන් දුෂ්කර පළාත්වල ජනතාව වෙත ගොස් වියළි ආහාර ප්‍රදානයක් ද සිදු කරයි.

දරුවන්ගේ පෞරුෂ වර්ධනය සඳහා නායකත්ව පුහුණු වැඩමුළු වැනි වැඩසටහන් ද සංවිධානය කරනු ලබයි. සිංහල මාධ්‍යයෙන් මෙන්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද දහම් අධ්‍යාපනය ලබා දේ. දරුවන්ගේ පෝෂණය වෙනුවෙන් සෑම දහම් පාසල් දිනයකම කැඳ වීදුරුවක් ලබා දෙයි.

තලකිරියාගම සරණංකර හිමියන්ගෙන් ආරම්භ වූ ශ්‍රී සරණංකර ධර්ම විද්‍යාලය වර්තමාන ප්‍රධානාචාර්ය දේදුණුපිටියේ අනෝමදස්සි හිමියන් දක්වා ආ ගමන් මගේ දහම් පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ සියලු දෙනාම පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතියෙන් සිහිපත් කර සිටිමු.

අනාගතයේ දී රටට වැඩදායි ගුණයෙන් නැණින් හෙබි පුරවැසියන් බිහි කරන්නට සරණංකර මවුන්ට හැකි වේවා යන්න අපගේ ඒකායන ප්‍රාර්ථනයයි.


ශිෂ්‍ය නායක මණ්ඩලය
ශ්‍රී සරණංකර ධර්ම විද්‍යාලය
කුඩාබුත්ගමුව



**දහම් පාසල් දරුවන් වෙනුවෙන් වෙන්කෙරෙන බුදුසරණ "මේ අපේ දහම් පාසලයි" පිටුවට ඔබගේ දහම් පාසලේ විශේෂ තොරතුරු ලියා එවන්න.**

**" මේ අපේ දහම් පාසලයි"**
**බුදුසරණ කර්තෘ මණ්ඩලය**
**ලේක්හවුස්**
**කොළඹ - 10**

# උතුරා යන තරම් පින් කරන්න
## පුංචි ඔබටත් පුළුවන්



**පින්වත් දුවේ, පුතේ, අපගේ ශාස්තෘන් වහන්සේ පින කියන වචනයට බොහෝ ප්‍රශංසා කර තිබෙනවා. එකම පින නැවත නැවත කරන්න කියලයි උන්වහන්සේ අපට දේශනා කොට වදාළේ. දරුවන් දන්නවා ද? පින තමයි අපට හැම සැපයක් ම, හැම සතුටක් ම ලබා දෙන්නේ. ඉතින් අපේ ජීවිතවලට පින නැතිනම්? එහෙම නම් අපට උරුම වන්නේ දුක විතරයි නේද?**

පුංචි දරුවෝ දැකලා තියෙනවා නේද අපි අතරේ ම ඉන්න දුක් විඳින මිනිස්සු. ඒ අයට හරියට කුසපිරෙන්න කෑමක් නැහැ. ලස්සනට අඳින්න ඇඳුම් නෑ. තමන් කැමැති දේ ගන්න සල්ලිත් නැහැ. එහෙම වෙන්නේ ඇයි කියල ද ඔයාලා හිතන්නේ?

පින්වත් දුවේ, පුතේ අපට එහෙම වෙන්නේ අපි පෙර ජීවිතවල දන් දීලා නැති නිසයි. තමන්ට තිබෙන දෙයින් ටිකක් හරි තව නැති කෙනකුට දන් දෙන්න පුරුදු වීම පුංචි ඔබට සතුටින් ඉන්න එක හේතුවක් වෙනවා.

දුවේ පුතේ, මේ ජීවිතයේ අපට ලැබිලා තිබෙන්නේ පෙර ජීවිතවල දුන්න විදිහටයි. ටිකක් දුන්නොත් ලැබෙන්නේ ටිකයි. ගානට දන් දුන්නොත් අපට ලැබෙන්නේ ගානට. උතුරා යන්න තරම් දන් දුන් කෙනාට උතුරා යන්න ලැබෙනවා. දුන්නේ නැති කෙනාට ලැබෙන්නේ නැහැ. මේක තමයි අපි දුප්පත් පොහොසත් කියලා කියන්නේ.

දුවල පුතාල දන්නවනේ දැන් මේ කාලේ ඔයාගේ අම්මල හුඟක් අමාරුවෙන් තමයි ජීවත් වෙන්නේ. ඔයාලට කන්න බොන්න අඳින්න දෙන්නේ ලොකු කැපකිරීමක් කරලා. ඒනිසා අපි කෑමබීම, පොත්පත් නාස්ති කරන්න හොඳ නැහැ. අරපිරිමැස්මෙන් පරිහරණය කරන්න පුරුදු වුණොත් ඒක ඔයාලගේ අම්මා, තාත්තාට ලොකු සැනසීමක් වෙනවා.

දුවලා, පුතාල ළඟ දෙයක් වැඩියෙන් තියෙනවා නම් ඒ දේ නැති තවත් යාළුවකුට දෙන්න. කෑමක්, පොතක්, පැන්සලක් ඒ යාලුවට අගෞරවයක් වෙන්නේ නැති විදිහට දෙන්න. දීලා බලන්න ඒ යාලුවා කොතරම් සතුටු වෙනවා ද? කියලා. ඒ සතුටම තමයි පුතේ පින කියලා කියන්නේ.

ඒ වගේ ම අපි මවුපියන් ගැනත් හොඳින් හිතන්න ඕනෑ.පුංචි ඔබ අවශ්‍ය දෙයයි, එපා දෙයයි හැමදේම ඉල්ලා ඇඬුවොත් අම්මා, තාත්තා මොන තරම් අපහසුතාවට පත් වෙනවා ද?

පුංචි කාලේ ඉඳලා අපි අම්මා තාත්තා ගැන හිතන්න පුරුදු වෙන්න ඕනෑ. නැතිනම් පුංචි දරුවන් වියළි දර කෝටු වගේ වෙනවා. තෙතමනයක් නැති දරුවෙක් වෙනවා. මවුපියන් ගැන හිතේ තෙතමනයක්, ආදරයක්, සංවේදී බවක් තිබෙන දරුවන් තමයි ලෝකය දිනන්නේ.

දන්දීමේ විපාක කොතරම් ද කියලයි අද ඔයාලට කියලා දෙන්නේ.




මේ සිදුවීම සිදුවුණේ බොහෝ කාලයකට පෙරයි. ඒ ඉන්දියාවේ දී යි. ඉන්දියාවේ ගමක දුප්පත් පවුලක සහෝදරයන් තුන්දෙනෙක් ජීවත් වුණා. අයියලා දෙන්නා කැලේ ගිහිං මීවද කඩාගෙන එනවා. මල්ලී ඒ මී පැණි කඩේ තබා ගෙන විකුණනවා.

දවසක් පසේබුදුරජාණන් වහන්සේ නමකට බෙහෙතකට මී පැණි ටිකක් ඕනෑ වුණා. උන්වහන්සේ ගමේ මී පැණි කඩේ ළඟට පිණ්ඩපාතයේ වැඩියා. උන්වහන්සේ දුටු මල්ලීට ලොකු සතුටක් ඇති වුණා. හිත පැහැදුණා. පසේබුදුරජාණන් වහන්සේගේ අතේ තිබුණ පාත්‍රයට පිරෙන්න මී පැණි පූජා කළා. පාත්‍රය පිරුණත් මී පැණි පිදුවා. ඇති කියලා ඔහුට හිතුණේ නැහැ. පාත්‍රය පිරිලා ඉතිරිලා මී පැණි බිමට විසිරෙන තුරුම පූජා කළා. දැන් මල්ලීට හරි සතුටුයි.

ඊට පස්සේ ඒ මල්ලී පසේබුදුරජාණන් වහන්සේ ළඟ දණ ගසා වන්දනා කරමින්

"ස්වාමීනී මේ මී පැණි පාත්‍රයේ උඩට ම පුරවා, උතුරා බිමට වැටෙන තුරුම පූජා කළ පින් බලයෙන් මම අනාගතයේ මුළු දඹදිවටම අග රජු වේවා, මගේ අණසක යොදුනක් අහසටත්, යොදුනක් පොළොවටත් පැතිරේවා. කියලා ප්‍රාර්ථනා කළා. ඉතින් පසේබුදුරජාණන් වහන්සේ මල්ලීට සෙත් පතා නැවත වැඩියා.

සවස අයියලා දෙන්නා ආවා. මල්ලී මේ විස්තරේ කියලා

"අයියේ මම කළ පින ඔය දෙන්නත් අනුමෝදන් වෙන්න" කිව්වා. ඒත් සහෝදරයන් දෙදෙනාට තරහා ගියා.

"මල්ලී රවටලා මී පැණි ගත්තේ ශ්‍රමණයෙක් වෙන්න බැහැ. ඒ සැඬොලෙක් වෙන්න ඇති." කියලා ලොකු අයියා කිව්වා.

දෙවැනි අයියා කීවේ "මල්ලී රවටා මී පැණි ගත් ඒ ශ්‍රමණයන් මුහුදෙන් එහාට වීසි කරන්නයි වටින්නේ" කියලයි.

අයියලාගේ කතා අහලා මල්ලීට ගොඩාක් දුක හිතුණා. පසේබුදුරජාණන් වහන්සේගේ සංවරයත්, සීලයත්, ගුණයත් මල්ලී සහෝදරයන් දෙදෙනාට පැහැදිලි කළා. ඊට පස්සේ අයියලා දෙන්න ඒ පින සතුටින් අනුමෝදන් වුණා.

ඉතින් දුවේ පුතේ, කාලයකට පස්සේ ඒ සියලු දෙනා මියපරලොව ගියා. මී පැණි පිදූ ඒ මල්ලී ඉන්දියාවේ උපන්නා. ඒ තමා අපි කවුරුත් අහල තියෙන ධර්මාශෝක අධිරාජයා. ඔහු පෙර ආත්මයක පසේ බුදුරදුන් ඉදිරියේ ප්‍රාර්ථනා කළ ආකාරයට ම යොදුනක් අහසේ සිටින කුරුල්ලාගේ සිට යොදුනක් මුහුද යට ඉන්න දිව්‍ය නාගයෝ දක්වා සියලු සත්වයෝ රජුට යටත් වූවා. ඔහුට සේවය කළා.

වැඩිමල් අයියා ඒ පින පසුව අනුමෝදන් වුණානේ. ඒ පිනෙන් රාජ බිසවගේ කුසේ පිළිසිඳ ගත්තා. එහෙත් වචනය වරද්දවා ගත් නිසා උපන්නේ සැඬොල් ගෙදරක. පින බලවත් නිසා අවුරුදු 7 දී පැවිදි වී රහත් වුණා. ඒ තමා ධර්මාශෝක අධිරාජයාට ධර්මය කියා දුන් නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ.

මද්දුම අයියත් පින අනුමෝදන් වුණා. එහෙත් ඔහු කිව්වානේ "මුහුදෙන් එතෙරට වීසි කරන්න ඕන" කියලා. ඒ වචනයට ඔහු මුහුදෙන් එතෙර තිබෙන ලංකාවේ උපන්නා. කවුද දන්නවා ද? ඒ අපගේ සම්බුද්ධ ශාසනයට විශාල මෙහෙවරක් කළ දෙවනපෑතිස් රජුයි.

බලන්න දුවේ පුතේ, පින විපාක දෙන විදිහ. වචනයක් වැරදුනත් එයත් විපාක දෙනවා. පිනක් කළත්, තව කෙනකු කළ පිනක් අනුමෝදන් වුණත් ඒ පිනෙන් ලැබෙන්නේ මහා පිනක්.

ඒ නිසා ඔයාලගේ අම්ම, තාත්තා, වැඩිහිටියන් කරන පින් දැකල සාධු, සාධු කියලා සතුටින් අනුමෝදන් වෙන්න පුළුවන් විදිහට ඔබත් දන් දෙන්න. උතුරා යන්න දෙන්න පුළුවන් නම් ඕනෑම දෙයක් ඒ ලෙසම දන් දෙන්න. එතකොට කවදා හරි දවසක උතුරා යන සැප සම්පත්, සතුට වගේම උතුරා යන ගුණ දහම් ගංගාවක් පුංචි ඔයාලගේ ජීවිතවලටත් ගලා ඒවී.

නයනා නිල්මිණී





### මහා සංඝරත්නය මෙසේ වන්දනා කරමු

**සීලවන්තං ගුණවන්තං**
**පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං**
**දුල්ලභෙන මයා ලද්ධං**
**වන්දිතුං පස්සිතුං වරං**

සිල්වත් වූ ගුණවත් වූ
අනුත්තර පින් කෙතක්
වූ මේ සංඝයා වහන්සේ
ප්‍රසාදයෙන් යුතුව
වැඳීමට ලැබීම මා
ලැබූ දුර්ලභ භාග්‍යයකි

**සාරි පුත්තාදි ථෙරානං**
**ආගතං පටිපාටියා**
**සද්ධා සීල දයා වාසං**
**බුද්ධ පුත්තං නමා මහං**

සැරියුත් ආදී මහා තෙරවරුන්ගෙන්
පැවත එන
ශ්‍රද්ධාවෙන්, සීලයෙන් හා කරුණාවෙන්
යුතුව වාසය කරන
මේ බුද්ධ පුත්‍රයින් වහන්සේ නමදිමි



කඩවත රම්මුතුගල ශ්‍රී පුනගලංකාර පුරාණ විහාරස්ථානයේ ඉදිකරන ලද බුද්ධ ප්‍රතිමා වහන්සේ නිරාවරණය කිරීමේ පුණ්‍ය මහෝත්සවය මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනු නායක දිඹුල් කුඹුරේ විමල ධම්ම අනු නා හිමිපාණන් වහන්සේගේ සහභාගිත්වයෙන් සැප්තැම්බර් 22 වැනි දින පැවැත්විණි. ශ්‍රී පුනගලංකාර විහාරස්ථානයේ විහාරාධිපති නා හිමියන්ගේ අනුශාසකත්වයෙන් කඩවත පදිංචි ජගත් හපුආරච්චි මහතා සහ නිරෝෂා මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් මෙම පින්කම සිදු කෙරිණි.

## රාජකීය පණ්ඩිත උපාධි ලබති



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වන ලද ප්‍රාචීන පණ්ඩිත උපාධි අවසාන විභාගයෙන් මුළු දිවයිනෙන් ම දෙවන ස්ථානය දිනා ගනිමින් රාජකීය පණ්ඩිත උපාධිය හිමි කර ගැනීමට මහනුවර අස්ගිරි මහාවිහාර මහා පිරිවෙනේ ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය කළ දෙදියගල නන්දරතන හිමියෝ සමත් වී ඇත.

පසුගිය වර්ෂයේ ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් ද දිවයිනේ දෙවන ස්ථානය හිමි කර ගත් දෙදියගල නන්දරතන හිමියන් ස්වකීය උපසම්පදාව නිමිත්තෙන් සිරි සරණංකර සංඝරාජ ථෙරාපදානය නමින් පාලි පද්‍ය ග්‍රන්ථයක් සම්පාදනය කොට මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ විංශත්වර්ගික කාරක මහා සංඝසභාව වෙත ඉදිරිපත් කොට ශ්‍රීමත් මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ සංඝ සභාවේ මහත් සම්භාවනාවට පත් විය.

## අනුරාධපුර බෞද්ධ මණ්ඩල සංවර්ධන සමිතිය

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස පවත්වන ක්ෂීරපායාස බුද්ධ පූජාව මේ මස 10 වැනිදා පෙරහරින් වැඩමවා සම්මා සම්බුදුරජාණන් වහන්සේ උදෙසා පූජා කිරීමට කටයුතු යොදා ඇත.

චතුමධුර, අෂ්ඨවිධ පාන වර්ග ඇතුළත් ගිලන්පස බුද්ධ පූජාව 09 වනදා සවස ද, ව්‍යංජන වර්ග 112කින් සමන්විත බුද්ධ පූජාව 10 වනදා දහවලදී ද පැවැත්වේ. කඨින වස්ත්‍ර පූජාව නොවැම්බර් 07 වනදා පැවැත්වීමට නියමිත ය. එදිනට දහවල් 25 නමකට අධික ගරුතර මහා සංඝරත්නය විෂයෙහි පවත්වනු ලබන සාංඝික දානය සහ සවස 4.00 ට කඨින ආනිසංස ධර්ම දේශනාව පවත්වන බව අනුරාධපුර බෞද්ධ මණ්ඩල සංවර්ධන සමිතිය දන්වා සිටී.

# කඨින පින්කම්

### ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරය

ත්‍රිකුණාමලය, මොරවැව, ශ්‍රී ශාක්‍ය සිංහාරාම විහාරස්ථානයේ කඨින පින්කම නොවැම්බර් මස 5, 6 දිනයන්හි පැවැත්වේ. 5 දින සවස 6.00 ට අටවිසි ගිලන්පස බුද්ධ පූජාව සහිත බෝධි පූජාව, පසුදින අලුයම කඨින චීවරය රැගත් පෙරහර පිටත් වී විහාරස්ථානයට ළඟාවීම, දහවල කඨින චීවරය සඟසතු කිරීම සහ සාංඝික දානය අරුග්ගොඩ විමලරතන හිමියන්ගේ අනුශාසනා මත පැවැත්වේ.

### තල්පිටිය ශ්‍රී දළද පුරාණ විහාරය

දකුණු තල්පිටිය ශ්‍රී දළදාවත්ත පුරාණ මහා විහාරයේ වාර්ෂික කඨින පූජා පින්කම මෙම මස 16 වැනි දා පැවැත්වේ. අලුයම 3.00 ට කඨින වස්ත්‍රය රැගත් පෙරහර වීථි සංචාරය කර මෙදින අලුයම 5.30 ට විහාරස්ථානයට පැමිණෙන අතර විහාරාධිපති පානදුර තොටමුණබද රයිගම් කෝරළයේ ප්‍රධාන සංඝනායක විශ්‍රාමලත් පරිවේණාධිපති ශාස්ත්‍රපති තල්පිටියේ චන්දරතන නාහිමියන්ගේ අනුශාසනා පරිදි සිදු කෙරේ.

**තල්පිටියේ ඩබ්.එම්.එන්.වී. විජේනායක, (වාද්දුව සංචාරක)**

### බෝධිරාජ මහා විහාරය

උතුරු තල්පිටියේ බෝධිරාජ මහා විහාරයේ වාර්ෂිකව පවත්වනු ලබන කඨින පූජෝත්සවය මෙම මස 16 වැනි දා පැවැත්වේ. කඨින පෙරහර අලුයම 3.00 ට පිටත් වී 5.30 විහාරස්ථානයට ළඟාවීමට නියමිත ය. මෙදින මෙම පූජෝත්සවය තල්පිටිය බෝධිරාජ මහා විහාරයේ විහාරාධිපති පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය අග්ගමහා පණ්ඩිත කොටපිටියේ රාහුල අනු නාහිමියන්ගේ අනුශාසනා පරිදි විහාරාධිකාරී රාජකීය පණ්ඩිත ඥාණතිලක හිමියන්ගේ සංවිධානයෙන් දවස පුරා පැවැත්වේ.

**වාද්දුව සංචාරක**

### විපස්සනා භාවනා මධ්‍යස්ථානය

උතුරු තල්පිටිය විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන කඨින පූජා මහෝත්සවය මෙම මස 15 වැනි දා පැවැත්වේ. මෙදින අලුයම 3.00 ට කඨින වස්ත්‍රය රැගත් මහා පෙරහර වීථි සංචාරය කර අලුයම 05.30 විහාරස්ථානය කරා ළඟාවීමට නියමිත ය.

විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ විහාරාධිපති ශාස්ත්‍රපති හැඬිගල්ලේ වජිර නා හිමියන්ගේ අනුශාසනා පරිදි මෙම මහා පින්කම සිදුකෙරේ.

**වාද්දුව සංචාරක**

### මුදලින්දරාමය

වාද්දුව දකුණු තල්පිටිය මුදලින්දාරාම මහා විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන කඨින පූජා මහා පින්කම මෙම මස 22 වැනි දින පැවැත්වේ. එදින පෙරවරු 3.30 කඨින වස්ත්‍රය රැගත් පෙරහර පිටත්වී වීථි සංචාරය කර පෙරවරු. 5.30 විහාරස්ථානයට ළඟාවීමට නියමිත ය. මෙදින දවස පුරා කඨින පූජා පින්කම් පැවැත්වේ.

**වාද්දුව සංචාරක**

### මාවිත්තර සිරි තිසරණ ධර්මායතනය

විහාරාධිපති ඇඹිලිපිටියේ රතනජෝති හිමියන්ගේ අනුශාසනා පරිදි මෙවර මාවිත්තර සිරි තිසරණ ධර්මායතනයේ කඨින පින්කම සහ ඊට සමගාමීව ගැටමාන්නේ හේමාලෝක නා හිමියන්ගේ හයවන වර්ෂ පූර්ණ ගුණ සමරු පින්කම් මාලාව ද පැවැත්වේ.

මේ මස 27, 28, 29 සවස 07.00 ධර්ම දේශනා මාලාව දියතලාවේ පියදස්සි හිමි, ගොම්බද්දල දමිත හිමි, මස්සැන්නේ විජිත හිමිවරුන් විසින් පවත්වනු ලැබේ. 30 වැනි දා රාත්‍රී 6.30 බෝධි පූජාව පුලිකණ්ඩිකුලමේ රතනසිරි හිමියන් විසිනි. එදින රාත්‍රී 8.00 පිරිත් දේශනය ආරම්භ වන අතර 31 වැනි දා අලුයම 5.30 ට කඨින චීවරය විහාරස්ථානයට වැඩම කෙරේ. කඨිනානිසංස ධර්ම දේශනය දර්ශනපති පුස්සැල්ලායායේ චන්දිම හිමියන් විසින් පැවැත්වීමට නියමිත ය.

### සංකල්ප විහාරය

පිළියන්දල මාකන්දන සංකල්ප විහාරස්ථානයේ කඨින පින්කමට සමගාමීව පැවැත්වෙන වස්සාන ධර්ම දේශනා මේ මස 21 සිට නොවැම්බර් 03 වන දින දක්වා දිනපතා රාත්‍රී 7.00 ට පැවැත්වේ. සියඹලාගොඩ ධම්මින්ද හිමි, මැදගොඩ අභයතිස්ස හිමි, කැලණියේ අජිත හිමි, ගබ්බෙල වජිර හිමි, බොරැල්ලේ කෝවිද හිමි, අගලකඩ සිරිසුමන හිමි, හසලක සීලවිමල හිමි, හිඟුරේ පඤ්ඤසේකර හිමි, මාවතගම පේමානන්ද හිමි, මිරහවත්තේ පඤ්ඤසිරි හිමි, පදලංගල ධම්මදේව හිමි, ඇත්කඳුරේ සුමනසාර හිමි, මහඔය අනුරුද්ධ හිමි, මස්සැන්නේ විජිත හිමි යන හිමිවරුන්ගේ ධර්ම දේශනා ඇතුළත් වේ. නොවැම්බර් 04 වන දින කඨින චීවර පෙරහර සවස 2.00 ට වීථි සංචාරය ආරම්භ කරන අතර, නොවැම්බර් 5 උදෑසන කඨින චීවර පූජාව, දහවල 50 නමක් විෂයෙහි සපිරිකර මහා දානමය පූජාවත් පැවැත්වේ. උග්ගොඩ ධම්මින්ද හිමියන්ගේ අනුශාසකත්වයෙන් මෙම පින්කම් මාලාව පැවැත්වේ.

## පල්ලෙකැලේ සිරි සම්බෝධි ධර්මායතනය

කුණ්ඩසාලේ පල්ලෙකැලේ සිරි සම්බෝධි ධර්මායතනයේ ඉදි කරන ලද ත්‍රිපිටක පුස්තකාලය සහිත දෙමහල් සංඝාවාසයට ගෙවදීමේ පින්කම මේ මස 22 වැනි දින සිදු කිරීමට නියමිතය. විහාරාධිපති බුලන්කුලමේ උපවංශ නාහිමියන්ගේ මඟ පෙන්වීමෙන් ගොඩනැඟිල්ල ඉදිවුණි. එයට සමගාමීව කඨින පින්කම මේ මස 22 හා 23 යන දිනයන්හි පැවැත්වීමට නියමිත ය.

**සුනිල් ගුණවර්ධන - කුණ්ඩසාල සමූහ**

## මයිලෑව ඓතිහාසික ශෛල බිම්බාරාම රාජමහා විහාරස්ථානය

මානව හිතවාදී මානව හිමිකම් සංවිධානයේ මෙහෙයවීමෙන් මේ මස 09 වැනිදා (පෝ දින) මයිලෑව ඓතිහාසික ශෛල බිම්බාරාම රාජමහා විහාරස්ථානයේ දී ශීල සමාදාන වැඩසටහනක්, මල් පෙරහරක් සමඟින් පසුදින උදෑසන සඟසතු දානමය පින්කමක් පැවැත්වේ. 09 වැනිදා රාත්‍රී 7.00 ට මයිලෑව විහාරස්ථානයේ දී සැනසිලිගම විමලානන්ද හිමියන්ගේ කාව්‍යමය ධර්ම දේශනාවක් ද පැවැත්වේ. මෙම පින්කම් මාලාවවිල්ගමුවේ සුමනරත්න හිමි හා දොඩම්පල ධර්මරාජ යන හිමිවරුන්ගේ අනුශාසකත්වයෙන් සිදුවේ.

**එල්. ඩබ්. ආරියරත්න - උඩුගමුපොල**

## ඌව වෙල්ලස්ස ප්‍රධාන සංඝනායක පදවිය



සියම් මහා නිකායේ අස්ගිරි මහා පාර්ශවයේ ශ්‍රීමත් මහා නාහිමියන් ප්‍රමුඛ විංශවර්ගික සානුනායක කාරක සංඝ සභාව මඟින් බුත්තල ඓතිහාසික යුදඟනාව රාජමහා විහාරාධිපති ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත ගල්ටැම්වත්තේ නන්දරතන හිමි වෙත ධර්මකීර්ති ශ්‍රී චන්ද්‍රජෝති ගෞරවනාමය සහිතව ඌව වෙල්ලස්ස දෙදිසාවේ ප්‍රධාන සංඝනායක පදවිය පිරිනමා ඇත. 1975 මැයි 26 වැනිදා උපත ලද උන්වහන්සේ 1988 නොවැම්බර් 16 දින ගල්ටැම්වත්තේ චන්ද්‍රජෝති නාහිමියන්ගේ ආචාර්යත්වයෙන් සම්බුදු සසුනට පිවිසුණහ. 1995 මැයි 26 දින මහනුවර අස්ගිරි මහා විහාරීය උපෝසථාගාරයේ දී උපසම්පදා ලැබූහ. අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

**ඩී.එස්. ගුණතිලක -ඌව වෙල්ලස්ස විශේෂ**

# මහියංගණ බලකොටුව සතුරා අතට පත්වෙලා

**මහ ඇමතිතුමනි, අම්බතිත්ථ බලකොටුව රුහුණු බල සේනා වටකර ඇති බව ඔබතුමා දන්නේ නැද්ද? සෙන්පතිතුමා පහරදීමට පටන් අරගෙන.**

"ඡත්ත සේනාධිපතිතුමාත්, පන්දාහක බල සේනාවත්, මහියංගණ බලකොටුවත් සියල්ලම ගිනිබත් වෙලා. දුටුගැමුණු රජතුමා මහියංගණ විහාර හදනවා ඒ පව් ගෙවන්න."

"තොප ඒ බව ස්ථිරව කියන්නේ කෙසේද? දුටුගැමුණු රජු ලක්ෂයකට අධික සේනාංකයක් රැගෙන එන බව තොප දන්නවාද?"

"විය හැකියි මහ සෙනෙවිතුමනි. නමුත් මහියංගණයට පහර දී තිබෙන්නේ දස දහසක පමණ පිරිසක්. අඹටුව ප්‍රදේශය වටලාගෙන සිටින්නේ ඒ හා සමාන පිරිසක්. තමන්ගේ සේනාංක ලවා දුටුගැමුණු රජතුමා වැව් බන්දවා වෙහෙර විහාර හදනවා. චෛත්‍ය හදනවා. ගොවිතැන් කරනවා.

මහවැලි ගං තීරයේ බලකොටුවලට පහර දෙන්නේ එම ආරක්ෂක කඳවුරු කලින් භාරව සිටි දීඝාභය කුමාරයාගේ සේනාංක බව අපට දැන ගන්නට ලැබුණා. ඒ නිසා වඩාත් බියට පත් වුණා.

"සිරිනාග, මම ඔබෙන් සමාව අයදිනවා. ඔබ දක්ෂයෙක්. ඔබට පැවරී ඇති කාර්යයන් ඔබ සාර්ථකව ඉටු කරනවා."

මහ සෙනෙවිතුමනි, මේ මගේ සාර්ථකත්වය නොවෙයි. මා සිටිනා පිලේ සාර්ථකත්වයයි. එහි වටිනාකම ඔබටත් අනාගතයේ දැනේවි.

මොහු තීක්ෂණ නුවණක් හිමි දක්ෂයෙක්. මොහු අයිති පිල කුමක්දැයි දීඝාභය කල්පනා කළේ ය.

"අපේ සියලු වැඩ ප්‍රමාදයි. පසුගාමියි. මේ සියලු විනාශයන්ට හේතුව එයයි. යුද්ධ මණ්ඩල රැස්වීම සති කිහිපයකින් ම පැවැත්වූයේ නැහැ. සතුරා තවම සූදානම් නැතැයි සිතීමේ විපාක අපට අත්විඳින්නට සිදුවෙලා. මේ නිසා රජතුමාගේ දෝෂාරෝපණයෙන් මිදෙන්නට අප කිසිවකුටත් බැහැ."

"දීඝජන්තු මහ සෙනෙවිතුමනි, ගිය නුවණ ඇතුන් ලවාවත් අද්දවන්නට බැහැ"යි කියමනක් තිබෙනවා. ඒ නිසා අපි ඉදිරියේ දී බොහෝ සැලකිල්ලෙන් වැඩ කරමු.

සිරිනාගගේ කියමන කාගේත් අවධානයට යොමු විය. "මහියංගණ බලකොටුව සතුරා අතට පත්වෙලා. එය වළක්වා ගැනීමට අවශ්‍ය වුණත් ඒ සඳහා නිසි සැලසුම් ක්‍රියාත්මක වී නැහැ."

"අලුත් තීරණ කිසිවක් අපට මේ වනතුරු දැන ගන්නට ලැබී නැහැ. අද ගත් තීරණ සියල්ල වහාම ක්‍රියාත්මක වන්නට ඕනෑ. උද්ගත වී ඇති අලුත්ම තත්ත්වයට විසඳුම් අද සවස් වරුවේ රජතුමා හමුවී සාකච්ඡා කරන්නට පුළුවන්." මහ ඇමැති කීවේ ය.

මහ රජතුමා සම්මන්ත්‍රණ ශාලාවට පැමිණියේ ය. අශ්වාරෝහකයන් කණ්ඩායමකට මැදිව එළාර රජතුමා ධවල අශ්වයකු පිට නැඟී විත් අසු පිටින් බැස්සේ ය. මහ ඇමැති ප්‍රධාන සෙනෙවිවරුන් ඉදිරියට ගොස් රජතුමා පිළිගත්හ. රජු ශාලාවට කැඳවාගෙන එනු ලැබිණ. සියලු දෙනා නැඟී සිට රජතුමා අසුන් ගත් පසු ආචාර කර හිඳ ගත්හ.

කිසිවකුගේ හඬක් නොනැඟුණු තැන රජතුමා කතා කළේ ය.

"අත්පත්වී ඇති පරාජය සිදුවී ඇති විනාශය දැන් අප කවුරුත් දන්නවා. ඡත්ත සේනාධිපතිගේ මරණය අසා, ඔහුගේ සොයුරු මහේල සිටුතුමා අසනීප වෙලා. සැබෑ තොරතුරු දැන ගැනීමට කණ්ඩායමක් මහියංගණයට යැව්වා. අම්බතිත්ථ බල කොටුවටත් සේනාංක කිහිපයක් යැවීමට කටයුතු කරන්නට ඕනෑ."

"සිරිනාග ඉදිරිපත් කළ යෝජනාව දැන් ක්‍රියාත්මක කරන්නට බැහැ. එගොඩ තීරයේ සියලු කඳවුරු ඉවත්කර මෙගොඩ ප්‍රධාන තොටමුණු ආරක්ෂා කර ගැනීමයි මේ මොහොතේ කළ යුත්තේ."

මහ රජතුමනි, කසාතොට, දාස්තොට දමුන්නරු මහ ගංතොට ආරක්ෂා කිරීමේ වැදගත්කම මම කිහිප අවස්ථාවක දී පෙන්වා දුන්නා. අපේ රහස් මාගමට දැන ගන්නට නොලැබුණා නම් දාස්තොටින් රාජධානියට පිවිසෙන මුළු රුහුණු සේනාවම විනාශ කරන්නට අපට පුළුවන්කම තිබුණා."

"දේවයන් වහන්ස, අපේ ඉලක්කය විය යුත්තේ දුටුගැමුණු සේනාවට ගඟෙන් මෙගොඩට එන්නට නොදී සමූල ඝාතනය කිරීමයි. ඒ සඳහා වැඩිපුර බළ සේනාව යොදවන්නට මට අවසර දුන මැනවි.

තොප දෙදෙනාම හරි. අද යුද්ධ මණ්ඩලයේ දී ගත් තීරණ වහාම ක්‍රියාත්මක කරමු. අම්බතිත්ථය ගැමුණු රජතුමාට ජය ගන්නට බැරි වේවි. එහි මහ සෙන්පති පරාජයට පත්වුණොත් එගොඩ සියලු කඳවුරු සියල්ල ඉවත් කර ගනිමු. දීඝාභය කී පරිදි මහවැලි නදියෙන් පනින්නට ඉඩ නොදී අපේ දේශසීමා රැක ගනිමු.

"රජතුමනි, සතුරා කොයි මොහොතේ කොතැනින් පහර දේවිදැ'යි සිතා ගන්නට බැහැ. ඒ නිසා ඇතුළු බලකොටුවල ආරක්ෂාව ලිහිල් කිරීම එතරම් නුවණට හුරු නැහැ."

"සිරිනාග අප හැමෝටම කලින් මහියංගණ බලකොටුවේ විනාශය තොප දැන ගත්තේ කෙසේද?"

"හීපතකින් මහ රජතුමනි, හී පොළට ආ හී පතකින්, එය රැගෙන ඔබ වහන්සේ හමුවන්නට මහ ඇමැතිතුමාගෙන් අවසර ගන්නට ගිය අවස්ථාවේ දී දැන ගත්තේ ඔබ වහන්සේ රජමාලිගයේ නැහැ කියලා.

"අද යුද්ධ මණ්ඩල රැස්වීමට නොපැමිණ ගිරිල, මහෙල සිටුවරුන් හමු වී එම බලකොටුවල ආරක්ෂක තත්ත්වය සොයා බැලීමට අසරු සේනාවක් සහිතව අලුයම් කාලයේ ම මා පිටත් වුණා.

එහෙත් මහෙල සිටුතුමාගෙන් මහියංගණ බලකොටුවේත්, ඡත්ත සේනාධිපතිගේත් විනාශය දැන ගත් වහාම මම ආපසු පැමිණියා. මට එහිදී දැනගන්නට ලැබුණු කරුණු අනුව අපේ රාජ්‍යය සුරක්ෂිත නැහැ. අද මෙහි සිටින සියලුම සෙනෙවිවරු ඒ කාරණය සිතට ගත යුතුයි."

රජතුමනි, රුහුණු බල සේනාව මෙහෙයවන්නේ දුටුගැමුණු රජතුමා. නමුත් ඒ සේනාව ක්‍රියාත්මක වන්නේ විහාරමහාදේවියගේ උපදෙස් අනුවයි.

"දිනපතාම අලුත් තරුණයන් දැන් දහස් ගණනින් දුටුගැමුණුගේ හමුදාවට බැඳෙනවා. ඔවුන් පුහුණු කරන්න උපතිස්ස, හරණ දෙදෙනා යොදවලා. ප්‍රධාන සෙනෙවිවරුන් තිදෙනෙක්, දහසකින් යුත් අසරු කණ්ඩායම් තුනක් සහිතව මෙතෙරට පනින්න සූදානමින් ඉන්නේ. දැනට තෝරාගත් පා බල සේනාංක කිහිපයක් පමණයි යුද වදින්නේ.

***ඉතිරි කොටස අන්තර්ජාල කලාපයේ පළවේ***




දුටුගැමුණු මහ රජතුමා
82 කොටස

අයන්ති විතාන

# අතීත හෙළයේ සංස්කෘතික අභිමානය ලෝකයාට කියා දුන්

## මහාචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයා



**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රථම ලාංකික පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙසින් 1940 සිට 1956 තෙක් සේවය කළ මේ මහා පුරාවිද්‍යාඥයා 1957 සිට 1965 තෙක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා අංශයේ ප්‍රථම පුරාවිද්‍යා මහාචාර්යවරයා වූයේ එකල පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ ආරාධනය පරිදි ය.**

අපේ ඕනෑම ගමක, ගෙයක, පන්සලක හෝ සභාවක "පුරාවිද්‍යාව" යන වචනයත් සමඟ පරණවිතාන මහතාගේ නමත් නිතැතින්ම සිහියට නැගෙනු ඇත. මීට වඩා අමරණීය අනුස්මරණ ස්මාරකයක් විද්‍යාඥයෙකුට හෝ ලේඛකයෙකුට අවශ්‍ය නොවේ. ලංකාවේ පැරණි සමාජයේ හැම අංශයක් පිළිබඳවම පරණවිතාන මහතා කර ඇති පර්යේෂණ හා වැඩකටයුතු නැවත විමසා බලා අද පවතින විද්‍යාත්මක සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ඒවා තවත් ඉදිරියට ගෙන යෑම හා නූතන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් යොදා ගැනීම අද අපට පැවරී ඇති වගකීමයි".

මහාචාර්ය සේනක බණ්ඩාරනායක අප ඇඳුරිදු ප්‍රකාශ කළ ඒ කරුණු මෙකල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ වගකිවයුතු සැමගේම කාර්යභාරය කෙසේ සකස්විය යුතු ද යන කරුණ ද අවධාරණය කර තිබීම ඉතා වැදගත් වන්නේය.

අනුරාධපුරයේ පිහිටි අභයගිරි හා ජේතවන යන දාගැබ් දෙකේ නාමයන් සිංහල රජ කාලයේ නොව මෑත භාගයේදී හඳුනා ගෙන තිබුණේ ඒ නාමයන් මාරු කර ගෙනය. එය නිවැරැදි කළේ ශිලාලේඛන සාක්ෂි සහිතව එකල පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූ ආචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයා ය. අනුරාධපුරයේ එතෙක් දෙමළ මහා සෑය නමින් භාවිත වූ එම දාගැබ සිංහලයේ මහා විරුවෙකු වූ දුටුගැමුණු රජ අභාවයෙන් පසු එම දේහය ආදාහනය කළ ස්ථානයේ ඉදි කරවූ දාගැබ දෙමළ මහා සෑය නොව දකුණු දාගැබ බව ද ශිලාලේඛන සාක්ෂි සහිතව එහි පුරාවිද්‍යා කැණීම් ද සිදුකර පැහැදිලි කළේ ආචාර්ය සෙනරත් පරණවිතාන පුරාවිද්‍යා කොමසාරිස්වරයා ය.

හෙළයේ මහගත්කරුවෙකු වූ මුණිදාස කුමාරතුංග පඬිවරයා, ආචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයා පුරාවිද්‍යා කොමසාරිස් තනතුරට පත්වීමෙන් පසුව ලියූ වදනක් මෙසේය.

ඇතැමෙක් තනතුරු නිසා බැබලෙති. එහෙත් පරණවිතාන මහතා පිළිබඳ එය නොයෙදේ. පරණවිතාණයන් නිසා තනතුරු බැබලේ. (මුණිදාස කුමාරතුංග සකසූ සුබස දෙවන වෙළුම 8 කලබ (1940 -9 -9)

සැබැවින්ම ආචාර්ය සෙනරත් පරණවිතාන පුරාවිද්‍යා කොමසාරිස්වරයා තනතුර බැබලවීය.

ගමක පන්සලක පමණක් නොව විද්වත් සභාවක වුවද, පරණවිතාන නාමය ගැමි ජනතාව අතර පවා ප්‍රචලිත වී තිබුණු බව ඉතා ප්‍රකට කරුණකි.

අපේ රටේ ගැමියන් අතර පවා අකුරු පැහැදිලි නැති අකුරු ඒ නිසා කියැවීමට නොහැකි ලියුමක් හො ලියැවිල්ලක් දුටුවිට "මේක කියවන්න නං ඉතිං සෙනරත් පරණවිතාන මහත්තයට වත් බැරිවෙයි, යන ඒ කතාබහ අපේ පුරාණ ගැමි සමාජයෙන් ඇසෙනු ඇත.

මහාචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයාගේ විශිෂ්ටතම ග්‍රන්ථය බොහෝ විද්වතුන් සඳහන් කරන පරිදි සීගිරි කුරුටු ගී SIGIRI GRAFFITI (සීගිරි ග්‍රැෆිටි) ග්‍රන්ථයයි. එය වෙළුම් දෙකකින් යුක්ත ග්‍රන්ථයකි.

සීගිරිය එතුමා ප්‍රිය කළ ඉතාමත් ඇලුම් කළ පුරාවිද්‍යා බිමකි. ඒ නිසාම එතුමා අභාවයට පත්වීමෙන් පසු එම දේහය ආදාහනයෙන් ලබාගත් භෂ්මාවශේෂ නිදන්කර පරණවිතාන පඬිවරයාගේ ප්‍රතිමාවක් සීගිරි පර්වතය දෙස බලා සිටින අන්දමින් නිර්මාණය කර ඇත. මහාචාර්ය සෙනරත් පඬිවරයා නොසිටින්නට අදටත් ඒ සීගිරි කැටපත් පවුරේ එකල සීගිරි නැරඹීමට පැමිණි ජනතාව ලියූ සීගිරි ගී සීගිරි කැටපත් පවුරටම සීමාවී මැකී යනවාට කිසිම සැකයක් නැත.

මේ මහා පඬිවරයාණට ජාතිය ණය ගැතිය. එතුමා පිළිබඳ අපේ පාසල්වල දූදරුවන්ට පහදාදීම මේ යුගයේ අප හැමගේ ම යුතුකම වන්නේ ය.

***(ඔක්.04 වැනිදාට යෙදුණ මහාචර්ය සෙනරත් පරණවිතාන මහතාගේ 50 වැනි ගුණානුස්මරණය නිමිත්තෙනි. )***

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර පුරාවිද්‍යා
අධ්‍යක්ෂ හා මහාචාර්ය සෙනරත් පරණවිතාන පදනමේ ලේකම්
**සිරිසමන් විජේතුංග**

# වෙන්වීමේ දුකට හඬනවා ද?

**සැවැත්නුවර එක්තරා සිටුවරයකු මිය ගියා. ඔහුගේ පුතා පියාගේ මරණය නිසා දැඩි ශෝකයෙන් තැවෙමින්, හඬමින් උමතු වූවකු මෙන් ඇවිදිමින් යම් කෙනෙක් මුණ ගැසුණා ද ඒ අයගෙන් "මාගේ පියා දුටුවේ ද?" කියා අසයි. ඔහුගේ දුක දුරු කිරීමට කිසිවකුට නොහැකි වූවා.**

ශාස්තෲන් වහන්සේ එදින අලුයම් කාලයේ ලොව බලන කල්හි මේ අඬා වැටෙන පුත්‍රයාට සෝවාන් වීමට පින් ඇති බව දැන මොහුට අතීත කාරණයක් පැහැදිලි කොට ශෝකය නිවා සෝවාන් ඵලය ලබා ගැනීමට උපකාර කළ යුතුයි සිතා දෙවැනි දවසේ තවත් භික්ෂූන් වහන්සේ නමක් සමඟ ඔහුගේ නිවසට වැඩියා. ඔහු භාග්‍යවතුන් වහන්සේට වැඳ පසෙකට වී මෙසේ කියා සිටියා. "ස්වාමීනී, මගේ පියා ගිය තැන ඔබ වහන්සේ දන්නවා ද?" එවිට ශාස්තෲන් වහන්සේ වදාළා "කිමෙක් ද ඔබ මේ කියන්නේ? උපාසකය, ඔබ මේ අත්භවයෙහි පියා ගැන ද අහන්නේ? නැතිනම් අතීත භවයේ පියා ගැන ද අහන්නේ? එවිට ඒ පුත්‍රයා "ස්වාමීනි, මට පියවරු බොහෝ සිටියා ද?" කියා ශෝකය මදක් තුනී කරගෙන අසා සිටියා. එවිට ශාස්තෲන් වහන්සේ ඔහුගේ ශෝකය දුරු කිරීම පිණිස ධාර්මික කතාවක් කොට ශෝකය පහ වූ විට මෘදු සිතක් ඇති කල්හි චතුරාර්ය සත්‍ය ප්‍රකාශිත ධර්ම දේශනා කොට සෝවාන් ඵලයට පමුණුවා නැවත විහාරයට වැඩම කළා.

ඉන්පසු භික්ෂූන් වහන්සේ ධර්ම සභාවට රැස්ව "බුද්ධානුභාවය බලනු මැනවි. පියා මළ ශෝකයෙන් පීඩිත වූ, අතිශයින් ශෝක කළා වූ උපාසක, භාග්‍යවතුන් වහන්සේ ඇසිල්ලෙන් සෝවාන් ඵලයෙහි පිහිටුවූවා නොවේ දැ" යි කතිකා කළා.

ටික වේලාවකින් ශාස්තෲන් වහන්සේ එහි වැඩමවා පනවන ලද ආසනයේ වැඩහිඳ "මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව ද ඔබලා වැඩ වාසය කළේ?" අසා සිටියා. එවිට, භික්ෂූන් වහන්සේ වදාළා "ස්වාමීනී, බුද්ධානුභාවය කොතරම් ද කියා ය අප කථා කරමින් සිටියේ."

එවිට තථාගතයන් වහන්සේ, මොහුගේ ශෝක මා දුරු කළේ මේ භවයේ දී පමණක් නොවේ. පෙර භවයේ දීත් එසේ කර ඇති බව වදාරමින් අතීත කථාව මෙසේ වදාළා.

පෙර දවස බරණැස් නුවර එක්තරා ගෘහපතියකුගේ පියා කළුරිය කළා. පියාගේ මරණින් පස්සේ ඔහු ශෝකයට පත්ව විලාප කියමින් කඳුළු පිරි මුහුණින් යුතුව ළයෙහි අත් ගසා හඬමින් ඔහුගේ චිතකය අසලට වී සිටියා.

එවිට ඔහුගේ නුවණැති, ව්‍යක්ත, බුද්ධි සම්පන්න වූ 'සුජාත' නම් දරුවා පියාගේ ශෝකය පහ කිරීමට සිතමින් එක දවසක් නගරයෙන් පිටත මළ ගවයකු දැක තණ කොළ හා වතුර ද ගෙනවුත් ඒ මියගිය ගවයා ඉදිරියේ තබාගෙන ටික ටික දෙමින්, ජීවත්ව සිටින කෙනකුට මෙන් "කාපන්! කාපන්!" කියමින් ගවයා අසල දැවටුණා. එතැනට පැමිණි අය "යහළුව, නුඹ මියගිය ගවයකුට මෙසේ කෑම දෙමින් පිස්සකු මෙන් හැසිරෙන්නේ ඇයි?" අසා සිටියා.

ඔහු කිසිවක් නො කියූ නිසා ඔහුගේ පියා ළඟට ගොස්

"නුඹගේ පුතා උමතු ලෙස මියගිය ගවයකු ළඟට ගොස් තණකොළ හා වතුර දීමට උත්සාහ කරනවා." යැයි කියා සිටියා.

එවිට ඒ සිටුවරයා "මගේ පුතා උමතු වී යැයි තවත් ශෝකයෙන් යුතුව වහා ම පුතා අසලට ගොස් පුත, නුඹ ඥානවන්ත, ව්‍යක්ත, බුද්ධි සම්පන්න කෙනෙක් නේද? කුමක් නිසා නුඹ මේ ගොනාට තණ හා වතුර දෙනවා ද?

මේ මැරුණු ගොනා ආහාරපාන දුන්න කියලා නැඟිටින්නේ නැහැ. අඥාන මනුස්සයෙක් දොඩවනවා වගේ දොඩවන්නේ නුඹත් නුවණ නැති මෝඩයෙක් ද?"

"ඒ වුණාට තාත්තේ, මේ තියෙන්නේ කකුල්. මේ තියෙන්නේ ඔළුව, මේ තියෙන්නේ වලිගෙත් එක්කම ඇඟ. මේ ඇස් දෙක තියෙන්නේ තිබුණු විදිහටම. මේ ගොනා නැඟිටීවි. ඒ වුණාට අපේ සීයාගේ අතපය, ශරීරය, හිස මොනවත් දැක ගන්නට නැහැ. එහෙම එකේ ඒ සීයා වෙනුවෙන් අඬන තාත්තා ම නේද මෝඩ?"

පින්වත් දරුව, නුඹේ අවවාදය අහපු මම දැන් ශෝකය උදුරා දැමූ කෙනෙක් සිසිල් වූ කෙනෙක් නිවුණ කෙනෙක් දැන් මම ශෝක වෙන්නේ නැහැ. හඬන්නේ නැහැ.

යම් කෙනකුට අනුකම්පා කරනවා නම් ප්‍රඥාවන්ත අය ඔහොම තමයි කරන්නේ. මේ සුජාත කුමාරයා තමන්ගේ පියා ශෝකයෙන් මුදවනවා වගේ අන් අය ශෝකයෙන් මුදවන්න උත්සාහ කරන්න.

තථාගතයන් වහන්සේ මෙම දේශනාව ඇසුරෙන් චතුරාර්ය සත්‍ය ධර්මය භික්ෂූන් වහන්සේට වදාළා. එය අවසානයේ දී බොහෝ පිරිසක් මාර්ගඵල ලැබුවා.

පොල්ගහඅංගි
**සද්ධාතිස්ස හිමි**



# ලද පමණින් තුටු විය හැකි හිත උතුම්



මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝසභික
හා උපාධ්‍යාය ධුරන්ධර
වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක
මහාචාර්ය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

**කරණීයමෙත්ත සූත්‍රයේ එන ඉතා වැදගත් ම අර්-ථයක් දෙන වචනයක් තමා "සන්තුස්සකො" යන්න. මෙයින් සත්‍ය වශයෙන් ම ප්‍රකාශ වන්නේ පුද්ගල සන්තානය තුළ "මේ දැන් මට ඇති" අදහසට එකඟව හිත සකස් කර ගැනීමේ අවශ්‍යතාව යි.**

මේ සිතිවිල්ල ඇති කර ගැනීම ඉතා බරපතළ දුෂ්කර කාර්යයක්. බුදුරජාණන් වහන්සේ මේ කරුණ පැහැදිලිව දේශනා කරලා තිබෙනවා

"ඌනො ලොකො අතින්තො තණ්හාදාසො" යන මේ බුදුවදනින් ප්‍රකාශ වන්නේ එයයි.

සත්වයා ලැබෙන දෙයින් සැනසෙන, සෑහීමකට පත්වීම සිදුවන්නේ බොහොම අල්ප වශයෙන්. තණ්හාවට දාසවෙලයි ඉන්නේ. මේ තත්වය අපේ සමාජ රටාව තුළ දක්නට ලැබෙනවා ද, යන්න අප විමසුමට ලක්කළ යුතු කරුණක්.

ඇත්තටම දිවි ඇති තෙක්ම කරන වෘත්තිය, දරන තනතුරු, ලබන ලාභ ප්‍රයෝජන, යන මේවායින් සෑහීමකට පත්වෙනවා ද? යන්න සිතිය යුතු කරුණක්. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන ආකාරයෙන් මෙය තෘෂ්ණාවට දාස වීමක්. එවගේම මේ ජීවත් වන ලෝකයේ අප ගතකරන සෑම තත්පරයක් ම අසහනයෙනු යි පසු කරන්නේ.

වර්තමානයේ තාක්ෂණික මෙන්ම විද්‍යාත්මක වශයෙන් දියුණු යැයි අප හිතන මේ ලෝකයේ එම අසහනකාරි ස්වභාවය වඩාත් උග්‍රයි. මොකද? ඒ දියුණුව නිසාම ඇති වී සමාජය ඉදිරියට පැමිණ තිබෙන මෙවලම් ඉදිරියේ පුද්ගලයා ඒවා අත්පත් කර ගැනුමට යාමේ දී ඇතිවන අසහනකාරි ස්වභාවය නිසයි.

ඉතාම සරල නිදසුනක් ගත හොත් වර්තමානයේ ජංගම දුරකථන මෙවලමක් මිල දී ගැනීමේ දි එයින් කෙරෙන කාර්යය සිදු කරවා ගැනීමට මොනතරම් පිරිවැයක් දරනවා ද? යන්න. වාහන, ඇඳුම් පැළඳුම්, කෑමබීම, ඉදිකිරීම් යන මේ හැම ක්ෂේත්‍රයක දී ම අපට මේ කරුණ අත්විඳින්නට හැකි යි. මෙ තත්වය ඇති වන්නේ අධ්‍යාපනයෙන් දුරස්ථවීම, පාප මිත්‍ර කණ්ඩායම්වල එක්වීම, ධර්මයෙන් ඈත්වීම වැනි කරුණු හේතුවෙනු යි.

මේ කරුණෙහි දී භික්ෂූන් වහන්සේ වන අපටත්, ගිහි උදවිය හැටියට සමාජයේ ජීවත්වන ඔබටත් ඉතා වැදගත් අර්ථයක් ප්‍රකාශ වන බුදුදහමේ එන වචන තුනක් තිබෙනවා. යථාලාභ සන්තෝස, යථාබල සන්තෝස, යථාසාරුප්ප සන්තෝස යන කරුණු තුනයි එයින් පැහැදිලි කරලා තිබෙන්නේ.

මේ කරණීයමෙත්ත සූත්‍රය දේශනා කර තිබෙන්නේ භික්ෂූන් වහන්සේ සම්බන්ධයෙන් පැනනැඟුණ හේතුවක් උඩ නිසා එහි මූලික වශයෙන් භික්ෂූන් වහන්සේගේ පැත්තෙන් ඒ අයගේ ආධ්‍යාත්මික සුවය පිණිස එම කරුණු හේතු වෙනවා.

ඒ වගේම ගිහි ජනතාවගේ පැත්තෙනුත් එහි කිසි අඩුවක් නොමැතිව බරපතළ වැදගත්කමක් තිබෙනවා.

තමන්ට ලැබුණු ලැබුණු ප්‍රමාණයෙන් සතුටට පත්වීම යථාලාභ සන්තෝස යන වචනයෙන් ප්‍රකාශ වෙනවා. එය තවත් ආකාරයකින් කියනවා නම්, ලද පමණින් සතුටට හෙවත් සෑහීමට පත් වීම යි. භික්ෂූන් වහන්සේගේ පැත්තෙන් ගත්හම උන්වහන්සේට ලැබෙන එකම ලාභය තමා චීවර, පිණ්ඩපාත, සේනාසන හා ගිලානප්‍රත්‍යය කියන සිව්පසය. ඉතින් මේ සිව්පසය පරිභෝග කිරීමේ දී කොතෙක් ලැබුණත් එසේ තෘප්තියකට පත් නොවන සමාජ පරිසරයක ජීවත් වීමේ දී හැම විටම බෞද්ධ වත පිළිවෙත ගිලිහෙනවා. නිවන් මඟ වඩාත් ඉක්මනින් පසක් කර ගැනීමට උත්සාහවත් වන භික්ෂු භික්ෂුණී දෙපක්ෂය ම මේ කරුණ වඩාත් දැඩිව අවබෝධ කර ගෙන තම දිවි පවත්වාගෙන යායුතු ය කියන මේ කාරණය එම දෙපක්ෂයේ පැවිදි ජීවිතය වඩාත් සුරක්ෂිතව පවත්වා ගෙන යාමට හේතු වෙනවා.

ඒවගේ ම තමයි බුද්ධශ්‍රාවක ගණයට ගැනෙන ගිහි පාර්ශවය ද මේ කරුණ දැඩිව අවබෝධ කර ගත යුතු වන්නේ ඔවුන්ගේ ජීවිතය වඩාත් සැහැල්ලුවෙන්, ආධ්‍යාත්මික සමබරතාවකින් පවත්වා ගෙන යාමට හේතු වන නිසා. පංචකාම සම්පත් විඳීම කෙරෙහි වැඩි බරක් පෙන්වන ගිහි ජනතාව බොහෝවිට අතෘප්තිමත් ලෙස දිවිපෙවෙතක් ගත කරන අයුරු සමාජය දෙස බලනවිට පෙනී යනවා. විශේෂයෙන් පංචශීල ප්‍රතිපදාව සිදුරු කර ගන්නා ඇතැම් ස්ත්‍රීපුරුෂයන් තෙවෙනි සිල්පදය හෙවත් කාමෙසු මිච්ඡාචාරා යන වැරැදි අඹුසැමි ජීවිත ගත කරන්නට පෙළඹෙන්නේ මේ අතෘප්තිකර බව නිස යි.

එපමණක් නොව මිනිසා නොයෙක් අකටයුතු, අසාධාරණ මිල මුදල්, ධනය, වස්තුව වැනි දේ පරිහරණය කරන්නේ ද මේ යථාලාභ සන්තෝසය ඉක්මවා ක්‍රියාත්මක වීම නිස යි.

සාමාන්‍ය ජීවිතයේ දී තමන් විසින් අත්කර ගත යුතු සතුට ඉක්මවා වෙනත් වැරැදි මාර්ගවලින් උපරිම වින්දනයක් ලබා ගැනීමට ක්‍රියාකිරීම නිසයි මිනිසා මතට යොමු වී තිබෙන්නේ කියා කිවහොත් වඩාත් නිවැරැදි වෙනවා. මේ අනුව බලන කොට අද අප ජීවත් වන මේ සමාජය තුළ නොයෙක් අසාධාරණකම්, කල කෝලාහල. පවුල්වල අසමඟිකම් ඇති වීමට මේ ලද දෙයින් සතුටට පත් නොවීමේ හේතුව බලපාන බව පැහැදිලව පෙනීයන කරුණක්.

මේ වගේම යථාබල සන්තෝස යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? යන්න පිළිබඳවත් මෙහි දි අපේ අවධානය යොමු කළ යුතු වෙනවා. මෙයින් අදහස් කරලා තිබෙන්නේ තමන් වෙත ලැබෙන ධනය, බලය, තත්ත්ව, තනතුරු උසුලන්නට තරම් තමන් වෙත ශක්තියක් ඇත්දැයි පැහැදිලිව දන්නේ තමන්ම යි. ඒ නිසා ඒ දේ තමන් භාර ගැනීමට පෙර ඒ ගැන විමසිලිමත් වී කටයුතු කිරීමත්, එසේ නොමැති නම් තමන් එවැනි දේ භාර නොගෙන කටයුතු කිරීමේ දී ඇතිවන සතුට මෙයින් පෙන්වා දෙන සරල අදහසයි.

මෙහි කියවුණු යථාසාරුප්ප සන්තෝසය උදාකර ගැනීම බොහොම අපහසු කාර්යයක්. එම සන්තෝසය ලබන අය අපේ සමාජයේ හුඟක් ම අඩුයි. මෙම යථාසාරුප්ප සන්තෝසය යනුවෙන් අදහස් කරන්නේ තමන්ට යම් බලයක්, හිමිකමක්, ධනයක්, ආධිපත්‍යයක්, තනතුරක්, කිසියම් අවිධිමත් ක්‍රමයකින් හෝ වෙනත් අසාධාරණ ක්‍රමයකින් ලැබුණහම එවැනි තනතුරක් දැරීමට, ලාභයක් ලැබීමට, හිමිකමක් දැරීමට තමන් ඇත්ත වශයෙන් නුසුදුසු බව හෘදය සාක්ෂියෙන් ම තමන් දැන, තමන්ට වඩා එවැන්නකට සුදුසු අය සිටින බව දැන ගෙන තමන් දරන එම සියලු තනතුරු ආදිය අවංක සිතින් සුදුසු අයට පිරිනැමීම හෝ ඊට මුළුහිතින් ම එකඟ බව පළ කිරීම මෙයින් අදහස් වෙනවා.

ඒ තුළින් ලබන සතුට මේ කියන යථාසාරුප්ප සන්තෝසය යන්නෙන් කියැවෙනවා.

දැන් මේ කියන යථාලාභ, යථාබල හා යථාසාරුප්ප වශයෙන් තුන් ආකාරයකට බෙදී යන මේ සන්තෝසය හෙවත් සතුට භික්ෂූන් වහන්සේ පැත්තෙන් සිව්පසය වශයෙන් ගත් කළ 12 ආකාරයක් බව පෙන්වා දෙන්න පුළුවනි.

සිවුරු පිරිකර කියන මේ පසය ගත්තහම තමන්ට කිසියම් ආකාරයකින් ලැබෙන සිවුර පිළිබඳ තමන් ඒ ලද පමණින් සෑහීමකට පත්වීම පළමුවෙනි සතුට යි. එය යථාලාභය යි.

දෙවනුව එවැනි සිවුරක් පිරිකරක් වශයෙන් ලැබීමට තමන් ලබා තිබෙන සුදුසුකම පිළිබඳ සිතා බලා විමසා ඒ පිළිබඳ අවංකව ම තමන් සුදුස්සෙක් බවට සෑහීමකට පත් වීමෙන් ලැබෙන සතුට යි. එය යථාබලයයි.

තෙවනුව තමන්ට එවැනි උසස් තත්වයේ සිවුරක් තමන් ලැබුවත් ඊට වඩා සුදුසුකම් ලබන භික්ෂූන් වහන්සේ සිටින බව තමන් දැනගත් කඩිනමින් එය එවැනි සුදුසු භික්ෂූන් වහන්සේට තමන් විසින් පිරිනැමීමට හෝ වෙනත් අයකු ලවා පිළිගැන්වීමට සැලැස්වීම යි එයින් අදහස් වන්නේ.

මේ ආකාරයෙන් පිණ්ඩපාත, සේනාසන හා ගිලානප්‍රත්‍යය කියන මේ ප්‍රත්‍යයන් සතරම මෙසේ තුන් ආකාරයකින් විමසා බලා කටයුතු කිරීමෙන් එම භික්ෂූන් වහන්සේ ලබන තෘප්තිය මෙයින් ප්‍රකාශ වෙනවා. එය උපරිම සන්තුෂ්ටිය යි. මේ ආකාරයෙන් මේ කරුණු සාමාන්‍ය සමාජයටමත් අපට ආරෝපණය කරලා බලන්නට හැකියාව තිබෙනවා. පාසල් යන දරුවන් බොහෝවිට අගහිඟකම් ඇති තම දරිද්‍රතාවෙන් පෙළෙන මවුපියන්ගෙන් නොයෙක් කෑමබීම හෝ වෙනත් සෙල්ලම්බඩු ආදිය ඉල්ලා ඇවිටිලි කරනවා. වර්තමාන සමාජයේ විවිධ මාදිලියේ ජංගම දුරකථන ඉල්ලා ඇවිටිලි කරනවා. **ඒවා දුප්පත් දෙමවුපියන්ගෙන් නොලැබෙන විට නොයෙක් ප්‍රශ්න ඇති කර ගන්නවා. සමහර දරුවන් අනුවණකමට සියදිවි පවා අහිමි කරගත් අවස්ථා තිබෙනවා. මෙහි පදනම කුමක්ද? අර දරුවන් ඒ ආකාරයෙන් මව්පියන්ගෙන් ඒවා ඉල්ලන්නේ වෙනත් වත්පොහොසත්කම් ඇති මව්පියන්ගේ දරුවන් එවැනි දේ පාවිච්චි කරන හැටි දැකලයි. ඉතින් මෙවැනි තත්ව නිසා එවැනි දරුවන් කිසිවිටෙකත් තෘප්තියකින් කලදවස ගත කරන්නේ නැහැ. එයින් මවුපියන්ටත්, දරුවන්ටත් අසහනයක් අසතුටක්ම යි ඇති වන්නේ.**





# සාරගම වැව් ඉස්මත්තේ සුන්දර ගල්තලාවක ඉදිවුණු

# තිත්තවැල්ල උඩමළු පුරාණ රාජමහා විහාරය

**සුන්දර ඇතුගල්පුරවරය අතීතයේ රාජධානි තුනකට උරුමකම් කියූ පෞරාණික නගරයකි. එක් පසෙකින් දඹදෙණි රාජධානියේ උරුමයත්, අනෙක් පසින් යාපහුව රාජධානියේ උරුමයත්, තවත් පසෙකින් කුරුණෑගල රාජධානියේ උරුමයත් සහ එකී රාජධානියන්ට උරුම වූ සංස්කෘතින් ද ගැබ්ව පවතින පෞරාණික නගරයකි කුරුණෑගල නගරය.**

කුරුණෑගල පුත්තලම් මාර්ගයේ කිලෝ මීටර් 04ක් පමණ ඉදිරියට පැමිණි විට දුටුවන් මන බඳින සුන්දර වැව් පියසක් හමුවේ. එය තිත්තවැල්ල වැව හෙවත් සාරගම වැව නමින් හැඳින්වේ. මෙම මාර්ගය දෛනිකව දහස් ගණනක ජනයා ගමනා ගමනය සඳහා භාවිත කරනු ලබන අතර, බොහෝ දෙනා ගමන් විඩාව සන්සිඳුවා ගැනීම සඳහා මෙම වැවේ සිරි නරඹා යාමට පුරුදුව සිටිති.

එම සුන්දර වැවට ඉහළින් පිහිටි අති විශාල ගල්තලාව මත ඉදිකර ඇති තිත්තවැල්ල උඩමලු පුරාණ රාජමහා විහාරය කාගේත් නෙත් සිත් ඇදගනු ලබන පුණ්‍ය භූමියකි. විහාරස්ථානයට ඉදිරිපසින් තිත්තවැල්ල වැවත්, අනෙක් පසින් පිහිටා ඇති වෙල් යායත් හේතුවෙන් විහාරස්ථානයේ සුන්දරත්වය තවතවත් වැඩි වන අතර ප්‍රදේශයට ම ආවේණික වූ ජෛව පද්ධතියක් පිහිටා ඇති හෙයින් විවිධ වූ පක්ෂීන් ද නිතරම දක්නට ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාස්පොත ශාසනාරක්ෂක බල මණ්ඩලයට අයත් මෙම විහාරස්ථානයේ ඉතිහාසය පිළිබඳ ලියවුණු ලිඛිත මූලාශ්‍රයන් තවමත් සොයා ගැනීමට හැකියාවක් ලැබී නොමැති අතර, කටවහරෙන් පැවත එන්නා වූ ජනප්‍රවාදයන් කිහිපයක් පවතී. එම ඇතැම් ජනප්‍රවාදයන්හි තොරතුරු සත්‍ය යැයි සිතීමට හැකි සාක්ෂි තිබුණ ද විධිමත් විද්‍යාත්මක පර්යේෂණයක් මඟින් එම කරුණු තවමත් සනාථ කොට නැත.

වලගම්බා රජ දවස සිදු වූ ආක්‍රමණයේ දී රජු පළායමින් සිටියදී රජුගේ එක් බිසවකට තිත්තවැල්ල නම් ප්‍රදේශයේ දී, දරු ප්‍රසූත ලක්ෂණ පහළ වී ඇති අතර, මෙම ප්‍රදේශයේ දී බිසව දරුවකු බිහිකළ බව සඳහන් වේ. ඒ සඳහා මෙම ප්‍රදේශයේ එවකට වාසය කරන ලද බොහෝ පිරිස් පිහිට වී ඇති අතර, ජනප්‍රවාදවල සඳහන් වන පරිදි ප්‍රදේශවාසීන් මෙලෙස රජු ඇතුළු පිරිසට සහය වී ඇත්තේ රජු බව හඳුනාගැනීමෙන් තොරව බවට සඳහන් වේ.



විහාරාධිපති
කුඩාගල්ගමුවේ ශ්‍රී ගුණානන්ද හිමි

කාලයාගේ ඇවෑමෙන් රජු ආක්‍රමණයෙන් රට මුදවාගෙන රට එක්සේසත් කළ පසු තම බිසවට දරු ප්‍රසූතියේ දී පිහිට වූ මිනිසුන් පසුව හමුවී කළගුණ සැලකීමක් ලෙස සීමා මායිම් නම් කර ගමක් තනවා, ඒ ගමට වැවක් සහ ලෙන් විහාරයක් තනවා දුන් බව සඳහන් වේ. ග්‍රාමයේ සීමා මායිම් ලකුණු කිරීම සඳහා එවකට මෙම ප්‍රදේශයේ සුලභව භාවිත වූ තිත්ත නම් වැල් උපයෝගී කරගෙන ඇති හෙයින් ගමට තිත්තවැල්ල නම් වූ නාමය පටබැඳි බව කියැවේ.

එකල රජතුමා විසින් ඉදිකළ වැව තිත්තවැල්ල වැව බව ද සඳහන් වන අතර රජු විසින් ඉදි කළ විහාරය තිත්තවැල්ල උඩමලු පුරාණ රාජමහා විහාරය ලෙස හැඳින්වේ.

මෙම විහාරස්ථානයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්විය හැකි කුරුණෑගල යුගයේ රජකළ සුරතිස්ස රජුගේ යුගය විහාරස්ථානය අසල කෙත නම් කුඹුරු යායක් පිහිටා ඇති අතර, එම කුඹුරු යාය සුරතිස්ස රජතුමාගේ කුඹුරු යායක් ලෙස සඳහන් වේ. එම කුඹුරු යාය අසල ගල් තලාවේ පැරැණි කණු සතරක් දක්නට ලැබෙන අතර, එය රජතුමාගේ වී අටුව පිහිටි ස්ථානය ලෙස ද සඳහන් වේ. එතුමා මෙම විහරස්ථානයේ අභිවෘද්ධිය සඳහා විශාල මෙහෙයක් කර ඇත.

පුරා විද්‍යාත්මක වශයෙන් වැදගත් විවිධ සටහන්, ගල් පඩිපෙළක්, පැරැණි ස්ථූපයක් සහ පුරාවිද්‍යාව මඟින් නිර්දේශ කරනු ලැබූ බෝධිඝරයක් සහිත විහාරස්ථානයක් ලෙස හැඳින්විය හැක.

වර්තමානයේ දක්නට ලැබෙන විහාර මන්දිරය එක්දහස් නමසිය හතළිස් ගණන්වල ඉදිකර ඇත. විහාරස්ථානයේ පිහිටි ධර්ම ශාලාව මීට වසර අසූවකට පෙර නිර්මාණය වී ඇත.

මෙම විහාරස්ථානය මුල් කරගෙන ප්‍රදේශයේ දරුවන්ගේ දහම් දැනුම වැඩිදියුණු කිරීමට ශ්‍රී ඉන්ද්‍රජෝති දහම් පාසල ක්‍රියාත්මක වන අතර, වර්තමානය වන විට එහි සිසු දරු දැරියන් දෙසීයක් පමණ අධ්‍යාපනය ලබයි.

වර්තමානය වන විට ඇතිව පවතින බෞද්ධ ප්‍රබෝධය මුල් කොටගෙන බොහෝ භික්ෂූන් වහන්සේට, බොහෝ පින්වතුනට අවශ්‍ය කරන ත්‍රිපිටක ධර්මය අධ්‍යනය කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ගුණානන්ද ත්‍රිපිටක පුස්තකාලය දෙදහස් විසි එක වර්ෂයේ දී ආරම්භ කොට විවෘත කරන ලදී.

වර්තමානයේ විහාරාධිපති හිමියන් ලෙස වැඩ වාසය කරන මාස්පොත ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති පූජ්‍ය කුඩාගල්ගමුවේ ශ්‍රී ගුණානන්ද හිමියන් මෙම විහාරස්ථානයේ අභිවෘද්ධිය උදෙසා බොහෝ කටයුතු සිදු කළහ. ඒ අනුව උන්වහන්සේගේ අඩිපාරේ ගමන් කරමින් තිත්තවැල්ල උඩමලු පුරාණ රාජමහා විහාරස්ථානයේ ශාස්ත්‍රවේදී පූජ්‍යපාද මාම්පිටිගම සුනන්ද හිමියෝ විහාරස්ථ දායක සභාව හා එක්ව විහාරස්ථානය දියුණු කරමින් අනාගත පරපුරට ද දායාද කිරීමට මහත් වෙහෙසක් දරමින් කටයුතු කරති.

**එම්. ශාලින්ද සමන් කුමාර**



වර්ෂ 2022 ක් වූ ඔක්තෝබර් 09 ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.